මාර්ටින් වික්‍රමසිංහ



# ලීලා

Scanned with CamScanner

# 1 පරිච්ඡේදය

"යමක් ශාස්ත්‍රයට අවිෂය ද එය බොරුයි. ඒ කෙසේ ද කීවොත් ගිනිවතුරට පිවිචෙන යමක් ඇද් ද එය රත්රන් නොවන්නාක් මෙනි" "මකුලුවා පරම්පරාගතව පැවතෙන ක්‍රමයකටම දැල වියන්නාක් මෙන් මනුෂ්‍ය වූ අපිත් පරම්පරාගතව යම් යම් දේ විශ්වාස කරගෙන ආ පලියට එසේම විශ්වාස කරමු නම් මකුලුවන්ට වඩා උතුම් ඥානයක් අපට කොයින් ද?"

(වාසනාවන්ත විවාහය)

"ලෝකයෙහි පුරාණ මනුෂ්‍යයෝ ශාස්ත්‍ර ඥානයෙන් හා සුචරිත ධර්මයෙන්ද දැන් සිටින මනුෂ්‍යයන්ට වඩා දියුණුව සිටියෝ ය" යනු ඇල්බට් අතේ තිබුණු ලියවිල්ලෙහි පටන්ගැන්ම වේ. ඔහු කාමරයේ පුටුවක වාඩිවී සිටියේ ය. ඔහු ඉදිරියෙහි තිබුණ මේසය උඩ ලාම්පුවක් පත්තුවෙමින් තිබුණේ ය. කවුළුව හැර තිබුණ බැවින් මේඝකූටයන්ගෙන් විනිර්මුක්ත නීලවර්ණ ආකාශයෙහි රශ්මි සමූහය පතුරුවමින් සිටි චන්ද්‍රයා ඔහුට පෙනුණේ ය. කාමරයේ ඔහු හැර වෙන කිසිවෙකු නොසිටි නුමුත් ඔහු අතේ තිබුණ ලියවිල්ල සෙමින් කියවන්නට පටන් ගත්තේ ය.

"පුරාණ කාලය ලෝකයේ ශ්‍රී සමෘද්ධි කාලය වීයයි සමහරු පිළිගනිත්. වර්තමාන මනුෂ්‍යයෝ ශාස්ත්‍රඥානයෙන් හා සුචරිත ධර්මයෙන් ද පුරාතනයන් ට වඩා සතසහස්‍ර වාරයක් දියුණුව සිටිත් යයි අන්‍යයෝ පිළිගනිත්. වර්තමාන මනුෂ්‍යයෝ දියුණුව සිටිත් යන්න ශාස්ත්‍රයට නුවණට ගෝචරවන බැව් කියන්නට උවමනා නොවේ. ජාතිය ආගම යනාදිය නිසා අපි පක්ෂභාගි වූ පළියට සත්‍යය වෙනස් නොවේ. අප අතර මෙබඳු කරුණු විනිශ්චය කිරීමට උවමනා ශාස්ත්‍රයන්ගේ ඌනත්වය නිසා යුරෝපීය පඬින්ගේ ආධාර සොයා යාම සාධාරණයි; යුක්ති සහිතයි.

පුරාතනයන්ගේ අදහස්වලට වාල්වී නිරුත්සාහීව නොසිටි ධෛර්යවන්ත පූර්වාපරදිග උත්තමයන්ගේ උත්සාහය නිසා දැන් ලෝකයේ ශාස්ත්‍රාලෝකය පැතිරයන්ට පටන්ගෙන තිබේ. ශාස්ත්‍රයට

Scanned with CamScanner

ජාතික වෙනසක් නොමැතියි. කළු හෝ සුදු හෝ වේවා ශාස්ත්‍රය සියල්ලන්ට ම එකාකාරයි. ශාස්ත්‍රයෙන් සියල්ලන්ටම එකාකාරවූම ප්‍රයෝජනය ලැබිය හැකියි. ඉන්දියාවෙහි මෙන් ඔලුව පහළට දමා කකුල් දෙක උඩ තියාගෙන බ්‍රහ්ම ලෝකයට යන මාර්ගය සොයන්නෝත්, අප රටෙහි මෙන් "ලංකාවේ මුල් මනුෂ්‍යයෝ, යක්ෂයෝ ද ප්‍රේතයෝ ද" "යක්ෂයන්ගේ භාෂාවේ ව්‍යාකරණ සූත්‍ර" යනාදී පුදුම ප්‍රශ්නවලට වාද විවාද කරමින් කාලය ගත කරන්නෝත් අපරදිග මනුෂ්‍යයන් අතර නැතිවූහ. ඒ නිසා වර්තමාන ශාස්ත්‍ර දියුණුව ඔවුන් අතරින් පටන් ගැන්ම පුදුමයක් නොවේ. ඒ ගැන අපට කේන්ති වීමට කාරණයක් නොමැති යි.

අප අතර තිබෙන ශිල්ප ශාස්ත්‍ර සියල්ලම දෙවියන් විසින් හෝ දිව්‍ය සෘෂීන් විසින් හෝ දෙන ලද්දෝ ය යන විශ්වාසය අප අතර පමණක් නොව ලෝකයේ නොයෙක් ජාතීන් අතර තිබේ. පාර්සි මනුෂ්‍යයෝ ඔවුන් අතර තිබෙන ශාස්ත්‍ර ඔවුන්ට හිතැති විශේෂ දෙවියෙක් විසින් දෙන ලද්දේ යයි විශ්වාස කරත්. පුරාණ කාලයේ පුදුම අන්දමේ ශාස්ත්‍ර දියුණුවක් තිබුණ මිසරය, ග්‍රීසිය ආදී රටවල මනුෂ්‍යයෝ ද මෙසේම විශ්වාස කළෝ ය. ලෝකයේ ශිෂ්ටාචාර කොයිම ජාතියකගේ වුවත් පුරාණ ඉතිහාසය අද්භූත කාරණයන්ගෙන් පිරී තිබේ. ඒ කාලයෙහි මනුෂ්‍යයන් හා දෙවියන් අතරේ ද, මනුෂ්‍යයන් හා යක්ෂයන් අතරේ ද සමාගම් ඇතිවූහ. එක සමාන සිරිත් විරිත්, යන්ත්‍ර මන්ත්‍ර ගැන විශ්වාසය දෙවියන් හා යක්ෂයන් පිළිබඳ එක සමාන කථා ලෝකයේ ඉතා දුරස්ථර ජාතීන් අතර පවා පැවත එන්නාහ. මෙසේ වීමට හේතුව කිම? ඔවුනොවුන්ගේ සම්බන්ධයෙන් ද? එසේ නම් එබඳු සම්බන්ධයක් නැති ජාතීන් අතර පවා එක සමාන සිරිත් විරිත් මුඛ පරම්පරා කථා ආදිය ඇති වීමට හේතුව කුමක් ද? මේවා කෙසේ නිරවුල් කළ හැකිදැයි කල්පනා කිරීමට දැන් කාලය පැමිණ තිබේ. "ඔන්න පුතේ බිල්ලා" කියා ළදරුවන් රවටන්නාක් මෙන් "ඒවා සියල්ලම හරි, සැක සිතුවොත් නරකාදියාවි" යනාදී බොළඳ අදහස්වලට හිස නමා ආචාර කළයුතු කාලය පසුගිය බැවි සලකා මේවා සම්බන්ධව ප්‍රශ්න කරන සිංහල තරුණ පරම්පරාවට ශාස්ත්‍රානුකූලව උත්තර දීමට අපේ පඬිවරයන් විසින් සිතට ගත යුතුයි. යම් යම් දේගැන සැක සිතා ප්‍රශ්න කළ විට අරයා මෙසේ කියා තිබෙනවා ය මෙයා මෙසේ කියා තිබෙනවා ය නුඹ ඊටත් වැඩි උගතෙක් දැයි ඇසීමට උගතෙක් නම් ලජ්ජා විය යුතුයි.





අවුරුදු ලක්ෂයකට දෙලක්ෂයකට හෝ මීටත් වඩා දීර්ඝ කාලයකට හෝ ප්‍රථම අප පෘථිවියේ මනුෂ්‍යයන් විසූ බැව්* යුරෝපීය පඬිවරයන් විසින් ශාස්ත්‍රානුකූලව පෙන්වා දී තිබේ.

මේ තරම් දීර්ඝ කාලයෙන් ඉතිහාස ශිලාලේඛනාදියෙන් මනුෂ්‍යයන් පිළිබඳ තොරතුරු දැනගත හැකි කාලය අවුරුදු 10000 කට හෝ 12000, කට වැඩි නොවන බවත් මීට ප්‍රථම කාලය පිළිබඳව තොරතුරු දැනගැනීම පෘථිවි ගර්භයේ තිබී සම්භ වන්නා වූ ගල් ආයුධාදී උපකරණයන්ගේ අනුසාරයෙන් බවත් කියා තිබේ. ඉතිහාසයට පළමු ඉතා දීර්ඝ කාලයක් මනුෂ්‍යයන් වනචරව සිටි බැව් ශාස්ත්‍රානුකූලව ඔප්පු කරන ලදින් ඒ ගැන සැක කරන යුරෝපීය උගතෙක් ඇතැයි සිතිය නොහැකියි. මෙය ස්ථිර කිරීමට තිබෙන සාක්ෂි අප්‍රමාණයි. තවමත් ලෝකයේ තන්හි තන්හි වනචර ජාතීහු සිටිත්. මොවුන්ගෙන් බොහොමයක් ඉතා මෑත කාලයේ දී දියුණු භාවයට පැමුණුණෝ ය. මෙසේ ලෝකයේ තන්හි තන්හි වනචර ජාතීහු සිටීමට හේතුව කුමක් ද? මේ ජාතීහු කාලයක දී දියුණුව සිට පිරිහුණා වූ මනුෂ්‍යයෝ යයි ඔප්පු කළ හැකි ද? ලෝකයේ පුරාණ මනුෂ්‍යයෝ සියල්ලෙන් සම්පූර්ණව, දෙවියන්ගෙන් හෝ බ්‍රහ්මයන්ගෙන් පැවත ආවෝ ය යනු නොයෙක් ජාතීන් අතර තිබෙන ශාස්ත්‍රයට නොගැළපෙන විශ්වාසයකි. අප පෘථිවියේ මනුෂ්‍යයන් ඉතා පහත් ස්වභාවයක සිට ක්‍රම ක්‍රමයෙන් දියුණු වී දැන් සිටින ස්වභාවයට පැමිණ තිබෙන බැව් යුරෝපීය පඬිවරයන් විසින් ශාස්ත්‍රානුකූලව ඔප්පු කරන ලදින් ශාස්ත්‍රයට යුක්තියට ගරු කරන කිසිවෙක් ඒ පිළිගැනීමට පසුබට නොවෙත්. ආගමෙහි සත්‍ය වූ ධර්මයට ශාස්ත්‍රය අවිරුද්ධ නමුත් ආගමට කිසිසේත් උවමනා නැති ලාමක අදහස්වලට ශාස්ත්‍රය පරම සතුරෙකි. කිසිම ආගම ධර්මයකට උවමනා නැති ශාස්ත්‍රයටත් හාත්පසින් විරුද්ධ මිථ්‍යා කථාන්තර ආගමයයි සිතා පිළිගෙන සිටින්නන්ට නම් යුක්තියෙහි පිහිටා ශාස්ත්‍රීය කරුණු පිළිගැනීම කළ නොහැකි වැඩකි.

---

*"It might be taken as the orthodox opinion that dawn of the very earliest form of humanity lay 400 000, years behind us, and in that time man as he is now known had been evolved from crude almost prehistoric form."

Professor Arthur Keith (Address to the British Association, 1912)



Scanned with CamScanner

අපේ පෘථිවිය විශාල වෘෂභයෙකුගේ අං දෙක උඩ පිහිටා තිබේ යයි ද, සූර්යග්‍රහණ සිදුවන්නේ ආකාශයෙහි විශාල සර්පයි දෙදෙනෙක් පොරකන විට පිටවෙන විෂධූමයන්ගෙන් සූර්යයා වැසීමෙන්යයි ද, ඒ සර්පයන් පොරකන වේලාවට උන්ගේ මුඛයෙන් පිටවෙන කෙළපිඩක් අප පෘථිවියෙහි පතිත වුවහොත් මොහොතකින් පෘථිවිය දා විනාශ වී යනවා යයි ද මහමත් භක්තිකයෝ විශ්වාස කරත්. මොවුන්ගේ මේ විශ්වාසවල් බොරුය කියා ඔප්පුකරන්නට පුළුවන් සමර්ථයා කව්ද?

බෞද්ධාගමෙහි සතුන් මැරීම තහනම් කර තිබෙද්දීත් පුරාණ බෞද්ධ රජදරුවන් තුළ දඩයම් කිරීමට තද ආශාවක් ඇතිවීම පුදුමයක් නොවේ ද? තවමත් අප අතර මෙම ආශාව ස්වල්ප වශයෙන් ශේෂව තිබේ. බුද්ධාගමටත් හාත්පසින් විරුද්ධ වූ දඩයම් කිරීමට පුරාතනයන් තුළ තද ආශාවක් ඇතිවීමට හේතුව කුමක් ද? ඉතිහාසයට පළමු සිටි මනුෂ්‍යයන් කැලෑවල වාසය කරමින් දඩයම් කොට ජීවිකාව කරගත් බැවින් යථෝක්ත ආශාව අන්‍ය නොයෙක් විශ්වාසයන් මෙන් ඉතා දීර්ඝ කාලයක සිට පැවතවිත් දැනට ස්වල්ප වශයෙන් ශේෂව තිබෙන බැව් සත්‍යයක් නොවේ යයි කිය හැකි ද? සිංහල භාෂාව සහ සිංහල අක්ෂර ගැනත් චින්තනය කරන කල්පනාවන්ත මනුෂ්‍යයෙකුට නම් බොහෝ කරුණු ඉගෙන ගත හැකියි. ඉතා පුරාණ ශිලාලේඛනාදියෙහි සඳහන් සිංහල අක්ෂර හා සිංහල භාෂාව ගැනත් තොටගමුවේ ශ්‍රී රාහුල ස්වාමීන්ගේ කාලයේ පැවති සිංහල භාෂාව ගැනත් කල්පනාකර බලනු. ශ්‍රී රාහුල ස්වාමීන්ගේ කාලය වනකොට සිංහල භාෂාව කෙතරම් අලංකාර ව්‍යක්ත වචනයන්ගෙන් සම්පූර්ණ වී ද? නුමුත් පටන්ගැන්මේදී සිංහල භාෂාවේ අක්ෂරයන්ගේ හෝ වචනවල හෝ මේ තරම් අලංකාරයක් තිබුණේ ද?

"දැන් තිබෙන සියලුම ශාස්ත්‍රයන් පුරාතනයෝ අවබෝධ කළෝ ය" යි බොහෝ දෙනා කිසි වගවිභාගයක් නැතුව පිළිගනිත්. දැන් තිබෙන ශාස්ත්‍ර පුරාණ කාලයෙහි තිබෙන්ට ඇති. නුමුත් ශාස්ත්‍රයන්ගේ දියුණුවීමේ ප්‍රමාණයට මහත් වෙනසක් ඇති වී තිබෙන බැවින් එය සැලකිය යුතුවේ. යුරෝපීන් අතරේ හා අප අතරේත් රෝග ව්‍යාපසමනය කිරීමට යම් ක්‍රමයක් තිබේ ද, ඊට වෛද්‍ය ශාස්ත්‍රයයි කියනු ලැබේ. වනචර මනුෂ්‍යයන් අතරේ ද ලෙඩ සුවකිරීමට ක්‍රමයක් තිබෙන බැවින් ඊට ද වෛද්‍ය ශාස්ත්‍ර යයි කිය





යුතු වේ. නමුත් මේ තුන් ක්‍රමයේම ලොකු වෙනසක් තිබෙන බැව් කියන්ට උවමනා නොවේ. වනචර මනුෂ්‍යයෝ ද රූපාදිය සටහන් කිරීමට පුරුදුව සිටිත්. ඔවුන්ගේ මේ රූපාදිය සටහන් කිරීමට ද සිතියම් ශාස්ත්‍රයයි කිය යුතුවේ. නුමුත් ඔවුන් සහ අප අතරේද යුරෝපීයයන් අතරේද තිබෙන සිතියම් ශාස්ත්‍රයේ මහත් වෙනසක් තිබේ. මෙවායේ නමින් වෙනසක් නැති නුමුත් දියුණුවීමේ ප්‍රමාණයට වෙනසක් ඇති වේ. දැනට ලෝකයේ දියුණුව තිබෙන ශාස්ත්‍රයන්ගේ නාමයෙන් පුරාණ කාලයෙහි ශාස්ත්‍රයන්ගේ පටන් ගැන්ම ඇති වූ පලියට "පුරාතනයෝ සකල ශාස්ත්‍රයන්ගේ පරතෙරට පත්ව සිටියෝ ය" යි කීම යුක්ති රහිතයි. මෙම අහේතුක අදහසට ගරු බුහුමන් කිරීමට යම්කිසි ජාතියක් පටන් ගත්තාහු නම් එය ඔවුන්ගේ මතු පරම්පරාව ගමන් කරන්නා වූ දියුණුවීම නැමැති මාර්ගයෙහි සිටුවන ලද භයංකාර රාක්ෂසයෙක් මෙනි. ඔවුන්ට ශතවර්ෂ ගණනකිනුත් මෙම අහේතුක අදහස නැමැති භයංකර රාක්ෂසයා ජය ග්‍රහණය කළ නොහැකියි.

ශාස්ත්‍රයාගේ පරතෙරක් හෝ කෙළවරක් නොමැතියි. ශාස්ත්‍රයාගේ පරතෙරක් ගැන කථා කිරීම විහිලුවකි. ශාස්ත්‍රය අපේ උත්සාහයෙන් පුරුද්දෙන් දියුණු කරගත යුත්තකි. ශාස්ත්‍රයාගේ පරතෙරක් දැන ගැනීම හෝ ශාස්ත්‍රය පරතෙරකට ගෙනයාම මනුෂ්‍යයාට කළ නොහැකි වැඩකි.

"සව් සත කෙළ පැමි ණි
ගුරුවත් දෙරණ සැපැමි ණි
පිරිසිදු සිල් ගිහි ණි
සියල් ලෝ වියතුන්ට සිළුමි ණි"*

ශ්‍රී රාහුල ස්වාමීන් මෙයින් අදහස් කරන ලද්දේ කාව්‍යාලංකාරාදි ශාස්ත්‍රයන් පමණක් විය යුතුයි. නුමුත් වර්තමාන සමහරු මෑත කාලයේ දී දියුණු වී තිබෙන ස්වාභාවික ශාස්ත්‍රයන්හිත් උන්වහන්සේ පරතෙරට පත් කෙනෙක්යයි කියමින් කැගැසීම උන්වහන්සේට කරන අපහාසයකි. උන්වහන්සේ විසින් අදහස් නොකරන ලද්දක් උන්වහන්සේ පිට පැවරීම උන්වහන්සේට ගරුකිරීමක් නොවේ.

* කාව්‍යශේඛරය



Scanned with CamScanner

අභිපුරාණ මනුෂ්‍යයන් හේතුඵල සම්බන්ධයට අනුව තර්කණය කරන්ට පටන් ගත්තේ යම් කලෙක්හි ද ශාස්ත්‍රය නැමැති දම්වැලේ පටන් ගැන්ම ද එය වේ. එතැන් සිට ක්‍රම ක්‍රමයෙන් ශාස්ත්‍රය නමැති දම්වැලට පුරුක් යා කිරීමට ලෝකයේ නොයෙක් ජාතීහු ක්‍රියා කළෝ ය. පුරාණ ජම්බුද්වීප වාසීහු ද ඒ කාලයෙහි ශාස්ත්‍ර දියුණුවට ක්‍රියා කළ ග්‍රීක, රෝම, මනුෂ්‍යයන් මෙන් අග්‍ර ස්ථානයකම තැබිය යුත්තෝ ය. දැන් මේ ශාස්ත්‍ර නමැති දම්වැලේ පටන් ගැන්ම මනුෂ්‍ය ඥානය නැමැති ඇසින් නිශ්චය කොට දර්ශනය කිරීමට අපහසු වන තරම් දීර්ඝව තිබේ. තව අවුරුදු දහස් ගණනක් ගතවූවාට පසු ඇතිවන මනුෂ්‍යයන්ට වර්තමාන කාලය ශාස්ත්‍ර නැමැති දම්වැලේ මධ්‍යභාගය මෙන් දර්ශනය වෙනවාට සැක නැත්තේ ය.

වර්තමාන කාලයෙහි අපරට වැඩි දෙනා පුරාතනයන්ගේ* ලාමක අදහස්වල එල්ලී සිටගෙන ශාස්ත්‍රය යටපත් කරන්ට උත්සාහ කරත්. තවමත් අපරට සාමාන්‍ය ජනයාට පමණක් නොව උගත්තුයයි කියන නැනැත්තන්ට පවා ස්වාභාවික ශාස්ත්‍ර සම්බන්ධව හෝ ස්වභාව ධර්මය හා මනුෂ්‍යයාගේ සම්බන්ධය ගැන හෝ සැලකිය යුතු දැනීමක් නොමැතියි. කාව්‍යාලංකාර නිරුක්ති ශාස්ත්‍රාදිය සම්බන්ධව අපට රට පඬිවරයන්ගේ කියුම් අපි ගෞරවයෙන් පිළිගනිමු. නමුත් ස්වාභාවික ශාස්ත්‍ර පිළිබඳව ඔවුන්ගේ ළදරු අදහස් අපට පිළිගත නොහැකියි. දැන් දැන් අප අතරත් ටික ටික ස්වාභාවික ශාස්ත්‍ර සම්බන්ධව අපරදිග ශාස්ත්‍රඥයන්ගේ අදහස් ප්‍රකටවේගන යන බැවින් කලක් යනවිට සිංහලයන් අතරත් යථොක්ත ශාස්ත්‍ර ඉතා සීඝ්‍රව පැතිරයන්ට බැරි නැතැයි සිතමු. මෙසේ වුවහොත් පුරාතනයන්ගේ ලාමක අදහස්වල එල්ලී ශාස්ත්‍රීය කරුණුවලට පිළිකුල් කරන්නන් අතරෙත් ශාස්ත්‍රය දියුණු කරන්ට උත්සාහ කරන්නන් අතරෙත් වාද විවාදාදී භයානක කල කොලාහල ඇතිවිය හැකියි. මීට ශතවර්ෂයකට දෙකකට ප්‍රථම අපරදිග රටවල පුරාතනයන්ගේ ලාමක අදහස්වල එල්ලී සිටියවුන් ශාස්ත්‍රය යටපත් කොට මුඛපරම්පරා කථා ආදි මිථ්‍යා මතයන් ප්‍රකට කරන්ට උත්සාහ කිරීමෙන් ඇතිවූ භයානක විපත් හා යථොක්ත ලාමක අදහස් මුලොච්ජින්න කොට ශාස්ත්‍රය ජයග්‍රහණය කළ හැටිත් දැනගැනීමට අපරදිග ඉතිහාසයම ප්‍රමාණ වේ. අපරට ජනයා පුරාතනයන්ගේ අදහස්වලට ප්‍රමාණය ඉක්මවා

* "පුරාණ මනුෂ්‍යයෝ, පුරාතනයෝ, යන වචන ලංකාවේ හෝ ඉන්දියාවෙහි ඓතිහාසික කාලයෙහි සිටි ශිෂ්ටාචාර මනුෂ්‍යයන් සඳහා ලියන ලදැයි නොසිතිය යුතු ය.





අන්ධ භක්තියෙන් ගරු කරමින් සිටින [illegible] ඇති නොවූවාක් මෙන්ම කලකෝලාහල ද නැති[illegible] "ගලා බසින්නාවූ විශාල ගංගාවක් අවහිරකොට නවත්වන්ට හෝ උඩු අතට හරවන්ට තැත්කිරීමෙන් අවහිර කිරීමට බඳින ලද බැමි සියල්ලම භයානක අන්දමින් කැඩී බිඳී ඒ අවට ප්‍රදේශය වතුරෙන් යටවී විනාශ වීමෙන් අනතුරු පැමිණෙන්නාක් මෙන් ලාමක අදහස් වල එල්ලී ශාස්ත්‍රයට විරුද්ධව සටන්කිරීමට තැත්කිරීමෙන් ඉතා භයානක විපත් සිදුවේ. ගලා බසින්නාවූ ගංගාවේ වාරිමාර්ග ශුද්ධ කොට ඒ ජලය ලැබීමෙන් ඒ පලාත සශ්‍රීක වෙන්ට සැලැස්විය යුතුවාක් මෙන් ලාමක අදහස් ඉවතලා ශාස්ත්‍රීය කරුණු පිළිගෙන ඊට එකඟවෙන්ට උත්සාහ කටයුතුයි. අපේ පක්ෂ භජනය නොදැනුම්කම ලාමක අදහස් යනාදිය නිසා ශාස්ත්‍රය යටපත් කරන්ට කොතරම් උත්සාහ කළත් ශාස්ත්‍රය පසුගිය කාලයේ දියුණුවූවාක් මෙන් මත්තටත් ඊට විරුද්ධව සිටින සියල්ලම විනාශ කරදමා ඉහළ ගමන් කරන්නේම ය."*

වර්තමාන කාලයෙහි ශාස්ත්‍ර දියුණුව තිබෙන බැව් හස්තාමලකයක් සේ ඔප්පුවෙන කාරණයකි. "ශාස්ත්‍රය ආගම පිරිසිදු බවට පමුණුව යි" ඉතින් වර්තමාන මනුෂ්‍යයන් සුචරිත ධර්මයෙන් ද උසස් ව සිටින බැව් කියන්ට උවමනා නොවේ? අපේ අන්තිම රජවූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ කාලයෙහි සිදුවූ භයානක අපරාධය ගැන කල්පනා කළ යුතුයි. රාජද්‍රෝහීන්ට දඬුවම් කිරීමට යථොක්ත නීතිය පෙර පටන් පැවත ආ බැව් කියා තිබේ. එබඳු අමනුෂ්‍ය නීතියකින් අප ජාතිය මේ කාලයේ නිදහස්ව සිටින නිසා ප්‍රීති වෙන්ට ඕනෑ නොවේ ද? යුරෝපීය ඉතිහාසයෙන් නම් මේ අන්දමේ අමනුෂ්‍ය නීති ද දහස් ගණන් අහිංසක ජීවිත විනාශකිරීම් ආදි භයානක අපරාධ ද සඳහන් කළ හැකි යි."

මෙහිදී "අන්න ඇල්බට් අයියාව පන්සලට යන්ට ලෑස්ති වෙන්න කියනවා" යන වචන ඇසී ඇල්බට් ඒ දෙස බැලූවිට ඔහුගේ කුඩා සහෝදරී වන විමලා ඔහු ළඟට ඇවිත් සිටිනවා දුටුවේ ය. "පන්සලට යන්ට ලෑස්තිවෙලා ඉන්නේ කවුදැයි" ඇල්බට් විමලාගෙන් ප්‍රශ්න කළේ ය. "ඇම් අක්කාලා සහ ලියන මහත්මයාලාගේ ගෙදර සොමීලාත් යන්ට ලෑස්තිවෙලා ඉන්නවා" ය යි කියමින් විමලා එතැනින් යන්ට හදනවිට ඇම් ද ඇල්බට්ගේ කාමරයට විත් "ඇල්බට්

* Dr. Fritdjof Nansen's "Science and the Purpose of Life"

ඉන්මෙට පන්සලට යන්ට ලැස්ති වෙයන්. තුඹලාට පන්සලට යන්ට බොහොම අමාරුයයි" ඇ සිනාසෙමින් කීවා ය.

"පන්සලට යන්ට අමාරුවක් නැහැ. පන්සලට ගොස් නිදා වැටෙනවාට වඩා පොතක් කියවන එක හොඳය කියා මට හිතෙනවා."

"උඹට පිස්සු ද? පොතක් කියෙව්වාම පින් සිද්ධවෙන්නේ කොහොම ද?"

ඇල්බට් ඇගේ සිත රිදෙනවාට බියෙන් දෝ කිසිවක් කථා නොකර සිටියේ ය.

"ඇල්බට් පිස්සු නැතිව පන්සලට යන්ට ලැස්තිවෙයන්" යයි ඇම් නැවතත් කීවා ය. ඇල්බට් එතැනින් නැගිට ඇඳ පැළඳගෙන ඔවුන් සමග පන්සලට යන්ට පිටත්විය. ඔව්හු පන්සලට ගොස් බණකීමට ආරම්භකර තිබුණ බැවින් ධර්මශාලාවෙහි වාඩිගත්හ. ඇල්බට් ධර්මශාලාවේ කණුවකට හාත්සිවී ටික වේලාවක් බණ කියනවා අසාගෙන සිට විහාරගෙය දෙසට ගියේ ය.

"අද මේ භික්ෂූන්වහන්සේ කී බණටික කදිමයි. අද මේ අන්දමේ බණ ටිකක් අහන්ට ලැබෙය කියා ගෙදරදීත් මට කල්පනා වුණා නොවේ ද? රාහු අසුරේන්ද්‍රයාගේ කට යොදුන් කොපමණ ද? තුන්සියයක් ගැඹුරලු. ඔහු ගේ උස යොදුන් සාරදහස් අටසියයි, තව හොඳ බණ කථාවකුත් කීවානෙව. ඊරියෙකුගේ බඩ පැලූකල ගැරඩියෙක් ද, ගැරඩියාගේ බඩපැලූකල මැඩියෙක් ද සිටියාලු. මේ තුන්දෙනාම ඉහත ජාතියේ මනුෂ්‍යයෝව සිටියාලු. වෙන මොනවා ද මට මතකත් නැහැ."

භික්ෂූන්වහන්සේගේ ධර්මදේශනාව ගැන මෙසේ කල්පනා කරමින් ඇල්බට් විහාරගෙයට ඇතුල් වුණේ ය. මේ විහාරගෙය අලුත තනන ලද්දකි. පළමුවෙනි තරමට මෙහි සිතියම් ඇඳ තිබුණි. "අනේ මේ වෙස්සන්තර රජ්ජුරුවෝ දරුවන් දන් දෙන හැටි හරියට පණ පිහිටපුවා වගෙයි" කියමින් ගෑණු අම්මන්ඩිලා කථාකරනවාත් සමහර නාකි අම්මණ්ඩිලා නරකාදි බලා "අනිච්චෙ දුක්කෙ අනාත්මෙ" කියමින් සුසුම්ලනවාත් ඇල්බට්ට ඇසුණේ ය. එක ගෑණු අම්මණ්ඩි-කෙනෙක් "නෙත්‍ර තබන දවසේ හාමුදුරුවෝත් ඇඬුවා ය" යි කියමින් ඇල්බට්ගෙන් යමක් දැනගැනීමට ආශාවෙන් මෙන්





ඔහු දෙස බලා සිටියා ය. "තෑද්ද මේ සිතියම් බලන කාගේ වුනත් ඇස්වලින් කඳුළු එනවා ය" යි ඇල්බට් ඇගේ සිත සතුටුවන අන්දමට උත්තර දුන්නේ ය. ඇල්බට් ටික වේලාවක් විහාරගෙයි සක්මන් කරමින් සිටිනවිට ධර්මදේශනාව ඉවර වී ඇම්ලාද විහාර ගෙයට ආවෝ ය. සියලුදෙනාම විහාරගෙය බලා රෑ බෝවී තිබුණ බැවින් ගෙදර යන්ට පිටත්වූහ.

# 2 පරිච්ඡේදය

පසුවදා සවස් භාගයෙහි සෝමී, නැලී, යන ලියන මහත්මයාගේ දියණිවරු ද ඇමී, ලූසී යන ඇල්බට්ගේ සහෝදරියෝ ද මල්වත්තේ වාඩිවී කථාවට පටන් ගත්හ. මැහුම් ගෙතුම් ආදී වැඩපල ඉවර කොට මොවුන් සියලු දෙනාම එකතුවී ටික වේලාවක් කථාකරමින් කාලය ගත කිරීම බොහෝ කාලයක පටන් ඔවුන් අතර ඇතිවී තිබුණ පුරුද්දක් විය.

"ලූසී උඹ දන්නවයි ඊයේ පන්සලේ තිබුණ නාඩගම"

"නැහැ සෝමී මම ඊයේ පන්සලට නොගිය කොට දන්නේ කොහොම ද?"

"උඹ ගියා නම් හිනහවෙලා මැරේවි. අර ලැට්ගෙ හැට්ටෙ මැද්දේම මහා යෝද ඉංග්‍රීසි අකුරු දෙකක් රතුනූලෙන් හා එයිට වැඩිය හොඳ වැඩේ වැල්ලෙගෙදර ලිසීගේ කබාකුරුත්තුව පිටිපස්සේ ඉංග්‍රීසි අකුරු [illegible]ලයි, පන්සලට ගිය දෙතුන්දෙනාම මෙසේ එකවිට කථාකරමින් සිනාසෙන්ට වූහ.

"සියලුදෙනාම එකවිට කථාකරන කොට තේරෙන්නේ කොහොමද" යි ඇමී ඇසුවා ය.

"හා එහෙනම් ඉන්න මම හොඳහැටි කියන්න, ලැට්ගෙ හැට්ටෙ පිටමැද්දෙම වෙන්න රතුනූලෙන් ලොකු ඉංග්‍රීසි අකුරු දෙකක් මහලා තිබුණා, ආයිත් වැල්ලෙගෙදර ලිසීගේ කබාකුරුත්තුවේ පිටපැත්තේ මැද්දෙන්ම ඉංග්‍රීසි අකුරු පෙළක් මහලා තිබුණා."

"අර මොන නාඩගමක් ද? මහලා ඇඳගෙන ආ හැටි හොඳය" යි ලූසී කීවා ය.

"ඒක නොවෙන්නනන් අර නාඩගමට වැඩිය නරකෙයි හැට්ටෙ කොනකට වෙන්ට අකුරක් මහගත්තාම."

මේ කථාව අසාගෙන සිටි ඇල්බට් "ඔය අන්දමට නුඹලාටත් වැරදී තියන ගෑණු ඇති" යි කීවේ ය.



"අපි ඒවගේ නාඩගම් වැඩකරන්නේ නැතිකොට අපට කවටකම් කරන්නේ කවුද? රෙදිවල අකුරු මහන්නේ මාරුවෙනවාට බව ඒ දරිවිලා නොදන්න නිසා පිටේ අකුරු මහලා අඳිනවා ය" යි ඇමී කීවා ය.

"ලූසී ඔන්න අඩුව සිටි එක්කෙනා එනවා" යයි සෝමී කීවා ය.

"කවුද - හා වික්ටර්"

වික්ටර් (ලියන මහත්මයාගේ පුත්‍රයා) එනවා දුටු අවුරුදු තුනක් පමණ වයස් වූ ඔහුගේ කුඩා මල්ලී ළඟට දුවගොස් "වි‍ට්ටර් අයියේ - සෝමි අක්කලා කිව්-ව-ඔන්න-" මෙහිදී අනික් වචන මතක නැතිවී දෙතුන සැරයක් "ඔන්න" "ඔන්න" කියමින් සිට "අඩු එක්කෙනා එනවයි කියාලා."

"නුඹ ඕක කියන්නෙයි ඔය තරමට හති දම දමා මහන්සි ගත්තේ" කියමින් වික්ටර් සෝමීලා සිටිතැනට ගියේ ය.

"වික්ටර් උඹ දන්නවයි ඊයේ පන්සලේදී වුණ වැඩක්- ගෑණු දෙන්නෙක් අපි වාඩිවෙලා සිටින තැනට ඇවිත් බණ අහන්ට වාඩිවෙන්ට හදනකොට එක ගෑණියෙක් අනිත් ගෑණිට රව රවා දත්මිටි කකා 'දූවිලි තැවරිලා රෙද්ද නරක්වෙන නිසා මට ඉදන්ට බැරිය කියද්දීත් ඉරිසියාවට ඒක ඇඳගෙන ආවා ය' කියමින් රණ්ඩුවෙන්ට පටන්ගත්තා. මම හිනහානොවී යන්තම් ඉවසාගෙන සිටියා." මේ කථාව කියා සියලුදෙනාම සිනාසෙන්ට වූහ.

"ලූසී ඔන්න එනවා පුරු පුරු ගගා"

"කවුද? හා ඔන්න ආත්තා එනවා. හිනහා වෙනවා ඇහුණාම ආත්තා හොඳටම බණිනවා. හිනහා නොවී ඉඳපල්ලා"

හිසකේ සියල්ලම සුදුවීමෙන් හා මුහුණ රැලි වැටීමෙන් ද ඇ ඉතා වයස්ගතවූ ස්ත්‍රියක් බැව් අවබෝධ වේ. ඇ නිතර නිතර බුලත් හපන බැව් ඇගේ මුඛයෙන් ප්‍රකාශවේ.

"හැබෑටම නුඹලා කථාකරන්නේ මොනවා ද? පන්සලේදී ගෑණු දෙන්නෙක් රෙද්දකට රණ්ඩු වුණානම් ඒකට 'අනිච්චෙ දුක්කෙ අනාත්මේ' කියා කියනවා මිසක් ඔහොම හිනහාවෙන එක හොඳද" යි අසමින් ආත්තා ඔවුන් සිටි ස්ථානයට ආවා ය.

ආත්තා එන නිසා ඉතා අමාරුවෙන් සිනානොවී සිටි නුමුත් මේ වචන ඇසීමෙන් සියලු දෙනාම සිනාසෙන්ට වූහ. ආත්තා වඩ වඩා කිපී මොවුන්ට බැණවදිමින් යන්ට ගියා ය.



Scanned with CamScanner

ඇන්නා පියාට අනු සෝමී නැවතත් කථාව ආරම්භ කළා ය.

"අර කියන විදියට කරන්න පුළුවන. කොයි එකටත් අනිච්චේ දුක්ඛෙ අනත්තමේ" කියන්ට. අද ගෙදර ගියාම මෙහෙරෙන්න බැරි වෙනවා. මහට අද දවස පුරුල්ලේම මකිනවා."

"ඇල්බට් ඊයේ පන්සලට ගිය තුමුන් සතයක්වත් පූජා කළේ නැද්ද නොවේදැයි" ඇමී ඇසුවා ය.

"ඇයි මම කණෙනුවත් තොරෙනුවත් සතදහයක් පූජා කළා."

"කන්නුන්ට දෙන්ට ඕනෑ ඉස්සරවෙලා පන්සලට සල්ලි පූජා කරලා නොවේ ද?"

"ඒක මම දන්නේ නැහැ"

"යාතුන් වහන්සේලා හිඟන නැහැටවත් සතයක් පූජා කළේ නැද්ද?"

ඇල්බට් කිසිත් කථා නොකර සිටියේ ය.

"හොඳයි! උඹ පන්සලට බිබිල්ලා තිබෙන්නේ අපි කරදර කරන නිසා වෙන්ට ඇති. යාතුන් වහන්සේලා ඇසින් බලා සල්ලි පූජා කළාම අනිත් ජාතියේදී ඇස් ලෙඩක් හැදෙන්නේම නැත කියා හාමුදුරුවෝ කීවා ඇහුණේ නැති ද?"

මෙසේ කථාකරමින් සිටින අතර විස්ටර්ගේ කෝට් සාක්කුවෙන් සුරුට්ටුවක් බිම වැටී එය සෝමී අරගන්නවා දැක "විස්ටර් තුඹලා සුරුට්ටු බොන්ට පුරුදුකරගෙන තිබෙන්නේ මොන ප්‍රයෝජනයකටදැයි" යි ඇසුවේ ය.

"අපි අද බිටලා සුරුට්ටුවක් බිවාම වැරදි ද?"

"ඔ [illegible] හැටි අමාරුවෙන් ඉද හිටලා වැයම් කරලා සුරුට්ටුවක් බොන්නේ මොකටද? මේ පළාතේ මිනිසුන් දක්කාම තුඹලාට නින්දා කරන්නෙ නැද්ද?"

"අපි කාටවත් පෙනෙන්නට සුරුට්ටු බොන්නේ නැහැ. කාමරයකට වෙලා දොර වහගෙන සුරුට්ටුවක් බොනවා. ඕක කවුරුවත්, තුඹලා නොකීවොත් දැනගන්නේ කොහොම ද?"

"තුඹලාට සුරුට්ටු බොන්ට කිසිම ඕනෑකමක් නැහැ. අපට නම් දුම්බීම අපේ කිසිම උත්සාහයක් නැතිව නොදැනුවත්වම පුරුදු වෙනවා. තුමුන් තුඹලාට එහෙම පුරුදු වෙන්ට අන්දමක් නැහැ.





පළමුවෙන්ම තුඹලා ගෙදර සිටින කෙනෙක් බීලා ඉවත ලන සුරුට්ටු කෑල්ලක් අල්ලාගෙන ඉන් උගුරක් දෙකක් බොනවා. මෙසේ තුම තුමයෙන් මාස තුන හතරකින් සම්පූර්ණ සුරුට්ටුවක් බොන්ට පුරුදුකර ගන්නවා. මේ අතරතුරේදී ඔත්වෙලා අමාරුවට පත්වෙන වාරවල් ගණනක් නැහැ. සුරුට්ටු බොන්ට පුරුදු කරන කාලයේ තුඹලා එය "ස්ටයිල්" එකක් මෙන් සලකනවා. ඒ නිසා තමයි ඔය තරම් අමාරුවෙන් සුරුට්ටු බොන්ට පුරුදුකරගන්නේ."

සුරුට්ටු බීම "ස්ටයිල්" එකක් හැටියට අපි කවදාවත් කල්පනා කළේ නැහැ. හොඳයි තුඹලා සුරුට්ටු බොන එකත් හොඳ නැහැ නොවේ ද" යි ඇමී ඇසුවාය.

"දැන් අපි කථාකළේ සුරුට්ටු බීමෙහි ගුණාගුණ ගැන නොවේ. තුඹලාට අමාරුවෙන් පුරුදුකරගන්ට උවමනා වැඩක් නොවන බවයි කීවේ. තුඹලා සුරුට්ටු බීම චාරිත්‍රයක් වශයෙන් වැරදියයි මේ පළාතේ කවුරුත් සලකනවා. ඒ නිසා තුඹලා චාරිත්‍රයට යටත් වෙන්ට ඕනෑ. අපි බයිසිකල් පැද්දට මේ පළාතේ කිසිවෙක් නු කියන්නේ නැහැ. නමුත් ස්ත්‍රියෙක් බයිසිකල් පදිනවා දුටුවොත් මේ පළාතේ කොල්ලෝ නු කියාවි. සුරුට්ටු බීම තුඹලාගේ උත්සාහයක් නැතිව පුරුදුවෙන්නේ නැහැ. ඔය තරම් අමාරුවෙන් ඔය වැඩේ පුරුදුකරගන්නේ මොන ප්‍රයෝජනයකට ද? තුඹලාගේ උත්සාහයක් නැතිව දුම්බීම ඉබේම පුරුදුවෙනවානම් ඒක වැරදි කීමට කාරණයක් නොවේ."

මේ කථාව වසා දමන්ට අදහස්කොට සෝමී ඇල්බට්-ගෙන් අනෙක් කාරණයක් ගැන මෙසේ අසමින් ඇසිපිය හෙලුවා ය.

"ඇල්බට්, ඊයේ තොතාරිස් මහත්මයාගේ දූ ලීලාත් පන්සලට ඇවිත් සිටියා දුටුවා ද?"

මේ වචන ඇසීමෙන් ඇල්බට් ගේ සිතෙහි වෙනසක් ඇති වූ බැව් ඔහුගේ මුහුණේ ඇතිවූ ප්‍රාණවත් ගතියෙන් ප්‍රකාශ විය. ඇල්බට් කිසිවක් කථානොකොට ටික වේලාවක් නිශ්ශබ්දව සිට "ඔව් මම දුටුවා" යන වචන පමණක් කීවේ ය.

"ඈ සමග කථා කළේ නැද්ද" යි සෝමී නැවතත් සිනාසෙමින් ඇසුවා ය.

ඇල්බට් සිනාසෙමින් "තුඹ මේ ගැන ඔයතරම් දුරට ප්‍රශ්න කරන්නේ මන්ද" යි සෝමීගෙන් ඇසුවා ය.

"හා! ඇල්බට් තුඹ දන්නේ නැද් ද? ඊයේ සොමී බලන්ට චාල්ස් ඇවිත් ගියා නෙව. සොමීට ඒක මතක්වෙලා වෙන්ට ඇති" යි කියමින් වික්ටර් සිනාසෙන්ට පටන් ගත්තේ ය.

සොමීට තරහ ගොස් වික්ටර්ට රවමින් "ඔව් - මම බලන්ට ආවා. මම නෙවි තුඹ බලන්ට එන්න ඇති" යි කීවා ය.

"අපව බලන්ට නාවාට චාල්ස් අපට නිතරම සම්බ-වෙනවා. ඇල්බට් දන්නවයි ඊයේ සොමී ලේන්සුවකුත් තෑගි දුන්නා නෙව චාල්ස්ට -" කියමින් වික්ටර් සහ ඇල්බට් ද සිනාසෙන්ට වූහ.

සොමීට හොඳටම තරහ ගොස් "ඔව් - ලේන්සුවක් මහලා දීලා තිබෙන්නේ තුඹ වෙන්ට ඇති" යි කියමින් එතනින් යන්ට උත්සාහ කළා ය.

"මොන මෝඩියෙක් ද? ඒ ගොල්ලන්ට ඕහෑ දෙයක් කියන්ට ඇරලා තුඹ කතා නොකර ඉඳපන්" යි කියමින් ලූසී සොමීගේ අත ඇල්ලා ගත්තා ය.

"චාල්ස් මතක් කළාම සොමීට ඔයතරමට කේන්ති මො[illegible]කාද" යි ඇල්බට් ඇසුවේ ය.

"එයා මගේ දිහාව බල බල කියන්නේ මොකොට ද?"

"එහෙනම් අපි ඇස්දෙක පියාගෙන කථාකරනවා යයි වික්ටර් කීවේ ය."

"ඉතින් උඹ කියාගනින් - මට මොකෙ ද? අත ඇරපන් ලූසී මට යන්ට, වැඩ තිබෙනවා" යි කියමින් සොමී නැවතත් යන්ට උත්සාහ කළා ය.

"හා! ලූසී ඔයාට යන්ට ඉඩ ඇරපන්. චාල්ස්ට දෙන්ට තව තෑගි වගයක් ලෑස්තිකරන්ට තිබෙනවා වෙන්ට ඇති" යි වික්ටර් නැවතත් කීවේ ය.

මෙහිදී සොමී හැර අනික් සියලු දෙනාම සිනාසෙන්ට වූහ. සොමී හොඳටම කේන්ති වී වික්ටර්ට බැණ බැණ ගෙදර දිව්වා ය.



# 3 පරිච්ඡේදය

"භය ඇතිකරන්නා නීචයෙකි. භය නැතිකරන්නා උත්තමයෙකි."

අනගාරික ධර්මපාල

දිනක් ඇල්බට් සවස් කාලයේ ගෙට තුදුරු පිට්ටනියේ තමන්ගේ පුරුදු ආසනයෙහි වාඩිගෙන කල්පනා කරමින් සිටියේ ය. වරින් වර නළල අතගෑමෙන් හා නිකට අතගෑමෙන් ද ඔහුගේ සිතෙහි මහත්වූ වික්ෂිප්තභාවයක් හටගෙන තිබෙන බැව් ප්‍රකාශ විය. මෙසේ ටික වේලාවක් කල්පනා කරමින් සිටින ඔහු ඔහුගේ සිතෙහි ඇති වූ අදහස් දරාගත නොහැකි-වූවායින්දෝ සෙමින් සෙමින් කියන්ට පටන්ගත්තේ ය.

"මා රත්නවීර නෝනාරිස්ලාගේ ගෙදරට යන එන කාලයේ ලීලා පාඨශාලාවට යමින් සිටියා ය. ඒ කාලයෙහි ඈ ගැන මගේ සිතෙහි ප්‍රසන්න ගතියක් හටගෙන තිබුණ නමුත් මට එය තේරුම් ගන්ට බැරිවිය. මම මෙහි නොසිටි අවුරුදු තුනක හතරක පමණ කාලය තුළදී ඈ කෙතරම් වෙනස්වී සිටින්නී ද?"

"සුලකළ මිණි මෙවු ල්
රන සක ලෙසින් සුවිපු ල්
පුළුලුකුල මනක ල්
යොවුන් මිණිගඟ වැලිතලා තු ල්

කරන දන මනද ග
ගතහැකි මිටින් ඉඟ සු ග
සපිරි පියයුරු යු ග
නිබඳ උසුලා වැහැර ගිය ර ග

රුදුණු පැහැ සිලි          ලේ
නැම සෝහැන්හ තිම          ලේ
වසාරෝද සුනි          ලේ
තම්බු ලිය සිරි රුපැයි ලක          ලේ

ඇගෙ තුනු සිරි මැදු          ර
සුසැදූ රන්කලස යු          ර
මිහරු පියයුරු බ          ර
බැලුවන්ගේ සිතට එම බ          ර

මලවිදෙව් මුදුන          ත
සපුමල් දමෙව් පැහැප          ත
ඇගෙ යුවල මොලොක          ත
නිතොර දිසි විදු දමෙක සිරිග          ත

මුතු පෙළිනි සුලක          ළ
පබලු දලු සිරි පළ ක          ළ
ඇගෙ මදහසිනි දු          ළ
සුරත ලවනත පුරා මනදො          ළ

දෙමට තල මල් ලෙ          ස
දිගු තුගු ගහණ මියුලැ          ස
නළල් තල රන'හ          ස
පෙවූ තුඩුවැනි මුවනඹර දෙ          ස

දිග යන සඳ සෙදි          න
රෝසිහෙව් කණට නවත          න
කෙළවර රත ලෙළෙ          න
නුවන් යුග ඇගෙ බැබළි වෙසෙසි          න

දෙබැම දෙව් දුනු          වන්
පටු නළල අඩ සඳ          වන්
ඇගෙ දිගු යුග ස          වන්
කෙළන රුසිරි රතෝවිලි          වන්"*

"ඇගේ වෙනස්වී තිබෙන රූපය දකින මට මේ කවි ස්මරණය
ම පුදුමයක් නොවේ. මගේ සිතෙහි ඇ ගැන පෙර පටන් පැවති

ාව්‍යශෙඛරය * සිදත් සඟරාව *** සුභාෂිතය





ප්‍රසන්න ගතිය කුමක්දැයි දැන් මට තේරුම්ගන්ට පුළුවන් විය. ඇගේ යහපත් ගතිය හා ඉගෙනීම ගැනත් මා හොඳින් දන්නා බැවින් ඇ කෙරෙහි මගේ සිතෙහි ආලය බලවත් වී තිබේ. ඇගේ සිතෙහිත් මා කෙරෙහි ආලය ඇති නොවීමට කාරණයක් නොමැතියි. නමුත් ඇ මට ආලය-කරනවාද නැද්ද? යනු හොඳින් දැන ගෙන ක්‍රියාකරන්ට ඕනෑ. ඇ මට ආලය නොකරනවා නම් මගේ සිතෙහි ඇති ආලය කෙතරම් බලවත් වුවත් මැඩපවත්වාගන්ට ඕනෑ. "මහත්මෝ පරඟනන්ට උර රැපුන්ට පිටුද නොදෙත්"** ආදරයට වාල්වී නොතරම්කම් කිරීම මට තරම් නොවේ.***

මේ කාලයේ සමහර තරුණයන් තමන්ට ආලය නොකරන තමන්ට සම නොවන ස්ත්‍රීන්ට ආලය කොට ඒ ස්ත්‍රීන් බලාත්කාරයෙන් හෝ ප්‍රයෝගයෙන් තමන් වෙතට හරවාගන්ට ගොස් ලෝකයාගෙන් නින්දා අපහාස ලබා විනාශයට පත්වන බැව් නිතරම අසන්ට ලැබේ. උමතුවූවන් මිස සිහි ඇති මනුෂ්‍යයෝ මෙසේ ක්‍රියා නොකරත්. මෙසේ ක්‍රියා කිරීම අප පක්ෂයට බලවත් නින්දාවක් නොවන්නේ ද? මට ආලය නොකරන ස්ත්‍රියෙකුට මම කුමට ආලය කරම් ද? ඇ බලාත්කාරයෙන් හෝ ප්‍රයෝගයෙන් හෝ මාගේ වසඟයට ගැනීමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? මෙසේ ක්‍රියාකරන්නේ ආලය නිසා නොව ඇතැම් කාමුක තරුණයන්ගේ සිතෙහි ඇති වන නින්දිත විෂම අදහසක් නිසා වියයුතුයි. උත්තම ගති ඇති මනුෂ්‍යයෙක් කිසිකලෙකවත් තමන්ට ආලය නොකරන ස්ත්‍රියක් නිසා නොව තමන්ට ආලය කරන ස්ත්‍රියක් නිසාවත් නොතරම් කම් නොමකරන්නේ ය.

ගජ කුම් බුදින එකසර කෙසරිඳු බලැ          ති
කෙතරම් සාවුවත් තණකබල නුබුදි          ති
විහිගුම් කුලෙන් යුතු උතුමෝ අබිමනැ          ති
දිවිහිමි කොටත් නොතරම් කම් නොම කෙරෙ          ති"*

"ලීලාගේ අදහස් කෙසේදැයි දැනගන්ට ඕනෑ. ඇගේ මව් පිය දෙන්නාම මා ගැන ප්‍රසන්නව සිටිත්. සමානාත්මතා ධර්මයෙන් ද අප දෙපක්ෂය එක සමාන වන්නාහ. ලීලා සතුටුනම් අප දෙදෙනාගේ සම්බන්ධයට කිසිම බාධාවක් නොමැතියි"

* සුභාෂිතය

"ලීලා" මෙසේදී අපි සබඳයක් ඇති ඇල්බට් ඒ දෙස බැලුවිය. ඔහුගේ නැන්දා ගෙනෙන්නන මරිහාමි තමන් වෙතට එනවා දුටුවේ ය.

මෑ ඇල්බට්ලාගෙන් උපකාර ලබමින් ඔවුන්ගේ ගෙදර සිටපු, යැවෙනෙන්නාවූ මිණ දනම් ගැන අති සමර්ථයක් නැතියට ගැණු අම්මණ්ඩිලා අතර ප්‍රසිද්ධව සිටින ස්ත්‍රියකි.

"ඇල්බට් මහත්මයා මම හොඳ බණ පොත් දෙකක් ඉල්ලා ගෙන ආවා" යයි කියමින් මරිහාමි ඒ පොත් දෙක ඇල්බට් දෙසට දිගුකළා ය.

"පොත් දෙකක් නම් මොනවාද" යි ඇල්බට් ඇසුවේ ය.

"එකක් 'උපාසක ඔවාරත්න මාලය' අනික් එක 'අට මහ නරක විස්තරය. මම මේ පොත් දෙක ඉල්ලාගත්තේ කොපමණ මහන්සිවෙලා ද? මිනැතාම් අරගෙන කිලුටු නොකර කියවා බලන්න."

"ඔය පොත් කියවන්ට මම නැන්දා විතර සමර්ථයෙක් ද? නැන්දා කියවනවා නම් මමත් අහගෙන ඉන්නෙමි" යි ඇල්බට් කීවේ ය.

මේ වචනවලින් ඇගේ උගත්කම වර්ණනා කළා යයි සිතා අහංකාර වී සබඳ නගා ඒ පොත් දෙක කියවන්ට පටන් ගත්තා ය.

"සමහර අය වෝල් රමන් රවිකිඤ්ඤා ගස ති
සමහර අය මාල්කියා නොයෙක් මඟුල් ගනි ති
සමහර අය රනවල් මැද පනයනකල් දුව ති
සමහර අය තුලසිරිනට විපිරියාස කර ති

සමහර අය කොල්ලකකා ඉඩන් කඩන් ගනි ති
සමහර අය වන්චාවෙන් මුදල් එකතු කර ති
සමහර අය නොයෙක් ලෙසට කොරෝද පිරිමස ති
සමහර අය උන්නු හැටියෙ ගිය ගිය තැන මැරෙ ති

සමහර අය ඊට්ඨිසෝ කියමින් වැද පෙරලෙ න්නා
සමහර අය ඊනිඨිසෝ කියමින් වැද පෙරලෙ න්නා
සමහර අය කිසිත් නොදන නිකම්ම වැදගෙන ඉ න්නා
සමහර අය සිහිය මදිව නිකම්ම ඔහෙ සිල් ග න්නා"

"ඔය පොත තියෙව්වා ඇති, 'අටමහ නරක විස්තරය' කියවන්න" යයි ඇල්බට් කීවේ ය.





මරිහාමි තව තවත් ආඩම්බර වී මුහුණ උද්ධතයෙන් පෙනෙන කියවන්ට පටන්ගත්තා ය.

"අවීචි මහානරකයෙහි උපදින නිරිසතුන් උණුවෙල්ලෙන් බැඳ ගිනිගෙන දිලිසෙන යකඩ උලක් දකුණු අතේ ගසා පොළොවට බේම්කරයි. එසේම ගිනිගෙන දිලිසෙන මිනී උලක් වම් අතේ ගසා පොළොවට බේම්කරයි. එසේම ගිනිගෙන දිලිසෙන මිටිඋලක් දකුණු පාදයෙහි ගසා පොළොවට බේම්කරයි. තවත් නිරිසතෙක් ළේලා යමපල්ලන් විසින් කිම හෙවා කතර ඉලන්ගොට අසයි. අටලුලන්තෙට අසයි. පොරවෙන් ලී කපන්නාසේ අත් පා කපයි."*

මේ වේලාවේදී 'නරකාදි විස්තරය' අසාගෙන සිටි අවුරුදු 4 ක පමණ වයස්වූ වික්ටර්ගේ පුංචි මල්ලී හැඩාගෙන දුවවිත් ඇල්බට්ගේ නාදයෙහි හිස සඟවාගත්තේ ය. ළදරුවාගේ සිතෙහි ඇතිවූ භීතිය ජීවිතාන්තය දක්වාත් නැති නොවන බැව් ඔහුගේ මුහුණෙන් සහ ඇස්වලින්ද ප්‍රකාශ විය. ඔහුට ඇති වූ මේ භීතිය නිසා මතු කාලයෙහි ස්වභාවයෙන්ම මනුෂ්‍යයෙකුට ඇතිවිය යුතු නිර්භීත සතිය ඔහුට ඇති නොවන බැව් ඇල්බට් කල්පනා කළේ ය.

"ඔය පොත තියෙව්වා ඇති. තවත් කියවන්ට එපා ය" යි ඇල්බට් මරිහාමිට අණ කෙළේ ය. "ඔයගොල්ලන්ට හොඳ මේවා තමයි. හොඳට බයකරන්ට ඕනෑ ය" යි කියමින් මරිහාමි නොකැමැත්තෙන් හිස සොලවමින් පොත තියෙව්වා ය.

"කන් නාසා කපයි. කියත ගෙන හඬව හඬවා කුට්ටිකර කපයි. අඬුවගෙන කට හරවා පැසී උතුරන ලෝදිය කටේ වත්කරයි. එවිට ඒ නිරිසතාගේ මුඛය දැයි, දිව දැයි, උගුර දැයි, හදය දැයි." මෙසේදී ඇල්බට් මරිහාමිගේ අතින් පොත උදුරා විසිකළේ ය.



Scanned with CamScanner

# 4 පරිච්ඡේදය

නක්ෂත්‍රය බලන්නාවූ අඥානයාගේ අර්ථය ඉක්මෙන්නේ ය. අර්ථයට අභිමතාර්ථ ප්‍රතිලාභයම නක්ෂත්‍ර නම් තාරකා රූපයෝ කවර නම් අර්ථයක් සාදද් ද?

-නක්ඛත්ත ජාතකය

"කොළඹ ගොස් අවුරුදු තුනක් පමණ වනතුරු ගමට නා නිසා එහිදී මහණ වෙලා වෙන්ට ඇතැයි අපි සිතුවා" යයි ලීලා ඇල්බට් දෙස බලා සිනාසෙමින් කීවා ය. ලීලාගේ මෑණියෝ උවමනාවක් පිණිස එතැනින් නැගිට ගෙට ගියාහ. මොවුහු වාඩිවෙලා සිටි ස්ථානය 'සිරිනිවසෙහි' ඉස්තෝප්පුව විය. එහි වෙන කිසිවෙක් නොසිටියේ ය. ලීලාගේ මව් ඔවුන් සමඟ බොහෝ වේලාවක් කථා කරමින් සිට වුවමනාවක් පිණිස ගෙට ගිය බැවින් ලීලාට සහ ඇල්බට්ට ද හුදකලාව කථාබස් කරන්ට ඉඩ ලැබුණේ ය. සූර්යයා අස්තංගත වී අන්ධ- කාරය පැතිර තිබුණේ ය. මල්ගස්වල අතුපතරින් වැසී තිබුණ බැවින් චන්ද්‍ර රශ්මිය ද ඔවුන් සිටි ස්ථානයට වැඩිපුර නොවැටුණ නමුත් පහන් ආලෝකය ඇතිවිය.

"මහණවෙලා වෙන්ට ඇතැයි සිතුවා" ය කියමින් ඇල්බට් පුදුම වූවෙකු මෙන් ඈ දෙස බැලුවේ ය.

"ඔව්"

"ඇයි"

"ඇයි! මතක නැහැ, පාඨශාලාවට යන කාලයේ මහණ වෙන්ට ඕනැය කීවා, පාඨශාලාවට යන එක හිරිහැරය කියා."

"එහෙම කීවේ පාඨශාලාවට යන කාලයේ නෙව, හොඳයි මහණ වෙන්ට වෙන පළාතකට යන්ට ඕනෑ ද?"

"නැතිව, මේ පළාතේ මහණ වෙනවාට අපි කැමති -" ලීලා අනික් වචන කියනතුරු නොයිඳ "හා! මේ පලාතේ පන්සලක මහණ වෙනවාට නුඹ කැමැති නැද්ද" යි ඇල්බට් ඇසුවේ ය.





"නැහැ"

"ඇයි"

"නුඹේ බණ අහන්ටත් වැඳුම් පිදුම්කරන්ටත් අපට බැරිය" යි ලීලා සිනාසෙමින් කීවා ය.

"මම මහණ වෙනවාට නුඹ සතුටුවෙන එකක් -" කියනවාත් සමගම ඇල්බට්ගේ මුහුණෙහි තිබුණ සිනා ගතිය නැතිවී ගියේ ය. ඔහුගේ සිතෙහි තිබෙන බලවත් බලාපොරොත්තුවක තීරණය දැනගතයුතු ප්‍රස්තාව බැව් දැනී ඔහු කල්පනා සහිත වූයේ ය.

"ඇයි අපි සතුටුයි" යි ලීලා කිසි අමාරුවක් නොහඟවා උත්තර දුන්නා ය.

"එතකොට නුඹට -" මෙහිදී ඇල්බට් අනික් වචන කටින් පිටවෙන්ට නැර යටපත්කර ගත්තේ ය.

"එතකොට නුඹට -මට ඒක තේරෙන්නේ නැහැ."

"නුඹට වෙනකෙනෙක් -" ඇල්බට්ට මීට වඩා යමක් කථා කරන්ට නොහැකි විය.

"මට කව්රුවත් මොකට ද? අපේ අම්මාත් තාත්තාත් දෙන්නාම ඉන්නවා."

"ඒක මමත් දන්නවා, නුඹ වෙන - කෙනෙකුට - ආ - ල -" යන්නට වැඩිය ඇල්බට්ට කථා කරන්ට නොහැකිවිය.

මේ වචන ඇසීමෙන් ලීලාගේ සිතෙහි පැවති ප්‍රීතිය නැතිවී ගිය බැව් ඇගේ මුහුණෙහි ඇතිවූ වෙනසින් ප්‍රකාශ විය. ඈ ඇල්බට් ආශ්‍රය කළ නමුත් ආදරය සම්බන්ධව කල්පනා කිරීමට කරුණක් සිදු නොවී ය. ඇට ආදරය සම්බන්ධව චින්තනය කිරීමට සිදුවූ පළමුවෙනි ප්‍රස්තාව මෙය විය. මහ මුහුදේ රළ මෙන් ඇගේ හෘදය උස් පහත් වීම ඇල්බට්ට ඇගේ ආදරය ප්‍රකාශ කිරීමට ලජ්ජාවෙන් මැඩ පවත්වා ගැනීමට තැත් කරන්නාක් මෙන් විය. ඇගේ හෘදයෙහි ඇල්බට් කෙරෙහි පැවති ප්‍රසන්න ගතිය නැමැති පියුම් කැකුළ ඔහුගේ ආදරය ප්‍රකාශිත වචන නමැති ළහිරු රශ්මියෙන් ප්‍රබෝධ විය. කම්මුල් දෙක රක්තවර්ණවීමෙන් හා අක්ෂි යුග්මයෙහි අමුතු දීප්තියක් ඇතිවීමෙන් ද ඇගේ සිතෙහි ඇති වූ වික්ෂිප්තභාවය ප්‍රකාශ විය. ලීලා ඇගේ චලනය වන්නා වූ දෙතොල ඒකාබද්ධ කොට කථාකිරීමට



Scanned with CamScanner

තැත්කළ නමුත් බැරි විය. ඇ නැවතත් සිතට ධෛර්යය ගෙන "වෙන - කෙ - නෙ - කු - ට -" යන්න කියනවාත් සමඟම ලීලාගේ මෑණියන් නැවත ඔවුන් සිටි ස්ථානයට ආ බැවින් කථාව නවත්වන්ට සිදුවිය.

*     *     *     *     *

දිනක් ඇල්බට් මරිහාමි නැන්දා අසනීපව සිටිනවා යයි ආරංචි වී ඇ බලන්ට ගියේ ය. ඔහු යනවිට ඇගේ ගෙදර දොරපිලේ රෞද්‍ර ගති ඇති තරබාරු මිනිහෙක් කැඳ කෝප්පයක් අතින්ගෙන පුටුවක වාඩිවී සිටියේ ය. රෝගාතුරයන්ට කැඳ මැතිරීමාදී යන්ත්‍ර මන්ත්‍ර ඇදහීම මේ පළාතේ උගත් නූගත් කා අතරෙත් පවතින සිරිතක් බැවින් මේ කැඳ කෝප්පය අතින්ගෙන සිටි අය යකැදුරෙක් බැව් ඇල්බට් ඔහු දුටු හැටියේම සිතට ගත්තේ ය. කැඳ කෝප්පය ඔහුගේ දුර්ගන්ධ මුඛයට කිට්ටුකර කිසිවෙකුට නෑසෙන සේ ඉතා සෙමින් මතුරන්ට පටන්ගත්තේ ය. යකැදුරන් යම් දෙයක් මතුරන විට ඊට විටින්විට මුඛයෙන් මහත් වේගයෙන් ප්‍රාශ්වාස කිරීම සිරිතකි. මේ යකැදුරාගේ මුඛයෙන් සහ නාසයෙන් ද ප්‍රාශ්වාස කරන විෂ වාතය ආශ්‍රය වීමෙන් කැඳ කෝප්පය දූෂිතවන්නේ ය. ඒ හැර යකැදුරාට යම් කිසි බෝවෙන රෝගයක් වැළඳී තිබුණොත් ඔහුගේ මුඛයෙන් පිටවෙන වාතය සමඟ යථොක්ත රෝගය දහස් ගණන් ක්ෂුද්‍ර ප්‍රාණීහු කැඳ කෝප්පයට පතිත වන්නාහ. රෝගියෙක් තබා නිරෝගි මනුෂ්‍යයෙක්වත් මේ කැඳකෝප්පය බීම කෙතරම් භයානක ද? මින් ඇතිවන භයානක විපත් ගැන මේ පළාතේ සිටින නූගත් අය තබා උගත් අයවත් කල්පනා නොකරත්. යකදුරා කැඳ මතුරා දී ගියාට පසු ඇල්බට්ද රෝගාතුරයා ගැන කරුණු අසා ඔහුට උණ අතීසාරය වැළඳීගන එන බැව් සිතටගෙන "නැන්දා මේ ලෙඩා වෙදෙකුට පෙන්නුවේ නැද්දැයි" ඇසුවේ ය.

"කොහේද වෙදකම්කරාට හරියන්නේ නැහැ, මේක අමුයක් ලෙඩේය කියා යකැදුරු අප්පු කීවා ය" යි මරිහාමි උත්තර දුන්නා ය.

"තම ත් හට නොසමයන්වන කලට ස ම
මුවෙ ත් නොබැණ ඉවසනු සුදන ගරුක ම
නොමින් කුමුදුවන විකසිත වනු දක ම
විළි ත් මෙන් තඹුරු මුකුලිතවේය හැ ම"*

* සුභාෂිතය





යනාදිය කල්පනා කොට ඇල්බට් ද අන්ධ භක්තියෙන් යන්ත්‍ර මන්ත්‍ර විශ්වාස කරන මෑ හා සමඟ ඒ සම්බන්ධව කිසිවක් කථා කිරීම නිෂ්ඵල බැව් සිතට ගත්තේ ය.

"හොඳයි යකැදුරුකම් කරන අතරතුරේදී බෙහෙත් කෂාය දීම නරකදෑ" යි ඇල්බට් ඇසුවේ ය.

"අපටත් පේනවා මේක එහෙමපිටින්ම 'යස්ස විපිරි-යාසයක්' බව ඒ නිසා ඇදුරුකමින්ම ඕනෑ ගුණයක් ගන්න. දූන්ම වෙදකම් කරන්ට ගියොත් වරදිනවාය කියා යකැදුරු අප්පුත් කීවා."

"ඔය යකැදුරාගේ කීමට වෙදකම් නොකර සිටීම හොඳයයි මට හිතෙන්නේ නැහැ."

"අනේ ඒ මිනිහා ඇදුරුකමට කොපමණ සමර්ථයෙක් ද? ලෙඩාගේ අත අල්ලා බලා බැඳපු කැමක් කාළා තිබෙනවා යයි කීවා. හෙට සන්නි යකුමකුත් නටවන්ට නියමකරගෙන තිබෙනවා. මේවාට අපට උපකාර කරන්ට ඕනෑ."

"මමත් අනිද්දා විතර කොළඹ යනවා, පුළුවන් උපකාරයක් කරන්ට බලන්නෙමි" යි කියමින් ඇල්බට් යන්ට ගියේ ය.

තොවිලය නියම කරගත් දිනය ළං වනවාත් සමඟම ලෙඩාගේ අසනීපයද වැඩි විය. යකදුරෝ ද තොවිලය නියම දිනැවිත් ඊට උවමනා දේ සූදානම් කරන්ට පටන්ගත්තෝ ය. සවස්වන විට ගොප්, කෙසෙල් පතුරු ආදිය එල්ලා සන්නි යකුන් මඩුව සහ පිදේනි සරසා ඉවර කළෝ ය. තොවිලය ආරම්භ කළ යුතු වෙලාව ආසන්න වූයෙන් ලෙඩා ද පුටුවක ඉඳගැනීම අපහසු නිසා කොට්ට හත අටක් පමණ තබා බිම වාඩිගෙන ඊට හාන්සි වී සිටියේ ය. මේ රාත්‍රියෙහි රෝගියෙක් තබා නිරෝගි මනුෂ්‍යයෙක් වුවත් ශීත සුළඟ ආශ්‍රයෙන් බලවත් අමාරුවට පත්වෙන බැව් යන්ත්‍ර මන්ත්‍ර ගැන මොවුන්ගේ තිබෙන දෘඪ භක්තිය නිසා කල්පනා - කරන්ට නොහැකි විය. නැට්ටුවත් ද තොවිලය පටන් ගැනීමට පළමු අරක්කු පානය කළ නුමුත් "බීපු මිනිහාට යකත් භයය" යන්න අදහන නිසාවෙන් දෝ කිසිවෙක් මොවුන්ගේ මේ ක්‍රියාව පිළිකුල් නොකළෝ ය. ටික වේලාවක් යනවිට යකැදුරෝ බෙර දෙකක් තඩිගසමින් උඩපනින්ටත් 'ලේ බොනවා, මස් කනවා, තා දෙපළුකරනවා' යනාදී වචන කියන්ටත් පටන්ගත්හ.



Scanned with CamScanner

මේ වෙලාවේදී මෙහි සැඩනි විසිතුරු ස්වභාවය විස්තර කළ නොහැකි නමුත් මේවා අසා බලා සිබෙන කෙනෙකුට නම් හොඳින් සිතාගත හැකියි. මොවුන්ගේ මේ විකාරයෙන්ම මුළු රාත්‍රිය ගත වී අලුදා නැගෙනහිර ආකාශයෙහි සූර්යයා උදාවීය. මොව්හු ද දහවල් කාලයෙහි මේ විකාර කිරීමට ලජ්ජා වූවාක් මෙන් වහා වහා තොවිලය අවසාන කොට තැගි බෝග ලබාගෙන යන්ට ගියෝ ය.

මේ තොවිලයෙන් තමන්ගේ රෝගය සුව වේය යන කල්පනාවෙන් සිටි ලෙඩා ද සිනාසෙමින් කථාකරනවා දුටු ඔහුගේ මව් පියාදීහු ප්‍රීතියට පැමිණ යකැදුරන්ට ප්‍රශංසා කරමින් ඔවුන්ගේ සමර්ථකම් ගැනත්, මන්ත්‍රවල ආනුභාව ගැනත් කථාකරන්ට වූහ. නුමුත් දහවල් කාලය වනවිට ලෙඩාගේ රෝගය බලවත්වීමෙන් මොවුන්ගේ ප්‍රීතිය ද නැතිවී ගියේ ය. මීට පසු කීපදෙනකුගේ අවවාද පරිදි වෙදෙකු කැඳවා රෝගාතුරයා පෙන්වූහ. වෙදා ද ලෙඩ බලා රෝගය අසාධ්‍ය වී තිබෙන බැවින් වෙදකම් කරන්ට අසතුටු බැව් කී නමුත් මවු පියන්ගේ හැඬීම් වැලපීම් නිසා වෙදකම් කිරීමට භාරගෙන බෙහෙත් කෂායාදිය නියමකොට ඉතා ප්‍රවේසමෙන් සාත්තු කරන්ට කියා යන්ට ගියේ ය. මොවුන් ඉතා ප්‍රවේශමෙන් හා සැලකිල්ලෙන් ද බෙහෙත් කෂාය දෙමින් සාත්තු කළ නමුත් ඒ කිසිවකින් සුවයක් නොලැබ පසුවදා සවස්වන විට රෝගාතුරයා මළේ ය.

අහෝ! මෙය කෙතරම් අපරාධයක් ද, මේ ලෙඩාට අසනීපය සෑදුන හැටියේම වෙදෙක් කැඳවා සුළු ප්‍රතිකාරයක් කෙරෙව්වා නම් මේ අපරාධය සිදුවෙනවා ද? මොව්හු මුල සිටම යකදුරුකම් කරමින් හත් අට දවසක් ගත කළා මිස වෛද්‍ය කර්මය ගැන කිසිත් නොසැලකූහ. තොවිල් නැටීමට මොවුන් රුපියල් පණහක් හැටක් පමණ වියදම් කළ නමුත් වෙදකම් කිරීමට මේ ලෙඩා වෙනුවෙන් මොවුන්ගෙන් රුපියල් පහක් වියදම් වෙන්ටත් නැහැ. යන්ත්‍ර මන්ත්‍ර ආදිය ගැන මොවුන්ගේ ඇති අන්ධභක්තිය නිසා මේ ලෙඩාගේ මරණය සිදුවුණ නමුත් "එයාගේ පූර්වකර්මය කිසිවෙකුට වැලැක්විය නොහැකි" යි කල්පනා කිරීමෙන් ඔවුන් විසින් කරන ලද අපරාධය ගැන කල්පනාකිරීමට ඉඩ නොලැබේ. මේ පළාතේ මේ අන්දමේ නිරපරාධ මරණ නිතරම අසන්ට දකින්ට ලැබෙත්.

මේ ලෙඩාගේ මරණයෙන් හත් අට දවසකට පසු දුප්පත් මරිහාමිගේ තවත් ළමයෙක් අසනීප විය. මොහුට ද තුන් හතර දවසක් යනතුරු වෙදකම් නොකොට යකදුරුකම් කරමින් සිටි බැවින්





උණ මලවත් වී "අන්නා අන්නා" කියමින් කෑගසන්නට "අන්න අන්නා මට අත වනනවා" යනාදී වශයෙන් කියන්නට පටන් ගත්තේ ය. මේ දුක ගිනියට පැමිණ සිටින මරිහාමිට එහි යන එන සියල්ලෝම වහාම "ශාස්ත්‍ර" අහන්ට කෙනෙක් පිටත් කළ යුතු බැව් කීවෝ ය. දුකෙන් සහ භයෙන් මිරිකී සිටින මරිහාමි ඇගේ සහෝදරියක් වන මර්තිනා සහ ඇගේ පුරුෂයාට ද රුපියල් දෙකක් දී ශාස්ත්‍ර අහන්ට පිටත් කළා ය. ශාස්ත්‍රකාර කෙරාටිකයා ද ශාස්ත්‍ර අහන්ට ගිය දෙදෙනා රවටා ප්‍රයෝගයෙන් ඔවුන් ගෙනම තොරතුරු දැනගෙන ඒ දෙදෙනාගේ සිතට ගැලපෙන අන්දමට 'ශාස්ත්‍රය' කීවේ ය. මේ මුග්ධයා ද ශාස්ත්‍රයයි විශ්වාස කරන මිථ්‍යාවක් අනුව කියන ලද සියල්ලම ප්‍රලාප වූ නමුත් මේ ශාස්ත්‍ර අහන්ට ගිය දෙදෙනාගෙන් දැනගෙන කී තොරතුරු පමණක් එසේ නොවී ය. මොව්හු එන ගමන් අතර මගදී ශාස්ත්‍රකාරයා කී කරුණුත් ඔවුන්ගේ සිතෙහි තිබුණ අදහසුත් එකට පටලවාගෙන ගෙදරවිත් නිකටෙහි අතගසාගෙන කියන්ට පටන් ගත්තෝ ය.

"අනේ මර්තිනා ගිය වැඩේ හරියාදැයි" මරිහාමි නැන්දා ඇසුවා ය.

"හරිගියා ද කියාලාත් අහනවා, අපි ගියොත් මෙහෙම වැඩකට - ඇයි අපි 'ශාස්තර' අහන්ට යන්ට පිටත්වෙනකොට ඉස්සරහට වතුර කලයක් අරගෙන එන කෙල්ලෙක් සම්භවුණා දුටුවේ නැද්ද? වැඩේ හරියන බව මම ඒ වෙලාවේම කල්පනාකරගත්තා" යයි මර්තිනා හිස සොලවමින් කීවා ය.

"අනේ මොනවාද කීවේ හණික කියාපන්" යයි මරිහාමි කීවා ය.

"අනේ ඒ මිනිහා හරියට 'දිවිය ඥානයෙන්' කීවා වගේ අපේ හිතේ තිබුණාටත් වඩා හොඳින් කීවා" ය යි කියමින් ඈ ශාස්ත්‍රාකාරයාගේ උගත්කම ගැන පුදුම වන්නාක්මෙන් නිකටෙහි අතගසාගෙන ශාස්ත්‍රය ගැන විස්තර නොකියා ප්‍රමාද වෙනවා දුටු මරිහාමි "අනේ හණික කියාපන් යයි" ඉතා සෙමින් කීවා ය.

"ඒ මිනිහා මොන මොනවා කීවාද මට මතක නැතිවෙන නිසා සමහරක් කඩදාසියක ලකුණු කරවාගෙනත් ආවා ය" යි කියමින් මර්තිනා කඩදාසි කැබැල්ල මරිහාමිටදී ශාස්ත්‍රකාරයා කී කරුණු කියන්ට පටන් ගත්තා ය.

"ළඟදී මැරුණ නැනැත්තා ගෙදරට ආසාවෙන් පෙරේතයෙක් වෙලා ඇවිත් ඉන්නවාය, සන්නි සමයමක් නටවා ඒ පෙරේතය



Scanned with CamScanner

බන්දවන්ට මිනැය කීවා, 'චන්දරයාගේ' අගුනයට 'ගිරහ' තොවිලයකුත්, හාමුදුරුවරු දොළොස් නමක් ලවා හත්වේලක් පිරිත් කියවා 'සාංගික' දානයක් දෙන්ටත්, කණවැන්දුම් ස්ත්‍රීන් දහසයදෙනෙකුට කිරිබත් සමඟ දානයක් දෙන්ටත්, විෂ්ණු දෙවියන්ට කිරිබත් පාත්‍රා හයකුත් මල්වට්ටි හයකුත් ඔප්පුකරන්ටත් කීවා."

"වෙන මොනවාද කීවේ, යකදූරුකමේ වැඩවලට කවුද හොඳෙයි කීවේ."

"මම මේ පළාතේ ඉන්න යකදූරන් සතරදෙනෙකුගේ නම සිතාගෙන ඇහුවා, සේරටම ඒ මිනිහා ඔලුව වැනුවා, අන්තිමට වැලිකොන්දේ ගුරුන්නාන්සේගේ නම සිතාගෙන මෙපාර හරියාවිය කියාලා සිතාගෙන ඔලුව එහෙම උහාලා කෙලින් සිටියා, එතකොට 'ශාත්තරකාරයා' කීවා මේ පාර හිතාගත් මිනිහාට බැරිනම් වෙන කෙනෙක් මේ වැඩේට නැත කියා පෙරේතයාගෙන් ලෙඩාටත් ගෙදරටත් බොහොම හිරිහැර පැමිණෙනවාය කියාත් කීවා."

"ඔව් ඒක ඇත්තමයි. ලෙඩාට දෙන්ට තිබුණ දෙළුම් පලුවත් නැතිවෙලා උදේ බලනකොට ගේ ඇතුලේ බාල්කයක් උඩ තිබිලා බිම වැටුණා, ලෙඩාත් අක්කා අත වනවාය කිය කියා කෑගහනවා, බාල ළමයාත් සනීප නැත කියා බුදියාගන්නවා, අනේ මොන 'විපැත්තියක්' සිද්ද වෙන්න එනවා ද කියාලා තේරෙන්නේ නැතැ'යි මරිහාමි ඉතා බැගෑපත් ලෙස කීවා ය.

"ඒක නොවෙන්නන් ඒ මිනිහා කීවේ. නියම කරපු වැඩ ඉක්මනට කරවන්න කියා, නැතිනම් පහුවෙනකොට හිරිහැර පැමිණෙනවාය කියා."

මේ 'ශාස්ත්‍ර' කාර මුග්ධයා කියාපු කටයුතු කරන්ට අඩුගණනේ රුපියල් දෙසියයක් පමණ වියදම් උවමනා වේ. මරිහාමි ළඟ සල්ලි නොතිබුණ බැවින් ඇගේ රන් රිදී බඩුත් පොල්ගස් ටිකකුත් උකස්කර මුදල් ලබාගෙන තොවිලය, පිරිත් කියවීම, දන්දීම ආදි සියලු කටයුතු ශාස්ත්‍රකාරයා කියාපු අන්දමට ඉෂ්ට කළා ය. මොව්හු ලෙඩේට කිසිම ප්‍රයෝජනයක් නැති වැඩපළ ඉතා සැලකිල්ලෙන් කළ නුමුත් වෙදා නියම කරපු අන්දමට බෙහෙත් කෂාය දීමාදිය ගැන වැඩි සැලැකිල්ලකින් ක්‍රියා නොකළෝ ය. මරිහාමිගේ දේපල සියල්ලම උකස්කොට කරන ලද නිෂ්ඵල වියදමෙන් රෝගාතුරවූ ඇගේ ළමයි දෙන්නාට කිසිම සුවයක් නොලැබ ඔවුන්ගේ රෝගය දිනෙන් දින





වැඩිවෙන්ට පටන් ගත්තේ ය. යක් තොවිල්, ග්‍රහ තොවිල්, දෙවි තොවිල් ද, සෙත්කවි කියවීම් ආදිය ද ඇගේ සිතේ අන්දමට සියල්ලම කර ඉවර වූ නමුත් ලෙඩුන්ට කිසි සුවයක් නොලැබුණු නිසා සැලැකිල්ලෙන් වෙදකම් කරන්ට පටන්ගත්තා ය. පළමු ලෙඩවූ ඇගේ අවුරුදු 10 ක් පමණ වයස් වූ ළමයාට මුලදී බෙහෙත් කෂාය දීමාදිය ගැන නොසැලකීම නිසා රෝගය බලවත්වී පසුව කරන ලද කිසිම ප්‍රතිකාරයකින් සුවයක් නොලැබ මළේ ය.

දරුවන් දෙදෙනෙක් සහ තමන් සන්තක වස්තුව ද අනර්ථයේ නැතිකරගත් මරිහාමි ඉතා දුකින් කාලය ගත කළා ය.



Scanned with CamScanner

# 5 පරිච්ඡේදය

මි තු ර න්  දුසිරිතෙන් අදරින් වැලකු  මය
එ ලෙ සි න්  සුසිරිතෙන් සතින් යෙදවූ  මය
දු ණ යෙ න්  කලණ යුතු මිතුරන් යුතුක  මය
එ ලෙ සි න්  නුඹුවන් කළ මැන නොසෙවූ  මය

කාලකණ්ණි ජීවිතය
පියදාස සිරිසේන

කොළඹ නමින් නැවතී සිටින විශ්‍රාම ශාලාවේ කාමරයක පුටුවක වාඩි වී ඇල්බට් නිකටෙහි අතගසාගෙන දුක්වෙමින් සිටියේ ය. ඔහු ඉදිරියෙහි තිබුණ මේසයේ එක් කෙළවරක පිළිවෙළට තබන ලද පොත් සමූහයක් සහ මධ්‍යභාගයේ ලාම්පුවක් ද තිබුණේ ය.

"අනේ අද මට සිදුවූ විපතක හැටි" යනුවෙන් ඇල්බට් ඔහුගේ මිත්‍රයන්ට අනුචිත කළ කී දේ ගැන කල්පනා කළේ ය. "විලියම් අද මට මත්පැන් පොවන්ට කෙතරම් උත්සාහ කළා ද? මම එයින් බේරුණේ කෙතරම් අමාරුවෙන් ද? නමුත් ඔවුන් සමඟ බීම සාප්පුවේ ටිකවේලාවක් නැවතී සිටින්ට සිදුවුණා නොවේ ද? මා අඳුනන කෙනෙක් එහි සිටියානම් මමත් බේබද්දෙක්ය කියා හිතන්නේ නැද්ද? බීම සාප්පුවට ගොස් මනුෂ්‍යයෙකුගේ මුහුණ බැලීමට පවා ලජ්ජාවෙන් සිටි නමුත් විලියම් එහි බොහෝ වේලාවක් කථා කරමින් සිටින්ට කැමැත විය. මත්පැන් බීම 'ස්ටයිල්' එකක් මෙන් සලකන බැවි ඔහු විස්කි පානය කළ අන්දමිනුත් කථා කළ කරුණු වලිනුත් තේරුම්ගන්ට පුළුවන් විය. විස්කි බෝතලයක් බීවත් විලියම්ට දනුමක් නැතිලු! කදිම සමර්ත්ථකම!" ආශ්‍රය නොකළ යුතු තැනැත්තන් සමඟ ආශ්‍රයකිරීමෙහි බලවත් දෝෂය ඇල්බට්ට තදින් වැටහී ගියේ ය. කෙතරම් යහපත් කෙනෙක්වුවත් මොවුන් සමඟ ටික කලක් ආශ්‍රය කිරීමෙන් මොවුන්ගේ අධම ගති පුරුදු වී ලාමක පුද්ගලයෙක් වීම ඒකාන්ත බැවි ඇල්බට් කල්පනා කළේ ය.





"කෙවිලී එහි මරා - මිණිතොරණෙ'රැඹු පුන්සඳ
පිරිසිදු හුදු මිලින් හා - මිලියෙන් සසඟෙනෙව්"*

මෙහිදී විලියම් ඇල්බට්ගේ කාමරයට ආවේ ය. ඔහු නිකටෙහි අතගසාගෙන සිටිනවා දුටු විලියම් "ඇල්බට් කනගාටුවෙන් වාගේ ඉන්නේ මක්නිසාද" යි ඇසුවේ ය.

"එහෙම මොකුත් නැතැ" යි උත්තර දී ඇල්බට් සිනා සහිත වූයේ ය.

"නැත කීවාට විශ්වාස කරන්ට බැහැ."

"ඇයි බැරි"

දැන් මට කල්පනා වුණා. මාර්ගරට් දකීමෙන්වත් හිත නරක්කර ගත්තා ද?"

"මාර්ගරට්! මොනවා! මට ඒක තේරුණේ නැහැ."

"අද අපි බලන්ට ගිය මගේ -"

"ඔව් ඈ නම් අද මම දුටුවා. එයින් මගේ හිත නරක්වීමට ඇති හේතුව කුමක් ද?"

"ඈ කොපමණ ලක්ෂණ තරුණියක් ද? ඇත්ත සඟවන්ට හදන්නේ මොනවාට ද?"

ඇල්බට් ටිකවේලාවක් කිසිවක් කථා නොකොට සිනාසෙමින් සිට 'මිතුරන් දුසිරිතෙන් අදරින් වැලකුමය' යන්න සිහිවූවායින් දෝ විලියම්ට අවවාද කරන්ට පටන්ගත්තේ ය.

"විලියම් අද නුඹ මා සමඟ ඇවිදින්ට ගොස් කළ කී දේ ගැනයි මම කල්පනා කරමින් සිටියේ. නුඹේ අදහස්, නුඹේ හැසිරීම හොඳ නැති බව කියා ඒවා වෙනස්කරගන්ට මම නුඹට කිහිප දවසක් කීවෙමි. නමුත් නුඹේ අදහස් වෙනස්කරගන්ට බැරිවීම පුදුමයක් නොවේ. සැපවිඳීමට නුඹ ගමන් කරන මාර්ගය හොඳය හරිය කියා හැඟෙන නිසා එය වෙනස්කර ගන්නේ කුමටදැයි නුඹ කල්පනා කරනවා ඇති. නුඹ සැප විඳීමට පුළුවනැයි සිතා ගමන්කරන මාර්ගය තවත් කෙනෙක් දුක්විඳින්ට හේතුවන මාර්ගයක් මෙන් සලකන බැවි කල්පනා කරන්ට ඇතැයි නොසිතමි. හොඳයි නුඹ කියන මාර්ගයේ ගමන් කොට සැප විඳින්ට පුළුවන්දැයි කල්පනාකර බලමු.

* මුවදෙව්දාවත



Scanned with CamScanner

"යම් වස්තුවක හොඳය, නරකය, ලක්ෂණය, අව-ලක්ෂණය කියා ගුණයක් ස්වභාවයෙන්ම පිහිටා නොමැතියි. යම් වස්තුවක් දැකීමෙන් හෝ යමක් ගැන කල්පනා කිරීමෙන් අපේ සිතෙහි ඒ සම්බන්ධව ඇතිවන විනිශ්චය මිස ලක්ෂණය, අවලක්ෂණය, කියා ගුණයක් ඒවායේ පිහිටා නොමැතියි. එක සත්වයෙකුට මධුරවූ ආහාරයක් තවත් කෙනෙකුට කටුක ආහාරයක්වේ. ඉතින් ඒ ආහාරයේ මධුර රසය කියා යම් ගුණයක් තිබේ නම් සියල්ලන්ගේම විනිශ්චය එකාකාර විය යුතුයි. නමුත් එය එසේ නොවේ. නුඹ දිව්‍ය ස්ත්‍රියක් මෙන් සලකන මාර්ගරට් දැකීමෙන් මගේ සිතෙහි කිසි වෙනසක් ඇති නොවී ය. නුඹ කියන අන්දමේ ලක්ෂණය කියා යම් ගුණයක් ඇ කෙරෙහි පිහිටා තිබේ නම් මගේ විනිශ්චයත් නුඹේ විනිශ්චයට සමාන විය යුතුයි. උපන් හැටියේ ළදරුවෙක් ස්පර්ශ කිරීමට පවා අන්‍යයන් කැමැති නොවන නමුත් මව් පියන් දෙදෙනාට ඒ තරම් වටිනා වස්තුවක් නොමැතියි. යම් දෙයක් නිසා අපේ සිතෙහි ඇතිවන විනිශ්චය මිස ඒ දෙයෙහි ලක්ෂණය, අවලක්ෂණය, කියා ගුණයක් පරමාර්ථයෙන් නොමැතියි. මේ විනිශ්චය මූලාධාර වන්නේ අපේ සිතෙහි ස්වභාව, පුරුද්ද, ඉගෙනීම, යනාදියයි. මේවා වෙනස් වෙනවාත් සමගම විනිශ්චයද වෙනස් වේ. කලකදී අප හොඳය යහපත්ය කියා සලකන ලද දෙයක් සම්බන්ධව කලකදී ඒ දෙයෙහි කිසි වෙනසක් නැතිවම අපේ විනිශ්චය වෙනස් විය හැකියි. බාහිර දේවලට පමණක් නොව ගුණධර්මයන් සම්බන්ධවත් මෙය මෙසේමයි. ඒවායේ වටිනාකමත් ඒවා නිසා අපේ සිතෙහි ඇතිවන විනිශ්චයයි.

ඉතින් මේ අන්දමට බලන කල නුඹ සැප විඳීමට ගමන් කරන මාර්ග යහපත්ය කියා නුඹ කල්පනා කරනවා. මා ගමන් කරන මාර්ගයත් හොඳය, යහපත්ය, කියා මම කල්පනා කරනවා. නමුත් නුඹේ අදහස් අනුව ක්‍රියා කිරීමෙන් සැපවිඳින්ට පුළුවන්දැයි කල්පනා කර බලමු: - යහළුවන් වැඩිකර ගැනීම, වස්තු රැස්කිරීම ලුලු දූලු තරුණියන් සමග ආශ්‍රය කිරීම, යනාදියෙන් සැප විඳින්ට පුළුවන කියා නුඹ සිතනවා. බාහිර දේවලට අපේ ආශාවල් වැඩි දියුණු කර ගැනීම සැපතක් ද? මෙයින් අපේ ආශාවල් දරුණු අතට හැරෙන්නේ නැද්ද? අපේ ආශාවල් දරුණුව තිබීම සිතට මහත් වූ කරදරයක් නොවන්-නේ ද? බාහිර දේගැන අපේ ආශාවල් දරුණු වෙන්නාක් මෙන්ම විපතක් පැමිණි විටත් ප්‍රමාණය ඉක්මවා දුක් වෙන්ට සිදුවෙනවා නොවේ ද? මෙසේ වූ කල අපට සැප විඳිනවාට වඩා දුක් විඳින්ට සිදුවෙන්නේ නැද්ද? අපේ ආශාවල් දරුණු වෙන්ට හෝ ඕනෑවට වඩා යටපත් වෙන්ට හැර නොසැලකිලි-වන්තව සිටීමෙන් අපට සැප විඳිය නොහැකියි. සැප විඳින්ට අපේ ආශාවල් මධ්‍යස්ථව මෘදුව තිබිය යුතුයි. පොත්පත් කියැවීමට, ශාස්ත්‍ර ඉගෙනීමට, අපේ ආශාව වැඩිදියුණු කරගැනීම වස්තුව ආදිය බාහිර දේවලට ආශාව වර්ධනය කරගන්නවාට වඩා සහස්‍රවාරයක් උතුම් වේ. ඉගෙනීමට අපේ ආශාව වැඩි කරගැනීමෙන් බාහිර දේ ගැන අපේ ඇති ආශාවල් මෘදුව මධ්‍යස්තව තබාගැනීමට පුළුවන් වේ. ධර්මිෂ්ට ජීවිතයක් ගත කරන කෙනෙක් ආදර්ශ කරගෙන නුඹේ චරිතය මොන මොන කාරණාවලින් ඔහුගේ චරිතයට වෙනස්ව තිබෙනවා ද කියා පරීක්ෂා කොට ඒ වැරදි හරිගස්සාගන්ට උත්සාහ කරනවා නම් ටික කලකින් නුඹේ වැරදි හරිගස්සා-ගන්ට පුළුවන් වෙනවා ඇති."

මෙහිදී වැඩකරුවෙක් ලියුම් දෙකක් ගෙනැවිත් ඇල්බට්ට භාරදී ගියේ ය.

ඇල්බට් පිළිවෙළින් ලියුම් දෙක කඩා බැලුවේ ය. එක ලියමනක් ලීලාගෙන් සහ අනික අවුරුදු අටක් පමණ වයස් වූ විමලා නම් ඔහුගේ කුඩා සහෝදරිය විසින් එවන ලද්දක් විය.

විමලාගේ ලියමන කියවමින් ඇල්බට් සිනාසෙන්ට පටන් ගත්තේ ය.

"ඇල්බට් අයියා ලබන සුමානේ ගමට එනවිට මට ඉස්කෝලේ යනවිට අඳින්ට ගවුම් තුන හතරක් මහගන්ට රෙදි අරගෙන එන්න. ඇම් අක්කාට කීවාට ගවුම් මහලා දෙන්නේ නැහැ. තියෙන ගවුම් ඇත කියනවා.

"ඇම් අක්කලා කථාකරා, හොඳවායින් සැන්ට් බෝතල-යකුත් සබන් පෙට්ටි දෙකක් තුනකුත් ගේන්ට කියා ඇල්බට්ට ලියන්ට ඕනෑය කියා, ඒගොල්ලෝ ලීවාට සැන්ට් ගේන්ට එපා. ගාල්ලෙන් ගෙන්වාගෙන සැන්ට් බෝතල තුනක් තිබෙනවා. ඒවා සුවඳ නැත කියලා තමයි ආයිත් වෙනින් ගෙන්වාගන්ට හදන්නේ.

"රෙදි වගයක් ගෙන්වාගන්ට ඕනෑය කියා ලීලා මෙහේ ආගෝන්දී කථා කරා, ළඟදී කොළඹ යන කෙනෙක් ඉන්නවා නම් ගෙන්වාගන්ට පුළුවන කියා, මම ඇහුවා ඇල්බට් අයියාට ලියා යවන්ට ද කියා, ලීලා එපාය කීවා.

"ඇල්බට් අයියා අපට වුණු වැඩක් දන්නවා ද?"

අපේ ස්කෝලයේ ගැණු ළමයි සියලුදෙනාම රජ්ජුරුවෝ උපන් දවසේදි ගාල්ලට ගියා. හවස ගමට එන්ට ඇවිත් අපි පහළොස් දෙනෙක් පමණ දෙවෙනි ක්ලැසියේ කාමරයකට නැග්ගා. අල්ලපු පෙට්ටියේ හිටපු මිනිස්සු නිකටේ අල්ල තියාගෙන හිටියා, කව්දෝ කීවා හරියට මීවදේට මීමැස්සෝ වැහුවා වගේය කියා. අපි රෙයිල් පෙට්ටියට නැගලා වට පිට බැලුවිට කොනක කව්දෝ මිනිහෙක් නිදාගෙන හිටියා, හිස්වැස්මක් ඒ මිනිහා ළඟ තිබුණ නිසා යාපනේ දෙමළ මිනිහෙක් වෙන්ට ඇතැයි සිතා මැග්ලින් කීවා "අපි මූ අල්ලා රෙයිල් පෙට්ටියෙන් පල්ලෙහාට දාමුය" කියා. එතකොට නැන්සි කීවා "බිංගේ කිට්ටු වුණාම ඔකා උහාලා දාමුය අපට තනියම කථාකරකර යන්ට ලැබුණේ නැත කියා." මැග්ලින් ඒ මිනිහාගේ හිස් වැස්ම ඇරගෙන අල්පෙන්ති කටුවක් ගහලා තිබ්බා. බිංගේ කිට්ටුවෙනකොට ඒ මිනිහා එකපාරටම නැගිටලා ඔලුවේ හිස් වැස්ම දාගත්විට අල්පෙන්ත ඔලුවේ ඇනුණා. ඒ මිනිහා අපට බණීවිය කියා අපි බයේ හිටියා. ඒ මිනිහා හිනාවෙවී ඔලුව අතගගා "ළමයි බිංගේ කිට්ටු වෙනකොට මාව උහාලා රෙයිල්ලුවෙන් පල්ලේ අහකට දාන්ට කථාකරා නෙව, දැන් ඒකට වෙලාව හොඳය" කියා කීවා. අපට හිනානොවී ඉන්ට බැරිවුණා. පස්සේ අපි යාපනේ දෙමළ මිනිහෙක් කියා හිතා කථාකර බව කියා තරහවෙන්ට එපාය කීවා. මම නම් මොකුත් කරේ නැහැ."

ඇල්බට් ලීලාගේ ලියමනට පිළිතුරු ලියා වැඩකරුවෙකු අත තැපැලට යැව්වේ ය.



# 6 පරිච්ඡේදය

රත්නවීර නොතාරිස් තැනගේ බෑනා කෙනෙක් වූ ගිල්බට්ගේ පැමිණීම සිරිනිවසෙහි සියලුදෙනාගේම පුදුමයට සහ ප්‍රීතියට කාරණයක් විය. විශාල මුදලයක් අයිති වී සිටින ගිල්බට් රත්නවීර නොතාරිස් තැනගේ ඇවැස්ස බෑනා කෙනෙකි. ඔහු බාල කාලයේ පටන් සිරිනිවසට යමින් එමින් සිටියේ ය. නමුත් පියාගේ මරණයෙන් පසු ඔහු හෙනරත්ගොඩ ඔහුගේ පියාට අයිති විශාල වත්තක් බලාගැනීමට ගියේ ය. ගිල්බට් එහි ගොස් අවුරුදු පහක් පමණ සිට ස්වකීය ග්‍රාමයට ආ දවස අද විය.

ගිල්බට් හෙනරත්ගොඩ ගොස් අවුරුදු පහක් පමණ කාලය ගතවෙනතුරුත් ඔවුන් ගැන කිසිත් කල්පනා නොකර සිටි බැවින් රත්නවීර නොතාරිස්ගේ හිතෙහි ඔහු ගැන තිබුණු බලාපොරොත්තු සියල්ලම යටපත්වී තුබුණේ ය. නමුත් ඔහුගේ මේ ගමන නැවතත් පෙර අදහස් අලුත්වෙන්ට කාරණාවිය.

"ආ ගිල්බට් නුඹේ පැමිණීම අපට මහත් පුදුමයකි. නුඹ අපව මතක නැති කරලා වෙන්ට ඇතැයි සිතාගෙන සිටියෙමි" යි රත්නවීර නොතාරිස් තැන කීවේ ය.

"එසේ කල්පන කරන්ට හේතුව කුමක්ද'යි ගිල්බට් ඇසුවේ ය.

"පියාගේ මරණයෙන් පසු නුඹ හෙනරත්ගොඩ වත්තේ නැවතීමට ගොස් අවුරුදු පහක් පමණ වෙනවා. නුඹ එහි ගිය දවස් වලම අපට ලියමනක් දෙකක් එවා තිබුණා. ඊට පසුව නුඹෙන් ලියමනක්වත් ලැබුණේ නැහැ. නුඹේ මැණියන්ගෙනුත් විභාග කළාම නුඹෙන් ඉඳහිටලා ලියමනක් ලැබෙන බව කියා ඇත් නුඹ ගැන කනගාටු වූවා ය."

"වැඩපල ඉවරකොට එන්ට බලාපොරොත්තුව සිටි නිසා ලියුම් එව්වෙත් නැහැ. නුමුත් බොහෝ කාලයක් යනතුරු ඒ වැඩපල පිළිවෙලක් කරගන්ට බැරිවුණා."

මෙහිදී වැඩ කරුවෙක් විත් තේවතුර ලෑස්ති බැව් කී බැවින් ඔව්හු කථාව නවත්වා එතැනින් නැගිට ගියෝ ය.

මෙතැන් සිට ගිල්බට් නිතර නිතර සිරිනිවසට යන්ට එන්ටත් ලීලා සමග කථාබස් කරන්ටත් පටන් ගත්තේ ය. මෙසේ මාස තුන හතරක් ගතවූණාට පසු ගිල්බට් කිහිප දවසක් ස්වකීය අදහස් ලීලා ඉදිරියෙහි ප්‍රකාශකරන්ට තැත් කළ නමුත් ඔහු ඊට අසමර්ථ විය. ඇ ඉදිරියට ගිය කළ ඔහුගේ පෙර ජීවිතයේ කරුණු එකිනෙකට සිතෙහි පැන නැගීමෙන් ඔහු තුළ ලජ්ජාව සහ භයද ඇතිවිය. දිනක් ලීලාට මගේ අදහස් දක්වන්ට ඕනැය' යි සිතටගෙන ගිල්බට් සිරි නිවසට යනවිට ලීලා පොතක් කියවමින් සිටියා ය.

"ලීලා නුඹ කියවන පොත මොකක්ද" යි ගිල්බට් කට කෙළවරකින් සිනාසෙමින් ඇසුවේ ය. ඇ ඊට කිසිත් නොකියා කියවමින් සිටි පොත ගිල්බට් අතට දුන්නා ය. ගිල්බට් පොත පෙරළුවිට 'Albert Wickremasekara' යන නම එහි ලියා තිබෙනවා දුටුවේ ය. ඔහුගේ සිතෙහි තිබුණ ප්‍රීතිය නැතිවූවාක්-මෙන් මුහුණෙහි වර්ණයද වෙනස්විය. ඔහු ටික වේලාවක් නිශ්ශබ්දව සිට ඇල්බට් ගැන කිසිත් නොදන්න-වාක්මෙන් 'නුඹට මේ පොත කොහොම ලැබුණාද' යි ප්‍රශ්න කළේ ය.

"ඇම්ගෙන් ඉල්ලාගත්තාය" යි ලීලා උත්තර දුන්නා ය.

"ඇම්! කවුද ඇම්ය කියන්නේ"

"ඇල්බට්ලයි අක්කා"

ගිල්බට් පොත වසා කෙළවරකින් අල්ලාගත් විට එහි තුළ තිබී ලියමනක් බිම වැටුණා දැක එය අතට ගත්තේ ය. ලීලා ටික වේලාවක් ඒ ගැන කිසිත් නොසලකා සිටි නමුත් පසුව "ඇල්බට් කොළඹ සිටිද්දී එව් ලියමන කියවා මම පොත අස්සේ රුවා තිබුවා නොවේ ද? ඊට පසුව ලියමන අරන් තියන්ට බැරිවිය, මා කළ මෝඩකමක හැටි" යනාදිය ඇට කල්පනා විය. ගිල්බට් හිස වන වනා ඇටත් ඇසෙනසේ ලියමන කියවන්ට පටන්ගත්තේ ය.'

"ලීලා,

අපේ පළාතේ මිනිසුන් ආගමය කියා අදහන සමහර ළාමක අදහස්වලට විරුද්ධව මා කථාකරන නිසා ඔවුන් මට පිස්සාය කියන





බවත්, ඊට නුඹ කනගාටු වන බවත්, අපේ මවුපියාදී මුතුන් මිත්තන් පිළිගන්නා ලද ඒ කරුණුවලට විරුද්ධ වීම ඔවුන්ට කරන බලවත් අපහාසයක්යයි කියන බවත් නුඹ ලියා තිබුණා. ආගමට කිසිසේත් උවමනා නැති ළාමක අදහස් නුඹත් විශ්වාස කරන බැවින් මෙසේ ලියා තිබෙනවා යයි සිතමි.

"යමකුගේ අදහස් වෙනස් වූ පලියට ඔහුට පිස්සෙක්ය කියන අය මොන අන්දමේ මිනිස්සුදැයි නුඹ කල්පනා කළේ නැද්ද? බෞද්ධයන් හෝ ක්‍රිස්තු භක්තිකයන් හෝ දස දෙනෙක් එකතුකොට ඔවුන්ගේ අදහස් කෙසේදැයි පරීක්ෂා කළොත් ඒ දසදෙනාගේ අදහස් එකාකාරයයි කිය හැකිද? ආගම් අදහන්ට ඔය ළාමක අදහස් විශ්වා කළ යුතු ද? ළාමක අදහස් පහකරන්ට පුළුවන් නම් ආගම්වාද උවමනා නොවේ.

"අපේ මවු පියාදීන් යමක් පිළිගත් පලියටම අප විසින් ද එය පිළිගත යුතු නොවේ. අපේ මුතුන් මිත්තන් පිළිගත් පළියට අපත් එය අපරීක්ෂාකාරීව පිළිගැනීම තදබල වරදක් බැව් ළදරුවෙකුට වුවත් තේරෙන කාරණයකි. 'ශාස්ත්‍රයට යුක්තියට හා නුවණට ගෝචර නොවනදේ පෙර පටන් පැවත ආවායයි එපමණක් සලකා පිළිගැනීම හරියයි කෙසේ කියහැකි ද? පුරාණ ඇත්තන් කරපු පලියටම යමක් හරි වෙන්ට බැරිබව සිහි ඇත්තෝ පිළිගනිත්.' පිතෘ දෙවතාවන්ට ගෞරවය විය යුත්තේ ඔවුන්ගේ වැරදි පස්සේ එල්ලී යාම නොව ඔවුන්ගේ වැරදි හරිගැස්සීම බැව් නුවණැත්තන්ට වැටහේ. අපේ මවු පියන්ට නැතිනම් ඊට පුරාණ ඇත්තන්ට යමක් වරදින්ට බැරි නැති බව ප්‍රාඥයෝ පිළිගනිත්.

"මව්පියන්ගේ නොහොත් ඊට ඉහතින් සිට පරම්පරාවේ එන එබඳු යම් වරදක් ආචීර්ණ කල්පිකව තමනුත් පිළිගැනීම අතිශයින් දෝෂාරොපනීය කර්තව්‍යයකි. එය තමන්ගේ මුළු පරම්පරාවටත් මහත් නින්දාවක් නොවේයයි කාට කියහැකි ද? කොටින්ම පරම්පරාවෙන් ආ වැරදි නොහොත් අශෝභන චාරිත්‍ර එසේම පිළිගෙන පැවැත්වීම පරම්පරාවට ගරුකිරීමක් නොවේ. එසේ පිළිගෙන පැවැත්වීමෙන් මතු මත්තෙහිවත් ඒ වැරදි නිසා මේ පරම්පරාවට ලැබිය යුතු නින්දාවෙන් (විපත්තියෙන්) ගැලවීමට මාර්ගයක් නොසැලසෙයි. අනික් අතට එසේ පිළිගන්ට ගියොත් මනුෂ්‍ය ජාතියේ දියුණුවක් කිසිකලෙකත් නොලැබෙයි. ලෝකය



Scanned with CamScanner

මනුෂ්‍ය වාසවීමෙදී ශිල්පයක් ශාස්ත්‍රයක් කිසිවක් තිබුණායයි කියන්
ඉඩක් නෑ. මේවා මනුෂ්‍යයන්ගේ උත්සාහයෙන් උපදවාගෙන
ක්‍රමයෙන් පරම්පරාවෙන් පරම්පරාව උසස්කරගත් බව සිතිය යුතුයි
ඉතින් අපේ මුල් මව්පියන්ගේ ක්‍රමයට උන්නා නම් අපේ දියුණුවක්
කෙසේ විය හැකි ද?"

"බැරි මුලු ලෝ සගනු - හුදු සුපිරිසුදුනුදු හොත
නොගත්තෙය ළ සුපුන්සඳ - අබිසරුවනෙ සමාහී"*

"ලෝකයෙහි වාසයකරන්නා වූ තනිකරම සියල්ලෙන් පිරිසිදු
වූවෝ නමුත් මුළු ලෝකයාගේම ඒකාකාරව සිත්ගැනීම බැරිම ය.

මෙය මෙසේනම් මා වැන්නෙකුට 'පිස්සා' ය කියා කථාකිරීම
පුදුමයක් ද?

"නුඹට නිවාඩු තිබෙන වේලාවට පුරාණ මනුෂ්‍යයන්ගේ
ඉතිහාසය කියවා තේරුම්ගන්ට කල්පනාකරනවා නම් මේ සම්බන්ධව
බොහෝ කරුණු ඉගෙන ගතහැකියි. නුඹලාගේ පක්ෂය ගැඹුරු
ශාස්ත්‍රාදිය ඉගෙනීමට ස්වභාවයෙන්ම වඩා සමර්ථ නොවන බැවින්
සිත සතුටුවීමටත්, ඥාන ශක්තිය වර්ධනය කර ගැනීමටත්, නුඹලා
තුළ පිහිටා තිබෙන ගුණධර්මයන් ශක්තිමත් කරගැනීමටත්, ඉතිහාසය
ඉගෙනීම ඉතා ප්‍රයෝජනවත් වේ. පුරාණ ලාංකිකයන්ගේ ඉතිහාසය
දැනගත් තරමින් සතුටු නොවිය යුතුයි. ලෝකයේ අන්‍ය ජාතීන්ගේ
ඉතිහාසයත් ද ඉගෙනගත යුතුයි. අපේ ඉතිහාසය කියවනවිට 'මේ
අපේ මුතුන් මිත්තන්ගේ ඉතිහාසය' යි කියා පක්ෂභාගී නොවී
විචාරණ බුද්ධියෙන් යුක්තව පරීක්ෂා සහිතව කියවිය යුතුයි."

ගිල්බට් ලියමන කියවා එය නැවත පොත අස්සේ රුවා ලීලා
අතට දී ටික වේලාවක් ඈ දෙස බලා සිට කට කෙළවරකින්
සිනාසෙමින් මෙසේ ප්‍රශ්න කළේ ය.

"ලීලා නුඹ ගාල්ලේ ඉංග්‍රීසි ස්කෝලේ බොහොම කල් ඉගෙන
ගත්තා ද?"

"වැඩි කාලයක් එහි ඉගෙනගන්ට ලැබුණේ නැහැ. එහි ඉගෙන
ගත් කාලය අවුරුදු තුනක් පමණ වෙන්ට ඇත කියා හිතෙනවාය"
යි ඈ උත්තර දුන්නා ය.

* කොවිල් විභාගය - මුව දෙව්දාවත





"බාල කාලයේදී මට වැඩිපුර ඉගෙනගන්ට බැරිවුණ එකේ පාඩුව පෙනෙන්නේ දැනුයි."

"ඉගෙනීමට ආශාව තිබේ නම් දැනුත් ඉගෙනගන්ට බැරි නැහැ."

"දැන් අපට මොන ඉගෙනගැනීමක් ද? අපේ හිත නිතරම - ඊට වැඩිය පොතක් පතක් බලන්ට නිවාඩු නැහැ."

"පොත් පත් කියවන්ට නිවාඩු නැත කියන්නේ ඇයි? පොත් පත් කියවා ඉගෙනගන්ට පුළුවන් පාඨශාලාවෙන් අහක්වුණාට පසුවයි."

"මම උගත් මිනිහෙක් වෙනවාට නුඹත් බොහොම සතුටුවා වාගෙයි" කියමින් ඇගෙන් මීට ලැබෙන උත්තරය ඇසීමට ඉතා ආශාවෙන් ගිල්බට් ඈ දෙස බලාසිටි නමුත් ඈ කිසිවක් කථා නොකර සිටියා ය.

"ලීලා නුඹෙන් ප්‍රශ්නයක් අහන්ට ඊට උත්තර දෙනවාදැ" යි ගිල්බට් නැවතත් ඇසුවේ ය.

"ප්‍රශ්නය කුමක්දැ" යි අසා ලීලා කල්පනා සහිත වූවා ය.

"ප්‍රශ්නය කියන්ට නුඹ ඊට උත්තර දෙනවා ද?"

"මම දන්නා දෙයක් ගැන නම් උත්තර දෙඤ්ඤා."

මෙහිදී ගිල්බට්ගේ සිතෙහි "ලීලා නුඹ මට ආදරය නොවන්නෙහි ද" යන අදහස කිහිපවිටක් ඇතිවූ නමුත් එය ඔහුගේ කටින් පිටවෙන්ට ප්‍රමාද විය.

මේ කිසිත් නොදත් ලීලා 'ප්‍රශ්නය කුමක්දැ' යි නැවතත් ඇසුවා ය.

"ලීලා නුඹ මට ආදරය නොවන්නෙහිදැයි" ඔහු වේගයෙන් අසමින් ඇගේ අත අල්වාගත්තේ ය. ඇගේ අත ඉතා වේගයෙන් චංචලවන බැව් ඔහුට හැඟුණි, ඇගේ නලළෙහි ඩහදිය පැන නැංගේ ය. මුහුණ මලානික විය. ඈ එකෙණෙහිම කථා කරන්ට උත්සාහ කළ නමුත් බැරි විය. මොහොතක් ගතවෙන්ට මත්තෙන් ඈ අත ඉවතට ගෙන කථා කරන්ට හදනවිට තරුණ රත්නවීර පැමිණ ගිල්බට්ට කථා කළේ ය. තරුණ රත්නවීර සහ ගිල්බට් ද සැමුවෙල් ලියන මහත්මයාලාගේ ගෙදර දෙසට ගියෝ ය. මේ දෙදෙනා එහි යනවිට ඇල්බට් සහ සොමී ද මල්වත්තේ හුදකලාව කථාබස් කරමින් සිටියෝ ය. ගිල්බට් සහ තරුණ රත්නවීරත් එන්ට ප්‍රථම සොමීගේ සහෝදරයෙක් වූ වික්ටර්ද එතන සිටි නුත් වෙන කටයුත්තක් ගැන



Scanned with CamScanner

එතනින් ඉවත්ව ගියේ ය. සොමි සහ ඇල්බට්ද කථාකරමින් සිටි නිසා වික්ටර් එතනින් ඉවත්ව ගිය බව හෝ ඔවුන් හුදෙකලාව සිටින බව හෝ කල්පනා නොවී ය. සොමි තරුණ රත්නවීර සමඟ විවාහ ගිවිසගෙන සිටි බැවින් ඇ ඇල්බට් සමග හුදකලාව සිනා සහිතව කථාකරමින් සිටිනවා දුටු රත්නවීර ඇ ගැන සැක කලේ ය. මේ දෙදෙනාගේ කථාව රත්නවීරට හොඳට නැසුණ නමුත් 'චාර්ලස්' කියා රත්නවීරගේ නම කියනවා ඔහුට හොඳින් ඇසුණේ ය. ඔහුගේ නම සඳහන් කරමින් කථාකරනවා ඇසීමෙන් රත්නවීරගේ සැකය වැඩිදුරටත් ස්ථිරකරගන්ට පුළුවන්වී ය. ඇල්බට් රත්නවීරගේ වැරදි කියා සොමි තමන් වෙතට හරවාගන්ට තැත්කරනවා යයි රත්නවීර කල්පනා කලේ ය. මෙයින් ඇල්බට් කෙරෙහි තරුණ රත්නවීරගේ සිතෙහි තද වෛරයක් හට ගත්තේ ය. ගිල්බට්ද මෙය තමනුත් ප්‍රයෝජන ගතයුතු ප්‍රස්තාවක් බැව් සලකා ඇල්බට් සහ සොමි සම්බන්ධව නොයෙක් බොරු කථා කියා රත්නවීරගේ සිතෙහි ඇති වූ ක්‍රෝධය ද්විගුණ කලේ ය.



# 7 පරිච්ඡේදය

කුරිරු    ගොර සපුන්ගේ දළගෙහි    විසය  
මදුරු    මැසි තැලන්ගේ තුඩගෙහි    විසය  
රුදුරු    නුහුසුවන්ගේ වලගෙහි    විසය  
නපුරු    දුදනන්ගෙ සියොළගෙහිම    විසය

-සුභාෂිතය

සැමුවෙල් ලියන මහත්මයාගේ වැඩිමහල් දියණිය වූ නැලීට දත්කැක්කුමක් සෑදී ඉංග්‍රීසි, සිංහල, ප්‍රතිකාර කරෙ වූ නමුත් ඒවායින් කිසිම සුවයක් නොලැබුණේ ය. මීට පසු බොහෝදෙනා එය "යක් ලෙඩක්" මෙන් සැලකුවෝ ය. යකදුරෝ ද මන්ත්‍ර බලෙන් නැලීගේ අසනීපය සුවකරන්ට පුළුවනැයි කීවෝ ය. සැමුවෙල් ලියන මහත්මයා තොවිල් නැටීම ආදිය ගැන විශ්වාස නොකළ නමුත් "මන්ත්‍ර ශාස්ත්‍රය" විශ්වාස කළ බැවින් නැලීගේ අසනීපය සුව කිරීම යකැදුරන්ට භාර කලේ ය. තොවිලය නටන දවස අද වූ බැවින් ඇල්බට්, ගිල්බට්, රත්නවීර ආදීහු ද තොවිල් බැලීමට පැමිණ සිටියෝ ය.

මෙදින මෙහි සිටි තුන් හතරදෙනෙක් හැර අනික් සියලු දෙනාම යක්ෂයන් ගැනත්, අවතාර ගැනත්, කථාකරන්ට වූහ. යකැදුරෙක් ඔහුට අවතාරයක් මුණගැසුණ හැටිත් මන්ත්‍ර බලෙන් ඒ භයානක අවතාරයෙන් බේරුණ හැටිත්, තවත් කෙනෙක් ඔහුට අවතාර මුණගැසුණ හැටිත්, 'ඉති පිසෝ' ගාථාව මතක් වූ ක්ෂණයෙහිම අවතාරය අන්තර්ධාන වූ සැටිත් කීවෝ ය. තවත් යකැදුරෙක් ඒ පලාතේ කෙනෙකුගෙන් තැඹිලි ගෙඩියක් ඉල්ලා නුදුන් නිසා ඔහුට කොඩිවින කළ සැටිත්, දූන් ඔහු පිස්සු වැටී සිටින සැටිත්, කීවේ ය.

මේවා අසාගෙන සිටි ඇල්බට්ට කථා නොකර සිටින්ට බැරි විය. ඔහු කථා කරම්දෝ නොකරම්දෝ කියා කල්පනා-කරමින් සිටින අතර 'අපේ ඇල්බට් මේවාට බොහොම විරුද්ධයයි' සැමුවෙල් ලියන මහත්මයා ඇල්බට් දෙස බලා සිනාසෙමින් කීවේ ය.

Scanned with CamScanner

"හැබෑ ද? එහෙනම් අපට මන්ත්‍රවල ලක්ෂණයක්, යක්කු ඉන්න බවත්, පෙන්වා දෙන්ට පුළුවනැ" යි එහි සිටි ප්‍රධාන යකැදුරා කීවේ ය.

"ඔව්, යන්ත්‍ර මන්ත්‍ර ගැනත් යකුන් ගැනත්, මගේ විශ්වාසයක් නැතැ" යි ඇල්බට් උත්තර දුන්නේ ය.

"හා! එහෙම කථාකරන්ට එපා! මෙහෙම කථාකරමින් සිටිද්දීම අන්තරාය පමුණුවන්ට පුළුවන් මන්ත්‍ර තිබෙනවා."

"හොඳයි මට දැන් එහෙම මන්ත්‍රයකින් අන්තරායක් කරමු."

"මහත්මයාට මොකුත් වුණොම අපට ඉංග්‍රීසි ආණ්ඩු-වෙන්වත් මහත්මයාලාගේ නෑදෑයින්ගෙන්වත් බේරෙන්න බැරිවෙනවා. හොඳයි මම වෙන වැඩකින් මන්ත්‍ර සැබෑ බව පෙන්නසද්සා" මෙසේ කියමින් ඔහු ඉදිරියෙහි තිබුණ කනප්පය ළඟට ගෙන ඊට කෙනෙක් අතගසාගෙන සිටින විට මන්ත්‍ර බලෙන් කනප්පය නටවන බව කීවේ ය.

පළමුකොටම ඇල්බට් කනප්පයට අත්දෙකම ගසාගෙන සිටින විට යකැදුරා දුම්මල මතුරමින් දුම් අල්ලන්ට පටන්ගත්තේ ය. බොහෝ වෙලා මැතුරූ නමුත් කනප්පය තිබුණ ස්ථානයේම තිබුණේ ය. යකැදුරා නැවත නැවතත් මතුරමින් කනප්පය නටවන්ට උත්සාහ කළ නමුත් බැරිවිය. මීට පසු ඇල්බට්ගේ ('කිල්ලට අසුවීම්' ආදි) යම් කිසි දොෂයක් තිබෙනවා වෙන්ට ඇතැයි කියා වෙන කෙනෙකුට අතගසාගෙන සිටින්ට නියම කළේ ය.

යකදුරා ටික වේලාවක් මතුරනවිට කනප්පය සෙල-වෙන්ට පටන්ගත්තේ ය. තව ටිකවේලාවක් මතුරනවිට කනප්පය ගමන් කරන්ට පටන්ගත්තේය. ඔහු කනප්පය මුදුනේ අත්දෙක තබා ගෙන සිටියේ ය. මෙය බලාගෙන සිටි සියල්ලෝම පුදුමවූහ. 'ඉතින්වත් මන්ත්‍ර විශ්වාසකරනවාද' යි අසමින් එහි සිටි බොහෝ දෙනා ඇල්බට්ට වචනයක්වත් කථාකරන්ට ඉඩ නුදුන්හ.

කනප්පය අතගසාගෙන සිටි අය කනප්පය ගමන් කෙරෙව්වේ නැත කියා විශ්වාස කළත් එය මන්ත්‍ර බලයකින් සිද්ධවුණාය කියා විශ්වාසකට යුතුද? නැහැ; කනප්පයට අතගසාගෙන සිටින අයට හැඟීමක් නැතුවම ඔහුගේ අත්දෙක චංචලවීමෙන් මෙය සිද්ධ විය හැකියි. 'motion of the table was solely due to the unconscious muscular action of the performers'*

* Dr. Eden Paul's "Psychical Research and Thought Transference."





කෙනෙක් අතගසාගෙන සිටින විට කනප්පය බොහෝ දුරගමන් කරවන නමුත් ඊට කිසිවෙක් අත නොගසා සිටින විට මැතිරීමෙන් යන්නම් සොලවන්ටවත් බැහැ! කිසි පරීක්ෂාවක් නැතිව මේවා මන්ත්‍ර බලයකින් සිද්ධ වෙනවායයි බොහෝ දෙනා විශ්වාස කරත්. "මේවා බලාසිටින්නන්ගේ පරමාර්ථය මේවා විශ්වාස කිරීම ය. මේවායේ සත්‍යාසත්‍යය සෙවීමට හෝ දැන ගැනීමට හෝ ඔවුන්ට සිතක් නොමැතියි. මෙබඳු අත්දමේ සිත් ඇත්තවුන්ට ශාස්ත්‍රයෙන් ප්‍රයෝජනයක් නොමැතියි. ඔවුන් ඉදිරියෙහි ශාස්ත්‍රය බල රහිතයි"* මේ ආදිය කල්පනා කොට ඇල්බට් වැඩිපුර යමක් කථා නොකළේ ය. සියලුදෙනාම අන්‍ය කාරණා ගැන කථාකරමින් කාලය ගතකොට ඔර්ලෝසුවේ ඒ දොළහ තට්ටුවුණාට පසු සමහරෙක් නැගිට යන්ට සූදානම් වූවෝ ය. එහෙත් සොමීට හදිසි අසනීපයක් හැදුණේයයි කලබලයක් ඇතිවීමෙන් කිසිවෙකුට යන්ට නොලැබුණේ ය. ස්වල්ප වේලාවකට පෙර හොඳ සනීපෙන් සිටි ඈට හැදුණ අසනීපය කිසිවකුට තේරුම්ගන්ට බැරිවිය. වහාම සිංහල වෙද්දු කීපදෙනෙක් සහ ඉංග්‍රීසි වෛද්‍යයෙක්ද ගෙන්වා ප්‍රතිකාර කෙරෙව් බැවින් ඈට ස්වල්පයක් සනීප ලැබුණේ ය. සොමීගේ හදිසි අසනීපය විෂ වර්ගයක් පානය කිරීමෙන් හැදී තිබෙනවායයි වෙද්දු ප්‍රකාශ-කළෝ ය.

දවස් දෙකකට පමණ පසුව සොමීට හොඳින් සුව ලැබුණේය. තේවතුර කෝප්පයක් බීමෙන් ඈට අසනීප වූ බැවී සොමී කියන තුරු කිසිවෙකුට ඒ සම්බන්ධව කිසිත් කල්පනා කරන්ට නොහැකි විය. "තේවතුර කෝප්පයට විෂ මිශ්‍රකර තිබෙන්නේ ඇල්බට්" යයි බොහෝදෙනා කල්පනා කළෝ ය. එදින ඇල්බට් බීමට ගෙනැවිත් දුන් තේවතුර කෝප්පය නොබී ඇල්වතුර වීදුරුවක් ගෙන්වා ගෙන බීලා තේවතුර කෝප්පය තරුණ රත්නවීරට දුන් බවත් රත්නවීරට ඒ වේලාවට තේවතුර උවමනා නැත කියා තේ කෝප්පය මේසය උඩ තබා තිබුණ බවත්, ඊට පසුව තේ කෝප්පය සොමී බීලා අසනීප වූ සැටිත් කල්පනා කිරීමෙන් ඇල්බට් ගැන ඇතිවූ සැකය වැඩිදුරටත් ස්ථිර කරගන්ට පුළුවන් විය.

ඇල්බට් තරුණ රත්නවීරට වසදී අන්තරාය කොට සොමී ඔහුගේ වසඟයට ගන්නා අදහසින් තේවතුර කෝප්පයට විෂ මිශ්‍ර කළේයයි ද කාරණා වෙනස්වීමෙන් සොමී ඒ තේ වතුර කෝප්පය බීවේයයි තරුණ රත්නවීර කීවේ ය. මෙතැන් සිට ඒ පළාතේ

* Professor Tyndall's "Lectures and Essays"

පොහොසත් වැදගත් සියලු දෙනාම ඇල්බට් භයානක නපුරු
මිනිහෙක් මෙන් සලකන්ට වූහ. ඔහුට දෙවියකුට මෙන් සලකමි
සිටි අමාරුවට පත් අසරණ ජනයා පවා ඔහු ගැන සැක කළෝ
ඔහුට සිදුවේගන එන අවනම්බුවෙන් බේරෙන්ට ඇල්බට් බොහෝ
වීර්ය කළ නුමුත් බැරිවිය. ඔහුගේ සියලුම බලාපොරොත්තු නැති
වේගන එන බැව් ඔහුට දැනුණි. ලීලාට බඳින ලද ආදරය නිසා
ඇල්බට්ගේ හෘදයාභ්‍යන්තරයෙහි සැඟවී තිබුණ ප්‍රීතිය ද නැති වෙන්
යන බවත් හැඟුණි. මේ පළාතේ සිටීමෙන් තව තවත් අවනම්බු
විඳින්ට සිදුවෙන බැව් කල්පනා කොට ඇල්බට් ඒ පළාතෙන් ඉවත්
යන්ට කල්පනා කරගත්තේ ය. ඔහුගේ නෑ මිත්‍රාදීහු ද ඔහු අත්හැ
දැමුවෝය. මේ සියල්ලටම හේතුව ඔහුගේ නිදහස් කථාවත් ක්‍රියාවත්
බැව් දැනුණි. ඇල්බට් හතර පස් දවසක් යනතුරුම දුකින් කාල
ගතකොට කිසිවෙකුට නොදන්වා ඒ පළාතෙන් ඉවත්ව ගියේ ය.

ඇල්බට් පිළිබඳ මේ ප්‍රවෘත්තිය ලීලාට ඉවසිය නොහැකි
පහරක් විය. ඇගේ ජීවිතයෙන් ප්‍රයෝජනයක් නැතැයි ඈ කල්පනා
කළා ය. "මම බාල කාලෙයේ පටන් ඔහු ආශ්‍රය කරගත් ඔහුගේ
තත්ත්වය දැනගන්ට බැරිවුණා නොවේද? නැහැ ඔහු හො
ඉගෙනීමක් ඇති ඍජු වූ යහපත් කෙනෙකි. ඔහු මෙබඳු නින්දි
අදහසකින් ක්‍රියා කළේයයි මට විශ්වාස කරන්ට බැහැ. නැහැ, එහෙ
කල්පනා කරන්නටත් බැහැ. කොයි කාරණයෙනුත් ඔප්පුවෙන්නේ
ඔහු මේ අපරාධය කරපු බවයි. ඔහු සිතේ එකක් සඟවාගෙන පිට
වෙන එකක් පෙන්වාගෙන ක්‍රියා කළා නම් මම දැනගන්නේ
කොහොම ද? අනේ! ඔහු මාව රැවටුවා නොවේ ද?ඔහු
ප්‍රයෝගකාරයෙක් ද? ඔව්, නැහැ. මෙසේ නොයෙක් අන්දමින්
කල්පනාකරමින් ලීලා දුක්වූවා ය.

ඇල්බට් කෙරෙහි ලීලාගේ සිතෙහි තිබුණ බලවත් ආදරය
නැති නොවී ය. ඔහු කෙරෙහි බඳින ලද ආදරය ඈට සිතින් ඉවත්
කරන්ට බැරි බව දැනුණි.

දිනක් ලීලා ගෘහයට නුදුරු පිට්ටනියේ ගසක් යට තිබුණ
බංකුවක වාඩි වී ඇගේ සිතෙහි ඇති වී තිබෙන බලවත් ශෝකය
තුනීකර ගැනීමට පොතක් කියවන්ට පටන්ගත්තාය. ඇගේ සිතිවිලි
සිතින් ඉවත් කොට පොත කියන්ට උත්සාහ කළ නමුත් බැරි විය.
පොත ඉවත තබා කල්පනා කරමින් ද, සුසුම් ලමින් ද, ඈ ඒ
වෘක්ෂය යට වාඩි වී සිටියාය. සූර්යයා අස්තංගතවී ඝනාන්ධකාරය
පැතිරෙන්ට පටන්ගත්තේ ය. මේඝකූටයන්ගෙන් අහස පිරී තිබුණ





බැවින් චන්ද්‍රාලෝකය ද වෙනදා මෙන් දීප්තිමත් නොවී ය.
සිතුවිල්ලෙහි යෙදී සිටි බැවින් ඈ හුදකලාව සිටින බව හෝ
අන්ධකාර වී තිබෙන බැව් හෝ කල්පනා නොවී ය. ඈ මෙසේ
කල්පනා කරමින් සිටින විට හදිස්සියෙන්ම ඇගේ හස්තයෙහි
සර්පයෙක් දවටුණාක් මෙන් දැනී ඈ කෑ ගසාගෙන ඉවතට පනින්ට
උත්සාහ කළ නුමුත් බැරි විය. ඇගේ හස්තය යකඩ දෙකකට
තදවුණාක් මෙන් සොලවන්ට නොහැකි වන අන්මට කවදෝ
අල්ලාගෙන සිටින බැව් දැනුනි. ඈ මූර්ච්ඡා වූවාක් මෙන් ටික
වේලාවක් භූමියෙහි පතිතව සිට නැවත හිස ඔසවා කෑගසන්ට
තැත් කළ විට ඇගේ අත අල්ලාගෙන සිටි අය වම් අතින්
පිස්තෝලයක් ගෙන ඇගේ මුහුණටම අල්ලා "ප්‍රාණයට ආදරේ
ඇත්නම් නිශ්චලව සිටිය යුතුය" යි රෞද්‍ර වන මෘගයෙකු සේ
ගොරවමින් කීවේ ය. ඔහු නේත්‍රයන්ද, නාසයද හැර අනික් සියලුම
ස්ථානයන් වැසෙන සේ මුහුණ වැස්මක් සහ කාලවර්ණ හිස්
වැස්මක් ද ඇඳ සිටියේ ය.

"ලීලා නුඹට මාව හඳුනන්ට බැරිද" යි ඔහු සෙමින් ඇසුවේ
ය. නුමුත් ලීලාගෙන් ඊට කිසිම උත්තරයක් නොලැබුණේ ය."

"මාව හඳුනන්ට බැරි ද? නුඹේ ආදරවන්ත ඇල්බට් මම.
මෙසේ වෙසධාරිව ආවේ අන්‍යයන් අඳුනන නිසාය" යි ඔහු නැවතත්
කීවේ ය. මේ වෙලාවේදී ලීලාගේ සිතෙහි ඇති වූ අදහස් විස්තර
කිරීම අපහසු වැඩකි. ඈ කථාකරන්ට ප්‍රථම "නුඹ මා සමඟ සැඟවී
යන්ට එනවා ද" යි ඔහු නැවතත් ඇසුවේ ය.

මේ වචන ඇසීමෙන් සැපින්නියෙකුගේ කෝපවූ ඈ
"සැඟවීයන්ට - " යන්න කියනවාත් සමඟම නැවත භීතියට පත්
ළදරුවෙකුසේ භූමියෙහි ඇද වැටුණා ය.

"හා! නුඹට බැරිනම් මට කමක් නැහැ. මට මෙහෙන් සැඟවී
යන්ට ඕනෑ. මම නුඹට දී තිබුණ මුද්ද දෙන්ට ඕනෑ. එය විකිණීමෙන්
මට මුදල් ටිකක් ගන්ට පුළුවනි"යි ඔහු භයානක අපරාධ කරුවෙකු
මෙන්ම සිනාසෙමින් කීවේ ය.

මේ වචන කණෙහි වැටෙනවාත් සමඟම ලීලා ඔහු විෂඝෝර
සර්පයෙකුමෙන් සලකා ඉවතට පැන ඇගේ නිදහස්ව තිබුණ
හස්තයෙන් මුහුන වසාගත්තා ය.

"ඉක්මන් කරපන්" යයි ඔහු නැවතත් කීවේ ය.

මේ වේලාවේදී ඇගේ සිතෙහි ඇතිවූ කෝපය සකල ශරීරයේම
පැතිර ගොස් වෙව්ලන්ට පටන් ගත්තා ය. ඇගේ ඇඟිල්ලේ තිබුණ



Scanned with CamScanner

මුදුව එහෙම ලද්දා විනිශ්චයකරුණ අදහසින් අත එසෙව් නමුත් ඇගේ සිතෙහි ආලය නැවතත් ලැහැගී හස්තය චංචලවීමෙන් මුදුව බිම වැටුණේ ය.

ඔහු මුදුව අතට ගෙන "දැන් නුඹෙන් මට කමක් නැහැ. මගේ භාර්යාව කොළඹ සිටිනවා. ළඟදීම ඈ මම නීතිප්‍රකාර විවාහකර ගන්නවා. මගෙන් නුඹට කිසි වරදක් වුණේ නැහැ. ඈ අත්හැර නුඹ විවාහ කරන්නට සිටි නමුත් ඒ සියල්ල නිෂ්ඵල විය. දැන් මට ඇගෙන් මිස නුඹෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ" යි කීවේ ය.

ලීලා කිසිත් කථානොකොට සිටියා ය.

"කිසිවෙකුට මේ බව නොදන්වන ලෙස පොරොන්දු වෙයන්" යයි ඔහු නැවතත් කීවේ ය.

"නැහැ, මම එහෙම පොරොන්දු වෙන්නේ නැහැ" යි ලීලා කීවා ය.

"ඔව් නුඹ එසේ පොරොන්දු වෙනට ඕනෑ"

"නැහැ, මම පොරොන්දු වෙන්නේ නැහැ"

"හොඳයි නුඹේ මව් පිය දෙදෙනා හිරිහැර විඳිනවාට සතුටු නම් කියාපන්. නුඹට එය පසුව දැනගන්ට ලැබේවි" යයි කියා ඔහු පළා ගියේ ය.

ලීලා එතැනින් නැඟිට වහා ගෙට දුවගොස් වැඩකාරියෙකු ලවා වතුර බේසමක් ගෙන්වා මුහුණකට සෝදාගෙන කිසිවෙකුට නොදන්වා ඇගේ කාමරයේ සයනයක හාන්සි වී ඈට සිදු වූ ප්‍රවෘත්තිය ගැන කල්පනා කරමින් හඬන්ට පටන්ගත්තා ය. "අනේ මා වගේ අවාසනාවන්ත ස්ත්‍රියක්, අනේ මට මේ මොන විපත්තියක් සිදුවුණා ද? ඔහු කෙතරම් නපුරු මිනිහෙක් ද? මට යන්තම්වත් ඒ බව කලින් දැනගන්ට බැරිවුණා නොවද? අහෝ! අද ඔහු කොපමණ කෑර අන්දමින් ක්‍රියාකළේ ද? ඔහුට කොළඹ භාර්යාවකුත් සිටිනවාය කීවා. අනේ! අනේ!"

"මොහු ඇල්බට් ද වෙනකෙනෙක්ද? ඇල්බට් නම් වෙසධාරීව එන්ට හේතුව කිම? ඔහු වෙසධාරීව ආවේ අන්‍යයන් අඳුනන නිසාය කීවා නොවේ ද? බොහෝ වේලාවක් ඈ හඬමින් සිට අද සිදු වූ ප්‍රවෘතිය කිසිවෙකුට නොදන්වා සිටින්ටත් ඇගේ කරදර සිතිවිලි ඉවතලා වෙනදා මෙන් ප්‍රීතියෙන් කාලය ගත කරන්ටත් සිතට ගත්තා ය.



# 8 පරිච්ඡේදය

To be the ruler of submissive Kings
Is nought to one who makes his earthly aim
To satisfy his father's every wan.

Naganandа*

සියප ණ    ලෙසින් කුළුණැති දෙගුරුන්ට    ම
කිසිදි න    තම සැපත සඳහා දුක් දී    ම
සොඳගුණ    නොවේ ඉන් දරුවන් මිය යත්    ම
සතති න    දෙගුරු සනසනු සුදන යුතු ක    ම

මාස තුන හතරක් පමණ ගත වූ නමුත් ඇල්බට් පිළිබඳව කිසිම ප්‍රවෘත්තියක් දැනගන්ට නොලැබුණේ ය. ලීලාට ද ඇගේ ප්‍රවෘත්තිය කිසිවෙකුට නොදන්වා සිටීම මහත් හිරිහැරයක් විය. මේ අතරතුරේදී ඇගේ සහෝදර තරුණ රත්නවීර හදිසි අසනීපයක් සැදී මළේ ය. මෙය ඇගේ කණගාටුව වැඩිවෙන්ට හේතු විය. මාස ගණනක් ගත වූ නමුත් ලීලාට ඇගේ සිතෙහි ඇතිවී තිබුණ කරදර රාශිය නැති කරගන්ට නොහැකි විය.

ලීලාගේ මව් පිය දෙදෙනා ඈ ගිල්බට්ට විවාහ කරදීමට ඔවුන් තුළ පෙර පටන් තිබුණ අදහස සම්පූර්ණ කිරීමට කටයුතු සූදානම් කරන්ට පටන්ගත්හ. ඔවුන්ගේ ඇවැස්ස බෑණා කෙනෙක් වූ ගිල්බට් විශාල මුදලයක් අයිතිව සිටින කෙනෙකි. ලීලාගේ මව් පිය දෙදෙනා කිහිප දවසක් ගිල්බට් සම්බන්ධව ඈ සමග කථා කළ නමුත් ඈ ඊට කිසිම උත්තරයක් නුදුන්නී ය. මෙසේ කල්ගත වීමෙන් ඇල්බට්

* A Buddhist Drama, by Sri Harsha Deva.

Scanned with CamScanner

ගැන ඇගේ සිතෙහි ඇති වී තිබුණ ආදරය යටපත් වී තිබුණේ ය. ඇ පළමු අවිවාහකව සිට මියයන්ට කල්පනාකරගෙන සිටි නුමුත් ඒ අදහස් වෙනස් කරන්ට සිදුවේගන එන බැව් දැනුණි. ඇගේ මව් පිය දෙදෙනාගේ සිත් සතුටු වෙන්ටත්, කාරණා තිබෙන අන්දමටත්, ගිල්බට් ගැන ඇ කැමැති විය යුතු යයි කල්පනා කළාය. එහෙත් ගිල්බට් කෙරෙහි ඇගේ සිතෙහි ආලයක් ඇති කරගන්ට බැරි බව දැනුණේ ය. ආලය ගැන කල්පනා කරන කල ඇගේ සිතෙහි ඇල්බට්ට බඳින ලද ආලයම උද්ගත වන්නේ ය. කරුණු සිදුවී තිබෙන ආකාරයෙන් අසත් පුරුෂයෙක් යයි සිතිය යුතු ඇල්බට් කෙරෙහි ඇ පිළිකුල් කරද්දීත් ඇගේ චිත්තා-භ්‍යන්තරයෙහි ඔහු ගැන රහස් ප්‍රීතියක් ඇතිවීම ඇට තේරුම්ගන්ට නුපුළුවන් විය. මෙය ඇගේ ජීවිතය තිබෙන තුරු වෙනස් කරගන්ට බැරි බවත් දැනුණි.

''අනේ! ලීලා අපේ සිතට දුක් නොදී නුඹ ගිල්බට් සමඟ විවාහවෙන්ට කැමැතිවෙයන්'' යයි ඇගේ මවගේ නිතර නිතර කියන වචන අසාගෙන සිටීම ඇගේ හෘදය පැළී යන තරම් දුක් ඇති කාරණයක් නිසා ඇ ගිල්බට් සමඟ විවාහ වීමට කැමැත්ත දුන්නා ය.

ලීලාගේ මව් පිය දෙදෙනා ගිල්බට්ට මේ ප්‍රවෘත්තිය දැන්වූහ. මේ ප්‍රවෘත්තිය ඇසූ ගිල්බට් ඔහුගේ අභිමතාර්ථය සම්පූර්ණ වේගන එන බැව් කල්පනාකොට අතිශයින් ප්‍රීති වූයේ ය. ගිල්බට් සිරිනිවෙසට නිතර නිතර ගිය නුමුත් ඔහු ආලය සම්බන්ධව ලීලා සමඟ කිසිත් කථා නොකෙළේ ය. ඒ ගැන කථාකරන්ට ගියොත් ඔහු ගැන ඇ සැක සිතායයි කල්පනා වූ බැවිනි. මේ ප්‍රවෘත්තිය ඇසීමෙන් ඔහුගේ සිතෙහි ධෛර්යයක් ඇති වූ නිසා ඇට ඔහුගේ අදහස් දන්වන්ට සිතට ගත්තේ ය.

දිනක් ලීලා හුදෙකලාව ඉස්තෝප්පුවේ වාඩිවී සිටින අතර ඇ සමඟ කථා කිරීමට ගිල්බට්ට ප්‍රස්ථාව ලැබුණේ ය. ඔහු ඇ සමඟ අන්‍ය කාරණා ගැන කථාකරමින් සිට 'ලීලා මම මෙහි නිතර නිතර එන නමුත් නුඹෙන් එක දවසකවත් කරුණාවන්ත වචනයක් අහන්ට ලැබුණේ නැතැ'යි කීවේය.

''නැහැ, මම නුඹට කිසි දවසක අකරුණාවන්තව කථා කළේ නැහැ'' යි ඇ උත්තර දුන්නා ය.





''නුඹ අකරුණාවන්තව කථා කළේ නැහැ, නුමුත්-නුඹ මා සමඟ අසතුටෙන් සිටිනවායයි මම කල්පනා කරගෙන සිටියා.''

''නුඹ සමඟ මගේ අසතුටක් නැහැ, නමුත්-'' කියා 'නුඹ ගැන සතුටකුත් නැහැ' යන වචන පමණක් කටින් පිටවෙන්ට නැර ඇ යටපත්කර ගත්තා ය.

''එහෙනම් නුඹේ සිතෙහි අසතුටක් නැද්ද'' යි ගිල්බට් නැවතත් ඇසුවේ ය.

''නෑ - නෑ -''

''ලීලා නුඹ 'ඔව් නැහැ' යන වචනවලට වැඩි යමක් කථා නොකරන්නේ මන්ද'' යි ගිල්බට් සිනාසෙමින් ඇසුවේ ය. ඇට මෙයින් ඔහුගේ අදහස් තේරෙන්ට ඇතැයි කල්තා කළේ ය. මීට කුමක් කියනවාදැයි ඇට ඉක්මනින් නිශ්චය කරගන්ට නොහැකි විය. ගිල්බට් ඇ කථාකරන තුරු නොසිට ''ලීලා මට නැන්දාගෙන් ප්‍රීතිජනක ආරංචියක් දැනගන්ට ලැබුණා. ඇත්තටම නුඹ ඊට කැමැතිද'' යි ඇසුවේ ය.

මේ ප්‍රශ්නය ලීලාගේ කණෙහි වැටෙනවාත් සමඟම ඇල්බට් කෙරෙහි බඳින ලද ආදරය ඇගේ සිතෙහි නැවත්ත පැනනැංගේ ය. ඇල්බට්ගේ රූපය ඇ ඉදිරියෙහි තිබෙන්නාක්මෙන් පෙනී භය වී ඇ ඔහු සමඟ කථාකරන්ට තැත් කරන්නක් මෙන් දෙතොල ඒකාබද්ධ කරගත්තා ය. ඇගේ සිතෙහි ඇතිවූ ක්ෂණික ප්‍රීතිය හා ක්ෂණික දුක පිළිවෙලින් සකල ශරීරයෙහි පැතිරගියේ ය. ඇල්බට් කෙරෙහි ඇගේ සිතෙහි පළමු ඇති වූ ආදරය ඉවත්කරගැනීම ඇට කළ නොහැකි වැඩක් බැව් දැනුණේ ය.

''ගිල්බට්ට මම සැබෑවටම ආදරේද'' යි ඇම ප්‍රශ්න කර ගත්තා ය. ගිල්බට්ට ඇගේ සිතෙහි ආදරයක් නැති බැව් දැනුණි. ගිල්බට්ට කෙසේ උත්තර දෙනවාද යන්න නිශ්චයකර ගැනීම ඇට ඉතා අමාරු කාරණයක් විය. ඇගේ සිතෙහි ඔහුට ආදරයක් නැති නිසා 'ඔව්' කියා උත්තර දීමත් කළ නොහැකි වැඩකි. ඔහුට ආදරය නොවීමටත් ඇට කරුණක් නොමැතියි. ඇල්බට් ගැන බලාපොරොත්තු වීමත් පිස්සු ක්‍රියාවක් මෙන් සිතිය යුතුව පෙනුණේ ය. මෙසේ නොයෙක් ආකාරයෙන් කල්පනා කරමින් සිටි බැවින් ලීලාගේ උත්තරය ප්‍රමාද විය. නුමුත් ඇ නිශ්ශබ්දව සිටින්නේ කැමැති නිසායයි ගිල්බට්



Scanned with CamScanner

කල්පනා කළේය. මෙහිදී ලීලාගේ මැණියන් ඔවුන් සිටි ස්ථානයට ආ බැවින් කථාව නවත්වන්ට සිදුවිය.

ගිල්බට් ගියාට පසු ලීලා පසුතැවිලිවෙන්ට පටන්ගත්තා ය. ඈ තුළ ගිල්බට්ට ආදරයක් නැති නිසා ඔහුගේ ප්‍රශ්නයට 'නැහැ' කියා උත්තරදීමට ප්‍රමාද වුණ එක මෝඩකමක් මෙන් කල්පනා කළා ය. 'ලීලා නුඹ කළේ බලවත් වරදකි, දෙවනු පසුතැවිලි වෙන්ට සිදුවෙනවා ඇතැ'යි කෙනෙක් කණට කොඳුරනවාක් මෙන් හැඟී ඈ වට පිට බැලූ නුමුත් කිසිවෙක් නොසිටියේ ය. ඒ ඇගේ සිතෙහි ඇති වූ අදහසක් බැව් ඈට තේරුම්ගන්ට නොහැකි විය. ගිල්බට් සමඟ විවාහවෙන්ට කැමැති නැතැයි මැණියන්ට දන්වන්ට අදහස් වූ නමුත් නැවත ඒ අදහස යටපත්කරගනත්තා ය. ''මැණියන්ට නැවතත් හිරිහැර කරන්නේ කුමට ද'' යි ඈ කල්පනා කළා ය. ''මම නැවත ඔවුන්ට කරදර කරන්ටයාම ඉවසිය නොහැකි කරදර දුක් කණගාටු ඇතිවීමට හේතුවකි. මම කැමැත්ත දුන්නේත් මැණියන් නිසායි. නැවත මව්ගේ සිතෙහි ඇති වී තිබෙන සොම්නස නැති කළ යුතු නොවේ. ලීලාගේ සිතෙහි තිබෙන දුක් කනගාටු නිසා ඈ වැඩිකලක් ජීවත්වෙන්නේ නැතැයි ඈ කල්පනා කළා ය. ''මට කුමක් සිදුවුණත් කමක් නැහැ, මා නිසා මගේ ආදරණීය මව් පිය දෙදෙනාට හිරිහැර විඳින්ට ඉඩහැරීම යුතු නොවේ.''



# 9 පරිච්ඡේදය

(ශාස්ත්‍රයට) යුක්තියට නැති අඥාන කියුම් කියන්ට එපා!

- වාසනාවන්ත විවාහය.

ඇල්බට් කිසිවෙකුට නොදන්වා ගමින් ඉවත්ව ගිය දිනම ගාල්ලට ගොස් කොළඹට එන දුම්රියක නැග්ගේ ය. ඒ වෙලාවේදී එහු නැගුණ කාමරයේ මගීන් දෙතුන්දෙනෙකුට වඩා නොසිටි නුමුත් අම්බලන්ගොඩ පසුවන විට ඔහු සිටි කාමරය සහ ඊට යාව තිබුණ කාමරය ද මගීන්ගෙන් පිරීතිබුණේ ය. ඇල්බට්ගේ කාමරයේ උන් හත් අටදෙනා කථා කිරීමෙහි අති දක්ෂයෝ වූහ. පානදූරේ දුම්රිය නවත්වන ස්ථානයට පැමිණෙන තුරු ඇල්බට් හැර දුම්රථ කාමරයේ සිටි සියලුදෙනාම නොයෙක් දේ ගැන කථාකරමින් සිටියෝ ය. පානදූරේ දුම්රිය ස්ථානයෙදී මොවුන් සිටි රථකාමරයට පුදුම අන්දමේ මගීහු දෙදෙනෙක් ඇතුළු වූහ. මේ දෙදෙනා ඇතුළු වූ වහාම එහි සිටි සියලුදෙනාම නිශ්ශබ්දව කාමරයේ එක බංකුවක් සම්පූර්ණයෙන්ම ඒ දෙදෙනාට වාඩිවීමට ඉඩතබා අනික් ඉදිරිපිට තිබුණ බංකුවේ තෙරපි තෙරපි වාඩිගත්හ. ඊට යාව තිබුණ රථ කාමරයේ සිටි අය නැගිට මේ මගීන් දෙදෙනා දෙස ඉතා ඕනෑ කමින් බලා සිටියෝ ය. මේ දෙදෙනා කවරහුදැයි එහි සිටි කෙනෙකුගෙන් ඉතා සෙමින් ප්‍රශ්න කරනතුරු ඇල්බට්ට දැනගන්ට නොහැකි විය.

මින් එක්කෙනෙකුගේ නම 'විද්‍යෙශ්වර' විය. ඔහු ඉතා ප්‍රසිද්ධ න්‍යාය ශාස්ත්‍රඥයෙක් බැව් එහි සිටි සියලුදෙනාම දැන සිටියෝ ය. වයස අවුරුදු 66ක් පමණ වූ ඔහු කලිසමක් සහ ඊට උඩින් රෙද්දක් ඇඳ සිටියෝ ය. ඔහුගේ හිසෙහි මධ්‍යභාගයේ එකම කෙස්ගසකුදු නැතිව තට්ටය පෑදීතිබීම ඔහු නිතරම ගැඹුරු කල්පනාවෙහි යෙදී සිටින බැව් ප්‍රකාශ වස්නාවූ ලකුණක් විය. ඔහු වාඩි වූ විගස කකුල

Scanned with CamScanner

පිට කකුල තබා දකුණු අතේ ඇඟිලි දෙකෙන් නිකට කෙළවර අල්ලාගෙන ඇස්බැම දෙක උස්කර සිටීමෙන් ඹුහගේ නළල්තලෙහි ඇති වී තිබුණ රැළි හොඳින් පෙනුණේ ය. ලෝකය සහ සත්වයා සම්බන්ධවත් නොයෙක් ගැඹුරු ප්‍රශ්නාදිය ගැන නිතරම කල්පනාවෙහි යෙදී සිටින බැවින් ඇඳුම් පිසදමා ගැනීමට පවා කාලයක් නැතිබැව් ඔහු ඇඳ සිටි කෝට්එකේ ඇලී තිබුණ ධූවිලි රාශියෙන් පෙනුණි. මොහු සමඟ සිටි අනික් අය ඉතා ප්‍රසිද්ධ කාව්‍ය ශාස්ත්‍රඥයෙකි. ඹුහගේ නම ආචාර්ය කවීශ්වර විය. වයස අවුරුදු 45 කට වැඩි නොවී ය. රැවුල කොටකර කපා තිබුණේය, ඔහු සුරුට්ටුවක් බොමින් නිතරම රැවුල කරකවමින් සිටියේ ය. මේ ප්‍රසිද්ධ ශාස්ත්‍රඥයන් දෙදෙනා ගැන එහි සිටියවුන්ගෙන් කිසිවක් නොදන සිටියේ ඇල්බට් පමණයි. අනික් සියලු දෙනාම මේ ශාස්ත්‍රඥයන් දෙන්නා ගැන තොරතුරු දන්නා අය වූහ. මොවුන් මේ දෙදෙනාට ගරු බුහුමන් කරන ප්‍රමාණය ශබ්දකොට වචනයක් පවා කථා නොකර සිටීමෙන් ප්‍රකාශ විය. විනාඩි දහයක් දොළහක් යනතුරු එහි සිටි සියලුදෙනාම නිශ්ශබ්දව උන්හ. ආචාර්ය කවීශ්වර පළමුවෙන් කථාව ආරම්භ කළේ ය.

"දන් ලෝකයේ මනුෂ්‍යයෝ ඉහතට වඩා දියුණුව සිටිත්යයි කියන නුඹුත් මට නම් පිරිහීම මිස දියුණුවක් පෙනෙන්නේ නැහැ. දන් කාව්‍ය ශාස්ත්‍රය කොපමණ දුරට පිරිහී තිබෙනවා ද?"

මීට උත්තර දෙන මහලු ආචාර්යවරයා හිස සොලවා අත ඉවතටගෙන "ලෝකයේ මනුෂ්‍යයන් දූන් පිරිහෙන කාලය" යි කියමින් කථාකරන්ට පටන්ගත්තේ ය. "යන්ත්‍ර සූත්‍රාදිය වැඩිවෙන්නේ හොඳකට නොවේ. තව අවුරුදු 1000 ක් 2000 ක් යනවිට ආගම ද ධර්මය ද සියල්ලම නැතිවී ලෝකය අන්ධකාරවූවාක් මෙන් වෙනවා ඇති."

"මේ දූන් සිටින මනුෂ්‍යයෝ ඒ විනාශ කාලය වනවිට මීට වෙනස්වෙන්නෝද"යි ආචාර්ය කවීශ්වර ප්‍රශ්න කළේ ය.

"ඔව්" කියා උත්තරදී මහලු ආචාර්යවරයා ඒ සම්බන්ධව බොහෝ කාරණා දන්නා බැව් හඟවන්නාක් මෙන් කටපියාගෙන තොල්දෙක ඒකාබද්ධ කරගෙන සිටිනවා දුටු කවීශ්වර ඒ ගැන විස්තර කරන ලෙස කියා සිටියේ. "ඔව්" කියා නැවතත් මහලු ආචාර්යවරයා ටික වේලාවක් වටපිට බලා කථාකරන්ට පටන් ගත්තේ ය. "ක්‍රමයෙන් දූන් සිටින මනුෂ්‍යයන්ගේ ආයුෂ අඩුවේගන ගොස් මනුෂ්‍යයෙකුට





අවුරුදු පහකට වැඩිය ජීවත්වෙන්ට බැරි කාලයක් පැමිණෙනවා. ඒ කාලයේදී ලෝකයේ සියලු මනුෂ්‍යයන්ගේම වයස අන්තිම වැඩි ගණන අවුරුදු පහයි. මේ කාලය වනවිට මනුෂ්‍යයන්ගේ උස අඟල් දොළහකට වැඩි නොවේ. මනුෂ්‍යයෝ ඉතා නපුරුවිය. කෑම බීම සපයාගැනීමට අපහසුකම නිසා එකිනෙකා ඇනකොටාගන්ට පටන්ගන්නෝ ය. මීට පසු මහා වර්ෂාවක් හටගන්නේ ය. එක ජලබින්දුවක් පොල්ගෙඩියකට වඩා මහත්වේ. මේ ජලබින්දුවලට යටවීමෙන් ලෝකයේ උතුරු දෙස මනුෂ්‍යයන් හැර අනික් සියල්ලෝම තැලී මිය යන්නාහ."

රථකාමරයේ සිටි සියලුදෙනාම ආශ්වාස ප්‍රශ්වාස කිරීම නවත්වාගෙන කථාවට ඇහුම්කන්දීගෙන උන්හ.

"මේ මහා වර්ෂාව හත් අවුරුද්දක් නොකඩවා පවතිනවා. උතුරු දිසාවෙහි මනුෂ්‍යයන්ට වර්ෂාවෙන් අනතුරක් පැමිණෙන්නේ නැහැ. වර්ෂාවට පසුව ජීවත්වන්නෝ ඔවුන් පමණයි. නුමුත් තව අවුරුදු හතක් ගතවුණාට පසු ඔවුහු ද දා විනාශ වී යන්නාහ. ඒ කාලයේදී සූර්යයෝ තිදෙනෙක් නොහොත් ඊටත් වැඩි ගණනක් ඇතිවන්නාහ. එවිට මේ පෘථිවියේ එක්තරා ලෝහ වර්ගයක් වන්නේ ය. මනුෂ්‍යයෝ ලෝක වූ පෘථිවිය කන්ට පටන් ගන්නෝ ය. ක්‍රමයෙන් සූර්යයන්ගේ රශ්මිය වැඩිවීමෙන් පෘථිවිය රත්වී මනුෂ්‍යයන්ට සිටිය නොහැකිව එකාගේ ඇඟ උඩ එකා නගින්ට තැත්තරන්නාහ. මෙසේ කරමින් ඔවුන්ට වැඩි කලක් ජීවත් වෙන්ට ලැබෙන්නේ නැහැ. පෘථිවිය ගින්දර මෙන් රත්වීමෙන් ඔව්හු ද විනාශ වී යන්නාහ. මේවා සිද්ධ වන්නේ තව අවුරුදු තුන් හාර දාහකට පසුවයි. හෙට අනිද්දා සිද්ධ වෙන ඒවායයි සිතන්ට එපා" ය කියා කථාව අවසාන කොට මහලු ආචාර්ය තෙම නැවතත් නිකටෙහි අතගසාගෙන කල්පනාවෙහි යෙදුණේ ය.

"අපරදිග මිනිස්සු 'දූන් ලෝකයේ මනුෂ්‍යයෝ ඉහතට වඩා දියුණුව සිටිත්ය' කියනවා නොවේ ද? දූන් ඔවුන් අතැර ලෝකයේ කිසිම කලක නොතිබුණ ශාස්ත්‍ර දියුණුවක් ඇතිවී තිබේයයි ද කියෙත්. මොවුන්ගේ මේ කීම පිළිගන්ට පුළුවන්ද" යි ආචාර්ය කවීශ්වර නැවතත් ඇසුවේ ය.

විද්‍යෝශ්වර තෙමේ මොහුගේ මේ ළදරු ප්‍රශ්නයට කටට අත තබා සිනහ පහළ කොට "ඔව් මෑත කාලයේදී ශාස්ත්‍රය සම්බන්ධව ටිකක් දූනගත් පලියට අපරදිග මිනිස්සු පුරාණ මනුෂ්‍යයන්ට වඩා



Scanned with CamScanner

දියුණුයයි කියනවා. නුමුත් ඔවුන්ගේ කීම පිළිගන්නා තරම සිහි මද අය ලංකාවේ සිටිත් නම් ඒ ඉතා ටික දෙනෙකි. පුරාණ ජම්බුද්වීප වාසීහු ශාස්ත්‍රය නමැති රෝදය වටේ හත් අට වරක් ගමන් කළෝ ය. නමුත් වර්තමාන අපරදිග මිනිසුන්ට ශාස්ත්‍රය නමැති රෝදය වටේ අර්ධයක් දුර ගමන් කරන්ට තවමත් නොහැකි විය. ඔවුන්ට පුළුවන් දුර තමයි දන් ඔය ගමන්කර තිබෙන්නේ, ඔයිට වඩා දුර ඒ ගොල්ලන්ට ගමන්කරන්ට පුළුවනැයි මම නොසිතමි. පුරාණ මනුෂ්‍යයන් මෙන් දිව්‍යඥානය, අහසින් යෑම, ආදී ගම්භීර විද්‍යාවබෝධය දන් කාලයෙහි කිසිවෙකුට කළ නොහැකි වැඩකි. සුදු මිනිසුන්ට කිසිකලක මේවා අවබෝධ කරගන්ට පුළුවන් වෙන්නේ නැහැ. ඔවුන්ට සත්ව ශරීරය ගැන දනගැනීමට එය කපා කොටා බලන්ට ඕනැ. ඒත් හරියාකාර දනගන්ට බැරිව සිටිනවා. නුමුත් පුරාණ මනුෂ්‍යයන්ට සත්ව ශරීරය කපා කොට බලන්ට උවමනා නොවීය. ඔව්හු මාංස චක්ෂුස වසාගෙන ප්‍රඥා චක්ෂුසින් බලා සිතව ශරීරයේ සියුම් අවයවයන් ගැන විස්තර කරන්ට සමර්ථයෝ වූහ'' යි කීවේ ය.

මේ වෙලාවේදී දුම්රිය දෙහිවල ස්ටේසමට පැමිණුණේ ය. එහි දුම්රිය නවත්වනවාත් සමඟ මොවුන් සිටි කාමරයට නුදුරු රථ කාමරයක මගීන් කෝලාහලකරමින් කෑගසනවා ඇසුණේ ය. එහි සිටි කිහිපදෙනෙක් දුම්රියෙන් බැස කෝලාහාලය බැලීමට යනවා දුටු ඇල්බට්ද එහි ගියේය. එකෙණෙහිම දුම්රිය පිටත්වූ බැවින් ඇල්බට් නැවත හැරී තමන් සිටි කාමරයට එන්ට උත්සාහ නොකොට ඔහු ඉදිරියෙහි තිබුණ රථ කාමරයට නැගුණේ ය. කෝලාහාලය වෙන්ට හේතුව කුමක්දැයි පරීක්ෂා කළවිට ඔහුගේ පුදුමයට මෙන් එය දබරයක් නොව විවාදයක් බැව් දනගන්ට ලැබුණේ ය. මොවුන්ගේ විවාදය "ජාති ප්‍රතිසංස්කරණය'' ගැන විය. එහි සිටියවුන්ගෙන් එක් උගතෙක් ජාති ප්‍රතිසංස්කරණයට සිංහල තරුණයන් උඩුතොලේ රැවුල ගෑම අත්හැරිය යුතු බව ද, තවත් උගතෙක් පිටරටින් එන පිඟන් කෝප්ප ගැනීම අත්හැර ඒ වෙනුවට මෙරට සාදන මැටිවලන් ආදිය පාවිච්චි කළ යුතු බව ද, තවත් උගතෙක් සිංහලයන් විසින් කලිසම් කෝට් ඇඳීම අත්හැරිය යුතු බව ද, තවත් උගතෙක් පාඨශාලා සියල්ලම නැතිකරදමා ඉගැන්වීම පන්සල්වලට ඇරගෙන භික්ෂූන් වහන්සේලාට භාරදිය යුතු බව ද, කීවෝ ය. මෙසේ එක එක්කෙනාගේ අදහස් ස්ථිරකිරීමට කථාකරමින් ඔව්හු කෑගසන්ට පටන්ගත්හ.





කොටුවේ දුම්රිය නවත්වන ස්ථානය ආසන්න වූ බැවින් ඇල්බට්ට මොවුන්ගේ කථාව ගැන වැඩිදුර යමක් දනගන්ට නොලැබුණේ ය.

ඇල්බට් කිසිවෙකුට නොදන්වා ගමින් පිටත් වී ආ එක හොඳ නැතැයි ඔහු කල්පනා කළේ ය. ඔහු මෙසේ පළායෑම බියසුලු ගතියක් මෙන් සැලකුවොත් හොඳ නැතැයි සිතා නැවතත් ආපසු හැරී යන්ට කල්පනා කළේ ය.

"ආ! මම ආපසු හැරියන්නේ කුමටද'' යි ඔහු කල්පනා කළේ ය. "මම පුළුවන් පමණ වීර්ය කළා නොවේ ද? මම එහි සිටීම ලීලාගේ සිතෙහි දුක් වැඩිවීමට හේතුවකි. අහිංසක ලීලාට මා නිසා හිරිහැර විඳින්ට ඉඩහැරීම යුතු නැහැ. මම එහි නැවතී ක්‍රියා කිරීම ඇගේ දුක් වැඩිවීමට හේතුවක් බැව් දනගනත් මම ආපසු යන්නේ කුමට ද?''

ඔහු නිසා ලීලාට හිරිහැර විඳින්නට ඉඩ නොතැබිය යුතු බවත් ඉවසිල්ලෙන් ක්‍රියාකළ යුතු බවත් කල්පනාකොට ඇල්බට් සිත එකඟකර ගත්තේය. ඔහු මෙසේ කල්පනා කරමින් තමන් කොළඹ සිටිද්දී නැවතී සිටි කොටහේනේ විශ්‍රාම ශාලාව දෙසට ගමන් කළේ ය. මේ වේලාව සූර්යයා අස්තංගතවන්ට ආසන්නව තිබුණ බැවින් සන්ධ්‍යාලෝකය පැතිර තිබුණේ ය. අස්තංගතවන්නා වූ සූර්යයාගේ රක්තවර්ණ රශ්මි සමූහ ස්පර්ශයෙන් බස්නාහිර ආකාශයෙහි ඇතිවූ අලංකාරත්වය දුටු ඇල්බට්ගේ සිත ශ්‍රී රාහුල ස්වාමීන් වහන්සේගේ සැළලිහිණි සන්දේශයෙහි සන්ධ්‍යා වර්ණනාවක් ස්මරණය වීමෙන් පිනාගියේ ය.

"වදිමි ත් සවස තල හැසිරෙන දිගතු ව ලෙ
සොබමන් සුනිල් මිණි තිල් නුබතුරැ විපු ලෙ
පතස ත් අවරගිර නැටියෙන් වැටෙන ක ලෙ
විලිකු ත් සුරත් පල වැනිවේ රිවි මඬ ලෙ

මහතු ත් හසළ තමහට යස පිහිට ලෙ ස
නියති ත් නොහළ යුතු බව පැමිණෙන වෙහෙ ස
සුදන ත් පැවති සිරිතැයි දන්වන විල ස
නුබමි ත් සමඟ ගෙවුණෙය දහවල් දව ස

සැ දෑ ලෙන් වරුණ දෙව්රද මුහුද වී සු
සැ දෑ සහසකර එන මහවත සැල සු
වි දෑ උපුල් පිලමෙන් රත්පටින් වැ සු
සැ දෑ වලාපෙළ පැලදිගැ පෙනුණු සු''

ඇල්බට් ටිකක් දුර ගමන්කරනවිට මාර්ගාසන්න එක්තරා ගාහයක් ඉදිරිපිට මිදුලේ තරුණයෙක් හා තරුණියක් ද කථාකරමින් සිටිනවා දුටුවේ ය. යථොක්ත තරුණයා දුටුහැටියේම ඇල්බට් පුදුමවූවෙකු මෙන් ටික වේලාවක් කල්පනා රහිතව සිට හා! මේ කවුද? ගිල්බට් ඔහු මෙහි කුමක් කරනවා ද? ඔහු කවදා මෙහි ආවා ද? යන වචන සෙමින් කීවේ ය. ගිල්බට් හදිසියෙන්ම කොළඹ එන්ට හේතුව කුමක්දැයි ඇල්බට්ට තේරුම්ගන්ට නොහැකි විය. ගිල්බට් සමග කථාකරන්ට අදහස්කොට ඇල්බට් සෙමින් සෙමින් ඔවුන් සිටි ස්ථානයට ගමන් කළේ ය.

"නැලී නුඹ ඔයතරම් කනගාටුවෙන්නේ කුමට ද? මම දවසකින් දෙකකින් එන්ට පොරොන්දු වී ගිය නුමුත් බැරිවුණා" යයි ගිල්බට් කී වචන පළමුවෙන්ම ඇල්බට්ගේ කණෙහි වැටුණේ ය. මොවුන් වාඩිවී සිටි ස්ථානය මල්ගස් ආදී කුඩා වෘක්ෂයන්ගෙන් මුවහ වී තිබුණ බැවින්ද පිටිපා වාඩිවී සිටි බැවින් ද ඔව්හු ඇල්බට් නුදුටුවෝ ය. ගිල්බට්ගේ කථාව තේරුම්ගත නොහැකිව ඇල්බට් පුදුමයට පත්ව නැවත කල්පනා කළේ ය. මොවුන්ගේ කථාව අසන්ට ඇල්බට්ගේ සිතෙහි තද ආශාවක් ඇතිවිය. ගිල්බට් ගැන ඔහුගේ සිතෙහි සැකයක් නොතිබුණේ ය. නමුත් මොවුන්ගේ කථාවට කුමක් නිසා ඇහුම්කන්දෙන්ට සිතුණේ ද යනු ඇල්බට් තේරුම්ගන්නට නොහැකි විය. මොවුන්ගේ කථාව අසන්ට ඔහුගේ සිතේ ඇති වූ ආසාව මැඩපවත්වාගන්ට නොහැකි බැව් දනුණේ ය.

"ඔව් නුඹ මාව මෙහි සිටවා යද්දී දවසකින් දෙකකින් එනවාය කියා ගියා. නුඹ වුණු පොරොන්දුව මතක් වුණේ කීප දවසකට පසුවද" යි තරුණියට ඇසුවා ය.

"නැලී නුඹ කනගාටුවෙන්ට එපා. තව මාස හත අටකින් නුඹ අපේ ගමට එක්ක යනවා" යයි කියමින් ගිල්බට් ඇගේ අත අල්වාගත්තේ ය.

"තව මාස හත අටකින් නුඹ අපේ ගමට එක්ක යනවා" යයි කියමින් ගිල්බට් ඇගේ අත අල්වාගත්තේ ය.

"තව මාස හතඅටකින්! අනේ ගිල්බට් නුඹ මා තව දවසකින් දෙකකින් ගමට එක්ක යාවීය කියා හිතාගෙන සිටියා නුමුත් - තව මාස හත අටක්" කියමින් ඈ සුසුම් ලෑවා ය.





"ඔව් තව මාස හත අටක් ඉවසන්ට ඕනෑ. මගේ නෑදෑයින්ට තවම අපේ ප්‍රවෘත්තිය දැන්නුවේ නැහැ. ගම ටික කලක් නැවතී සිටගෙන ඒවා පිළිවෙළක් කරගෙන නුඹ දෙවනු එක්ක යනවා."

"මට මාස හත අටක් මෙහි නැවතී සිටින්ට බැහැ ගිල්බට්. නුඹ තව මාස හත අටක් මෙහි නවතින්ට කියන එක හරිද"යි කියමින් ඈ දුක්මුසු ලීලාවෙන් ගිල්බට් දෙස බැලුවා ය.

"නැලී නුඹ ඔය තරමට ඉක්මන්වෙන්නේ ඇයි. මම නුඹට තව හත් අට මාසයක් මෙහෙ නවතින්ට කීවේ නැහැ."

"බැහැ කොහේ නවතිනත් මට බැහැ. නුඹෙන් වෙන්ව මට හත් අට මාසයක් ඉන්න බැහැ" කියමින් ඈ හඬන්ට පටන් ගත්තා ය.

"ප්‍රේමවන්ත නැලී, ස්වල්ප කාලයකටවත් නුඹෙන් වෙන්ව ඉන්ට කැමැති නැහැ. නමුත් එසේ ඉන්ට සිදුවී තිබෙනවා. හෙට නුඹ මා සමග නැවත වේයන්ගොඩ යන්ට ඕනෑ. මම ගම තිබෙන වැඩපල පිළිවෙළක්කොට එනතුරු නුඹ එහි නැවතී සිටපන්."

මොවුන්ගේ කථාව අසාගෙන සිටි ඇල්බට් වඩ වඩාත් පුදුමයට පත්වුණේ ය. මේ දෙදෙනා කුමක් කරන්ට යනවාද යනු ඇල්බට්ට හොඳින් තේරුම්ගන්ට නොහැකි විය. තරුණිය වේයන්ගොඩ නවත්වා ගිල්බට් කලක් ගම නවතින්ට යන බැව් පමණක් ඔහුට තේරුම්ගන්ට පුළුවන් විය. මේ දෙදෙනා විවාහවෙලා ද එසේ නැතිව විවාහවෙන්ට සිටින ජෝඩුවක් ද යන්න නිශ්චයකර ගැනීමට ඇල්බට් බොහෝ උත්සාහ කළ නමුත් ඔහුට සම්පූර්ණ තීන්දුවක්ට පැමිණෙන්ට නොහැකිවිය. මොවුන්ගේ කථාවෙන් සහ ක්‍රියාවෙන් ද විවාහවී සිටින දෙදෙනෙක්යයි ටිකක් දුර කල්පනා කරන්ට පුළුවන් විය.

තරුණිය කිසිත් කථානොකොට සිටිනවා දුටු ගිල්බට් "මීට කැමැති නුණොත් අපි දෙන්නාටම හිරිහැර විඳින්නට සිදුවෙනවා" යි නැවතත් කීවේ ය.

"ගිල්බට්, මා නිසා නුඹ හිරිහැර විඳින්ට එපා. මම ඊට කොහෙත්ම කැමති නැහැ. නුඹේ යහපතට මා විසින් කළයුතු වැඩක් තිබේනම් මම ඒක කරන්ට කැමතියි. නුඹේ යහපතට කළයුතු වැඩක් කිරීමට මම පසුබට වෙන්නේ නැහැ" යි ඈ ස්ථිර ලෙස කීවා ය. මේ වේලාවේදී ඇගේ මුහුණේ පුදුමාකාර වෙනසක් ඇතිවිය. මේ



Scanned with CamScanner

වචන කියන්ට පළමු ඈ ඉතා දුකින් හඬමින් සිටි නමුත් දැන් ඒ ශෝකිත ස්වභාව නැතිවී ඇගේ මුහුණේ ප්‍රාණවත් ගතියක් ඇතිවිය. ඇගේ මුළු හදවතින්ම ආලය කරන්නාවූ මනුෂ්‍යයාගේ යහපතට ක්‍රියා කරන්ට ඉඩ ලැබීමෙන් ඈ ගැන හෝ ඇට මතු පැමිණෙන හිරිහැර ගැන හෝ කල්පනාකරන්ට නොහැකි විය. ඈ නැවතත් කථා කරන්ට ආරම්භ කොට "නුඹත් - ගිල්බට් නුඹෙත් -" කියනවාත් සමගම ඉකිගසමින් හඬමින්ට පටන්ගත්තා ය.

"නැලී නුඹට කුමක්වුනත් කමක් නැත කියන්නේ ඇයි. මම මේ තරම් උත්සාහකරන්නේ නුඹ නිසයි. නුඹට මගේ ආදරය අඩු නිසා මෙසේ කියනවාය කියා නුඹ කල්පනා කළා ද? අනේ නැලී, මට කුමක්වුණත් කමක් නැහැ. නුඹේ යහපතටයි මම උත්සාහ කරන්නේ, නුඹ කනගාටුවෙන්ට එපා. හෙට වේයන්ගොඩ යන්ට ලෑස්තිවෙන්ට ඕනෑ" යයි කියමින් ගිල්බට්ගේ සිතෙහි ඇට ස්ථිර ආලයක් තිබෙන බැව් හැඟවන්ට උත්සාහ කළේ ය.

බාහිර ලෝකය ගැන වැඩි දැනුමක් නැති අහිංසක තරුණිය ගිල්බට්ගේ වචන තදින්ම විශ්වාස කළා ය. ඇගේ ජීවිතයේ ආලෝකය මෙන් සලකන ඔහුට ආදරය කරන්නාක් මෙන් ඔහුත් ඇට ආදරය කරනවායයි ඈ කල්පනා කළා ය. කපටිනගේ ස්වභාව ගැන වැඩි දැනුමක් නැති ඇල්බට් ද ගිල්බට් වංක අදහසකින් ක්‍රියාකරන බැව් තේරුම්ගන්ට නොහැකි විය. කපටිනගේ ස්වභාව දන්නා කෙනෙක් ගිල්බට්ගේ කථාව සහ ක්‍රියාවත් අසා බලාගෙන සිටියා නම් ඔහු භයානක ප්‍රයෝගයක් කරන්ට යන බැව් දැනගැනීම අපහසු නොවේ.

"ගිල්බට් මම නුඹට ආදරය වෙන්නාක් මෙන් මටත් නුඹ ආදරේ නම් දුකක් නැහැ නුඹේ යහපතට මගේ ජීවිතය වුණත් පිදීමට මම පසුබට වෙන්නේ නැහැ" කියමින් ඇගේ ප්‍රේමවන්තයා දෙස ආදරයෙන් බැලුවා ය.

"නැලී නුඹ මා ගැන සැක කරනවා ද? මම නුඹට ආදරේ නැත කියන්නේ මන්ද"යි ගිල්බට් තරහයෙන් මෙන් ඇසුවේ ය.

"නැහැ, නැහැ, ගිල්බට් නුඹ තරහවුණා ද? මම එහෙම අදහසකින් කීවේ නැහැ" කියමින් ඇගේ ආදරවන්ත මුහුණ ඔහු දෙසට එසෙව්වා ය.





මේ දෙදෙනාගේ කථාව අසාගෙන සිටි ඇල්බට්ගේ සිත සම්පූර්ණයෙන් වෙනස් විය. ඔහු ගිල්බට් සමග කථා කරන්ට පළමු අදහස් කළේවී නමුත් ඒ අදහස අනතුරුදහන් විය. ඇල්බට් ඔවුන් සමග කථා නොකොට නැවත හැරී විශ්‍රාම ශාලාව දෙසට ගමන් කළේ ය. ගිල්බට් ගැන ඔහුගේ සිතෙහි සැකයක් හටගත්තේ ය. එහෙත් ඔහුට ඒ ගැන කිසිත් කල්පනා කරගන්ට නොහැකි විය. මේ දෙදෙනාගේ කථාව පිළිබඳව ඇල්බට් දවස මුළුල්ලේම කල්පනා කළ නුමුත් ගිල්බට් කුමක් කරන්ට යනවාද යනු තේරුම්ගන්ට නොහැකි විය.

ඉහත සඳහන් කළේ ඇල්බට් කොළමට ආ දවසේම සිදු වූ ප්‍රවෘත්තියයි. යථොක්ත ප්‍රවෘතිය සිදුවූයේ මීට හත් අට මාසයක ඉහත ය.

*   *   *   *   *

දිනක් ඇල්බට් විශ්‍රාමශාලාවේ දොරපිලේ සක්මන් කරමින් සිටියේ. ඔහු ටිකවේලාවක් සක්මන් කරමින් සිට එහි තිබුණු පුටුවක වාඩිගත්තේ ය. ඔහු හිඳගන්නවාත් සමගම ඔහුගේ පුටුවට නුදුරුව බිම වැටී තිබුණ කඩදාසි කැබෙල්ලක් දැක එය අතට ගෙන බැලූවිට පිටපැත්තේ "සිරිල් පොන්සේකා" යන නම ඉංග්‍රීසි අක්ෂරයෙන් ලියා තිබෙනවා දුටුවේ ය. එය මංගලභාරාධනා පත්‍රයක් බැව් දැනගත් ඇල්බට් මුද්‍රණය කරන ලද පැත්ත බැලුවිට එහි කළු අකුරෙන ලියා තිබුණ "ගිල්බට්" "ලීලා" යන නම් දෙක දැක ගැස්සුණේ ය. මොහොතක් ගතවෙන්ට පෙර ඔහු අතේ තිබුණ ලියමනේ අදහස් තේරුම්ගන්ට පුළුවන් විය. එය ලීලා සහ ගිල්බට්ගේත් විවාහය පිළිබඳ මංගලභාරාධනා පත්‍රයක් විය. යථොක්ත ලියමන ඇල්බට් සිටි ස්ථානයකට ආවේ කොහොම ද, එතනට ලියමන ගෙනාවේ කව්ද යනාදිය ගැන කල්පනා කරන්ට ඔහුට කාලයක් නැති විය. විශ්‍රාම ශාලාවට ආ ගිල්බට්ගේ මිත්‍රයෙකුගේ අතින් යථොක්ත ලියමන එහි වැටුණා වියුතු යයි කල්පනා කරන්ට ඉඩ තිබුණ නුමුත් ඇල්බට්ට ඒ ගැන කල්පනා කරන්ට ඕනෑ නොවී ය. ලියමන දුටු හැටියේම ඕහගේ සකල ශරීරයේ රොමොද්ගමනය විය. සිහනයක් දැක භයවූවාක් මෙන් ඔහු සිටි ස්ථානයෙන් කැගසාගෙන නැගිට්ටේ ය. ඔහුගේ සිතෙහි ඇතිවූ කෝපය සිරුලු ශරීරයේම පැතිර ගොස්

පෙම්ලොව පටන් ගත්තේ ය. ඇල්බට් කොළඹ ආ දවසේ හිල්ඩා සමඟ සිදුවූ කතාවෙන් පසු ඔහුට ... ලැබුණ තරුණිය අතරෙන් හිල්ඩා තරම් ප්‍රධාන ... පෙනුණු ... නොදැන් මහත් විය. දැන් ඔහුට හිල්ඩාගේ අදහස් නොදැන් නොදැනීමෙන්ට පුළුවන් විය.

ඔහුගේ සිත දිනාගත් අභියාත ලීලා නිත්‍ය අදහසින් ක්‍රියා කරන හිල්ඩා නිසා අවාසනාවන්ත ස්ත්‍රියක් වෙන්ට ඉඩ නැතිව ඇල්බට්ට කළ නොහැකි වැඩකි. ඇ ඇල්බට්ට අත්වෙයයි ඔහු මෙතෙක් කාලයක් කල්පනා නොකෙළේ ය. එහෙත් ඔහුට තමන් කෙරෙහි වාසනාවන්තව සිටිනවා දැකීම ඔහුගේ සිත ප්‍රීති විමට හේතු වූයේ ඇ වාසනාවන්තව සිටිනවා දැකීම ඔහුගේ සිත ප්‍රීති විමට කාරණා විය.

අභ්‍යන්තරයෙහි හිල්ඩා සමඟ විවාහ වූවහොත් ඇ අන්තිම ... ස්ත්‍රියක් වෙනවාට හැක නැතැයි ඇල්බට් කල්පනා කළේ ය. ඇ හිල්ඩා සමඟ විවාහවෙන්ට කැමතිව සිටියේ ඇගේ මව් පියන් නිසායයි ඇල්බට් කල්පනා කළේ ය. එසේ නැති නම් ඇ සිතින් හිල්ඩා සමඟ විවාහවෙන්ට කැමති වෙන්නේ නැති බවත් ස්වභාවයෙන්ම ඇ කුඩා පොඩි කාලයේ පටන් හිල්ඩා කුරුල්ලන ගතියක් තිබුණේ බවත් ඇල්බට් දැන සිටියේ ය.

"ලීලා මේ අනතුරෙන් බේරෙන්නේ කොහොමද" යි ඇල්බට් කල්පනා කළේ ය. "ඔවුන්ගේ විවාහය 18 වෙනිදා තව තුන්දවසයි. මා කුමක් කරන්ට ද? හිල්ඩා පිළිබඳව මා දන්නා ප්‍රවෘත්තිය දන්වා සිටියාට ඔවුන් පිළිගන්නේ නැත. මගේ වචන ඔව්හු විශ්වාස නොකරත්. එදා හිල්ඩා සමඟ කථාකරමින් සිටි තරුණිය නැලී නවමත් වෙයන්ගොඩ හිල්ඩා ගැන බලාපොරොත්තුව සිටිනවා ඇති. ඇ සොයාගන්ට පුළුවන් වූණොත් ලීලා මේ භයානක මඟුලයාගෙන් බේරාගන්ට පුළුවන්වෙනවාට හැක නැත. වෙයන්ගොඩ ගොස් ඒ ගැන සොයන්ට ඕනෑ."

ඇල්බට් මෙන සිසිදෙයක් ගැන පරීක්ෂාකරන්ට ප්‍රමාද නොවී එදින කොළඹින් පිටත්වෙන දුම්රියක නැගී වෙයන්ගොඩට ගියේ ය.



# 10 පරිච්ඡේදය

විශ්වාසයක් කොයි විධියකින්වත් ඥානයට හෙවර නොවේ. විශ්වාසය මොකුත් නොදත් අම්මණයෙකුගේ ක්‍රියාවක් ය.

එහෙවර අඥානයෙකුට උගත් මිනිසෙක් එකත් දෙකත් හතරයි කිව්ව විශ්වාසයක් ඇතිවේ. මන්තීනාද තමා නොදන්නා හෙයිනුත් දන්නා කෙනෙකුයි සිතා සිටි අයෙක් කී හෙයිනුත් ය.

ශ්‍රී ලංකා මාතා

මංගල්‍ය දිනය ළං වනවාත් සමඟම ලීලාගේ සිත සතුටුවිය යුතුව තිබියදී ඇගේ සිතෙහි කනස්සල්ල ස්වභාව වැඩිවෙන්ට පටන් ගත්තේ ය. මතු ජීවිතය ගැන ඇගේ කිසි බලාපොරොත්තුවක් නැති විය. මහලු වයසට පැමිණ සිටින ඇගේ දුර්වල මව් පිය දෙදෙනාගේ යහපතට ඔවුන්ගේ ප්‍රීතිය වැඩි කිරීමට ඉඩ ලැබීම පමණක් ඇගේ සිතෙහි එක්තරා සැනසීමක් ඇතිවීමට හේතු විය. ඇගේ මව් පිය දෙදෙනාගේ යහපතට කළ යුතු කොයිම වැඩකදී වත් ඇ පසුබට නොවූවා ය. ඇ හිල්ඩා සමඟ විවාහවෙන්ට කැමැත්ත දුන්නේත් මේ නිසායි.

ඇල්බට් ගැන ඇගේ සිසිම බලාපොරොත්තුවක් නොතිබුණේ ය. එහෙත් ඔහු ගැන තොරතුරු දැන ගැනීමට ඇ ආශාවෙන් සිටියා ය. "ශාස්ත්‍රාලොකය" නමින් එකල තිබුණ මාසික සඟරාවට "අප රට ජනයාගේ ලාමක අදහස්" යන මාතෘකාවෙන් ඇල්බට් විසින් ලියන ලද ලියවිල්ලක් ලීලාට කියන්ට ලැබී ඇල්බට් ගැන තොරතුරු දැනගන්ට ලැබෙයයි අදහස් කොට ඇ එය ඉතා ආශාවෙන් කියවන්ට පටන්ගත්තා ය.

* මේ ගීතය අප විසින් සම්පූර්ණයෙන්ම පිළිගෙන මෙහි සඳහන් කරන ලදයි නොසිතිය යුතුයි. ජරාතයට සුදුසු බැවින් සඳහන් කරන ලදී. "විශ්වාසය මොකුත් නොදත් අම්මණයෙකුගේ ක්‍රියාවක්ය" යන්න අනුව මලකෙල 'අම්මා' [illegible] නොපෙනෙන කෙනෙක් මුර ලෝකයේම නැති බව පෙනේ.

Scanned with CamScanner

"අප රට ජනයා අතර ප්‍රකටව තිබෙන ලාමක අදහස් විස්තර කිරීමට විශාල ග්‍රන්ථ කීපයක් ලිය යුතුවේ" යනු යථොක්ත ලියවිල්ලෙහි පටන්ගැන්ම වේ.

"අපරට ශාස්ත්‍ර දියුණුවේ ප්‍රමාණය අප අතර ශේෂව තිබෙන ලාමක අදහස් රාශියෙන් දැනගත හැකියි. ශාස්ත්‍රයෙන් හීන ජාතීන් අතර ඉතා ප්‍රකටව තිබෙන මේ ලාමක අදහස්වලට අපරට ඇතැම් උගත් ජනයා පවා ගරු බුහුමන්කරන බව පෙනේ. වර්තමාන අපරදිග උගත් ජනයා අතරින් මේ ලාමක අදහස් නැතිවී යාමට එක්ම හේතුව ඒ රටවල පසුගිය ශත වර්ෂය තුළ ඉතා සීඝ්‍රව ඇතිවූ ස්වභාවික ශාස්ත්‍ර දියුණුවයි. අපේ මහා පඬිවර්යන්ගේ ස්වභාව ශාස්ත්‍ර දැනීමේ දුර්වලත්වය මෙහි සඳහන් කළ යුතු නොවේ. මනුෂ්‍යයන්ගේ දියුණුවට බාධක අර්ත ශූන්‍ය ලාමක අදහස් නමැති බිජයන්ට ඉන්දියාව හෝ ලංකාව හා සමාන සරු කෙතක් ලෝකයේ ශිෂ්ටාචාර ජාතීන් අතර වෙන නොමැතියි. ශාස්ත්‍රයට ද ආගමට ද පරම සතුරෙක් වූ ලාමක අදහස් අප රටින් මූලොච්ඡින්න කිරීමට උත්සාහ කිරීම ශාස්ත්‍ර දියුණුව කැමති කාගේත් යුතුකමකි. එය ශාස්ත්‍රය ගමන් කරන්නාවූ මාර්ගය හෙළිකිරීමකි.

අප රට ජනයා අතර ශේෂව තිබෙන ලාමක අදහස් මිථ්‍යා කථාන්තර එකිනෙකට බැවින් යක්ෂ ප්‍රේතාදීන් ගැනත් යන්ත්‍ර මන්ත්‍රාදිය ගැනත් අප අතර ශේෂව තිබතෙ ලාමක අදහස් සහ ඒවා ඇතිවී තිබෙන අන්දමත් අපේ දැනුම් පමණින් මෙහි විස්තර කරනු ලැබේ. මෙහි සඳහන් කරුණු කියවනවිට තම තමන්ගේ අභ්‍යන්තරික අහදස් නිසා ඇතිවන ක්‍රෝධයට ක්‍රියාකරීමට ඉඩනොදී පරීක්‍ෂාවෙන් කියවා බලා කල්පනා කරන ලෙස ඉල්ලමි.

පළමුකොට යක්ෂයන් පිළිබඳ පරීක්‍ෂාකර බලමු. අපරට බොහෝ දෙනා යක්ෂ ප්‍රේතයෝය කියා මනුෂ්‍යයන්ගේ ඇසට නොපෙනෙන සත්ව කෝට්ඨාසයක් සිටිනවායයි කිසි පරීක්‍ෂාවක් නැතිව පිළිගනිත්. යක්ෂ ප්‍රෙතයෝ අප සමඟ නිතර හැසිරෙත් ය. තිබෙන එකම වෙනස ඔවුන් අපේ ඇස්වලට නොපෙනීම පමණකැයි ඇතැම් අය කියනවා බොහෝවිට අසන්ට ලැබේ.

පුරාණ කාලයෙහි දිව්‍යලෝකය අප පෘථිවියට ඉතා ආසන්නව තිබුණ බැව් පෙනේ. "පුරාණ සිංහලයෝ දිව්‍යලෝකයෙන් ප්ලෑන්





ගෙනැවිත් ගෙවල් සෑදුවෝ ය යන්න පිටකොටුවේ කෙනෙක් දොන් කරෝලිස් පුත්‍ර මහතුනේගේ සාප්පුවෙන් ප්ලෑනක් ගෙනැවිත් ගෙයක් සෑදුවේ ය යන්න විශ්වාස කරන්වාටත් වඩා පහසුවෙන් පිළිගත යුත්තකි. එය කොටුවේ ඔර්ලෝසු කනුව පිහිටා තිබෙනවා ය යන්න පිළිගන්නවාටත් වඩා පහසුවෙන් පිළිගත යුත්තක් මිස විශ්වාසයක් නොවේ. මන්ද 'විශ්වාසය මොකුත් නොදක් අමනයෙකුගේ ක්‍රියාවක් බැවිනි.'

යක්ෂ ප්‍රේතයෝ ය කියා කොටසක් සිටිනවායයි පිළිගැනිමට හේතුව මොවුන් සම්බන්ධව පුරාණ ඉතිහාසාදියෙහි සඳහන් කථාන්තර බැව් පෙනේ. ඉතිහාසයෙහි සඳහන්වන මෙබඳු ප්‍රවෘත්ති එසේම පිළිගැනීම යුක්ති සහිතදැයි පරීක්‍ෂා කටයුතුයි.

යක්ෂයෝ ය කියා මිනිස් ඇසට නොපෙනෙන සත්ව කොට්ඨාසයක් සිටීම වර්තමාන ශාස්ත්‍රයට (ස්වභාව ධර්මයට) විරුද්ධව කියා එපමණින්ම එබඳු සත්ව කොට්ඨාසයක් නැතැයි කීමට අපට යුක්තියක් නොමැතියි. ලෙඩ බෝකරන ක්ෂුද්‍ර ප්‍රාණීන් දහස් ගණන් අපේ ඇසට නොපෙනී වාතයෙහි හැසිරෙන බව ශාස්ත්‍රඥයන් විසින් ඔප්පුකර තිබේ. එමෙන් මනුෂ්‍යයන් ලෙඩ කරන යක්ෂයෝ ය කියන කොටස ද ඇති වෙන්ට බැරි ද? එබඳු කොටසක් කිසිකලක සිටියේවත් මතු ඇතිවන්නේවත් නැතැයි එකවරම කීමට අපට ඇති යුක්තිය කුමක් ද? එබඳු යුක්තියක් නැතිබව පෙනේ. 'ස්වභාව ධර්ම නීතිය කියන්නේ පුරුද්දෙන් අත්දැකීමෙන් දැනගත තිබෙන පමණටයි. ස්වභාව ධර්මය සීමාරහිතයි. මනුෂ්‍ය ඥානය එපමණ දුර ගමන් කරවිය නොහැකියි' එබැවින් කොයිම දෙයක්වත් ස්වභාව ධර්මයට විරුද්ධව කොටින්ම එසේ විය නොහැකියයි නිශ්චය කළ නොහැකිවේ. මක්නිසා ද ස්වභාව ධර්මයාගේ බලය අසවල් පමණ යයි සීමාවක් දක්විය නොහැකි බැවිනි. මෙසේ බලනකල පුරාණ ඉතිහාසයන්හි සඳහන් වන අද්භූත දේ සිද්ධ විය නොහැකියයි ස්ථිරවම කීමට අපට යුක්තියක් නැති බව හොඳින් වැටහේ. ඉතින් පුරාණ ඉතිහාසයන්හි සඳහන් හාස්කම් සිද්ධ විය නොහැකියයි කිය නොහැකි නම් ඒවා පිළිනොගන්ට හේතුව කුමක්දැයි ප්‍රශ්නයක් ඇති වේ. ඊට උත්තරය 'පුරාණ ඉතිහාසයන්හි සඳහන් අද්භූත සිද්ධවීම් පිළිගැනීමට බලවත් බිඳහෙළිය නොහැකි සාක්ෂි තිබිය යුතුයි' යනු යි.

යක්ෂයන් සම්බන්ධව පුරාණ ඉතිහාසයන්හි සඳහන්වන කථාන්තර හාස්කම් සංඛ්‍යාවට ඇතුළත් කළ යුතු වේ. පුරාණ



Scanned with CamScanner

ඉතිහාසයන්හි සඳහන් අද්භූත සිද්ධවීමක් වර්තමාන ශාස්ත්‍රයට යම් තරමක් විරුද්ධ වේ ද එය පිළිගැනීමට එතරම් බලවත් සාක්ෂි උවමනා වේ. සෑහෙන තරම් සාක්ෂ නැතිව එබඳු දෙයක් පිළිගැනීම යුක්ති රහිත යි.

අනුරාධපුරේ කැලෑවකදී කෙනෙක් කොටියෙක් දුටුවාය කීවොත් එය පිළිගැනීමට වැඩි සාක්ෂි වුවමනා නොවේ. ඔහුගේ කීමට ප්‍රමාණ වේ. නුමුත් ඔහු එම කැලෑවේදීම සිංහයෙක් දුටුවාය කීවොත් අපි ඔහුගේ කීම පිළිගැනීමට පසුබට නොවෙමු ද? අපේ පුරුද්දෙන් අපි දනගන තිබෙන්නේ ලංකාවේ සිංහයන් නැතිබවයි. ඉතින් ඔහුගේ කීම අප සියලු දෙනාගේම විශ්වාසයට විරුද්ධ බැවිනි ඔහුගේ කීම පිළිගැනීමට පරීක්ෂාසහිත වෙන්ට ඕනෑ. ඔහු මීට ප්‍රථම සිංහයන් දක තේරෙනවා ද යනාදි වශයෙන් පරීක්ෂා කරන්ට ඕනෑ. ඔහු ඇත්තටම සිංහයෙක් දුටුවානම් ඒත් ලංකාවේ සිංහයෝ සිටිත්යයි පිළිගැනීමට සාක්ෂියක් නොවේ. ඔහු එම කැලෑවේදීම කිඳුරෙක් දුටුවා ය කීවොත් ඔහුගේ කීමට අපට සිනහ පහළ වේ.

මෙබඳු සත්වයෙක් සිටිනවායයි විශ්වාස කරනවාට වඩා ඔහු රැවටෙන්ට ඇතැයි සිතීම පහසුයි.

මෙබඳු සත්වයෙක් සිටිනවායයි විශ්වාසකිරීමට අපට මොන අන්දමේ සාක්ෂි වුවමනා කරනවා ද? ප්‍රසිද්ධ සත්ව විද්‍යාඥයෙක් යථොක්ත සත්වයා දුටුවාය කීවත් ඒ තරම් ශාස්ත්‍රඥයෙකුගේ සාක්ෂිවල ඇති වැදගත්කම නිසා ස්වල්පයක් කල්පනා කළත් එපමණින් පිළිගතයුතු නොවේ. යථොක්ත ශාස්ත්‍රඥයා කිඳුරා මැනබලා උගේ උස මහත ද අවයවයන්ගේ ප්‍රමාණය ද උගේ රූපය ගැන ද තවත් උවමනා කරන සියලුම කරුණු දක්වමින් ලියවිල්ලක් සහිතව කියා සිටියොත් ඔහුගේ සාක්ෂිවල තිබෙන වැදගත්කම නිසා විකකටවත් ඔහුගේ කීම පිළිගන්ට ඕනෑ. එමෙන්ම පුරාණ ඉතිහාසයන්හි සඳහන් ආශ්චර්යමත් සිද්ධවීම් පිළිගැනීමට ඉතාම වැදගත් සාක්ෂි තිබිය යුතුයි.

1- ස්වභාවයෙන්ම මනුෂ්‍යයන් තුළ අද්භූත කථාන්තර ඇසීමට තද ආශාවක් තිබේ. මේ ආශාව වැඩිවශයෙන් තිබෙන්නේ නූගත් මනුෂ්‍යයන් තුළයි. යක්ෂ ප්‍රේතයන් පිළිබඳ ඇතැම් මනුෂ්‍යයන්ගේ අද්භූත ක්‍රියාදිය පිළිබඳවත් විස්තර කරනවිට නූගත් මනුෂ්‍යයෝ භයාගත්කට නොපියා ඊට ඇහුම්කන්





දීගෙන සිටිත්. අද්භූත කථාන්තර වහා පැතිරයන්නේ මේ නිසා ය.

2- පුරාණ කාලයෙහි ස්වාභාවික ශාස්ත්‍ර දියුණුව නොතිබුණ බැවින් ඇතැම් සිද්ධවීම් තෝරා බේරා ගැනීමට දෙවියන්ගේ නොහොත් යක්ෂයන්ගේ බලයක් වුවමනා විය. 'මහමත් භක්තිකයෙක් ඔහුට හිරිහැර කරදර පැමිණ තිබෙනවේලාවට දෙවියන්ට යාච්ඤා කරයි. ඊට පසු ඔහුගේ සිතෙහි තිබුණ කරදර සියල්ලම නැතිවී සිත එකඟත්වයට පැමිණෙන්නේය. ඔහු විසින් කරන ලද යාච්ඤාවට උත්තරයක් වශයෙන් 'අල්ලා' විසින් ඔහුගේ සිතෙහි කරදර සියල්ලම නැතිකරන ලදැයි ඔහු කල්පනාකරයි. අල්ලා කියන දෙවියා ඉන්න බව දනගැනීමට ඔහුට මෙය හොඳම ශාක්ෂ්‍යයකි. චිත්තධර්ම ශාස්ත්‍රය ගැන දනීමක් නොමැත්තෙක් ඔහු යථොක්ත කාරණය අන්‍යාකාරයට පරිවර්තනය කොට සිතා ගන්නේ ය. නුමුත් චිත්ත ධර්ම ශාස්ත්‍රඥයෙකුට නම් යථොක්ත කාරණය සිද්ධවීමට දෙවියෙකුගේ උපකාරයක් උවමනා නොවන බව හැඟේ.

කර්නල් ඕල්කොට්තුමා අප රටට ආ කාලයේදී වාතාබාධවලින් පෙළෙමින් සිටි කිහිපදෙනෙක් හස්තයෙන් පිරිමැදීමෙන් සුවකළ බැව් ඒ කාලයෙහි ප්‍රසිද්ධ වී තිබුණේ ය. ඒ කාලයෙහි නූගත් බොහෝ දෙනා මෙය දිව්‍ය බලයකින් (අනුහසකින්) කරනවායයි සැලකූහ. මානුසික කාන්දම් බලයෙන් මෙබඳු දේ සිද්ධ වියහැකි බැව් ඔව්හු නොදන සිටි බැවින් එය අන්‍යාකාරයකට පරිවර්තනය කොට සිතා ගත්හ.

3- වර්තමාන කාලයෙහිත් අසවල් පළාතේ මෙබඳු හාස්කමක් සිද්ධ වුණායයි කියමින් පොත්පත්හි පවා සඳහන් කරත්. කතෝලිකයන්ගේ සියඹලාගසේ ප්‍රවෘත්තියත් ජගත්සේනගේ උත්පත්තියෙන් පෘථිවි චලනය සිද්ධවුණා ය යන ප්‍රවෘත්තියත් ඊට නිදර්ශනයි. මේ කාලයෙහි උගත් මනුෂ්‍යයෝ 'ඒ මෝඩයන් ඕනෑදෙයක් විශ්වාසකළාට අපට කමක් නැත' කියා යථොක්ත කරුණු ගැන කිසිම සැලකීමක් නොකරත්. මේ නිසා කලකදී යථොක්ත කරුණු උගත් අයගේ පොත්පත්හි පවා සඳහන් වන්නාහ. මේ අන්දමේ කරුණු පුරාණ කාලයෙහිත් සිද්ධ වෙන්ට බැරි නැහැ. පුරාණ කාලයෙහිත් මේ අන්දමේ ළාමක



Scanned with CamScanner

කථා පැතිර යනවිට උගත් ජනයා ඊට ඇහුම්කන් නොදීමෙන් හා ඒවායේ අසත්‍යය ලාමකත්වය පෙන්වීමට උත්සාහ නොකොට උපේක්ෂාවීමෙන් යථෝක්ත කථා කලකදී පොත පතෙහි සඳහන් වෙනාට බැරි ද?

ශාස්ත්‍ර දියුණුව තිබෙන මේ කාලයෙහිත් මනුෂ්‍යයන්ට හා ගෙවලට යක්ෂයන් ආරූඪවීම පිළිබඳ නොයෙක් අන්දමේ කථා අසන්ට ලැබෙත්. වැඩි වශයෙන් මෙබඳු කථා පළමු ඇතිවන්නේ නූගත් ජනයා අතරෙයි. මේවා ගැන පරීක්ෂා කරගෙන යනවිට පළමුවෙන්ම දුටුවේ කව්ද? කොහොම සිද්ධ වුණා ද? යනාදිය ගැන කිසිත් දැනගන්ට නොලැබේ. කෙනෙකුට තවත් කෙනෙක් කී බවත් ඔහුට තවත් කෙනෙකුගෙන් දැනගන්ට ලැබුණ බවත් අසන්ට ලැබෙනවා මිස දුටු කෙනෙක් බලන්ට ගිය කෙනෙක් සොයාගැනීම ඉතා අමාරු වැඩකි. මෙබඳු කථාන්තරයන්ගෙන් වැඩි කොටස නොපිළිගත යුතු නූගත් මනුෂ්‍යයන් අතරේ අහේතුකව පැතිර යන ඒවාවෙත් සැලකිය යුතු තරම් සත්‍යයක් අති කථාන්තර ඇත්නම් ඒවා යක්ෂයන් ප්‍රේතයන් ඉස පිට නොතබා ස්වාභාවික ශාස්ත්‍රානුසාරයෙන් නිරවුල් කළ හැකි ය. එසේත් නිරවුල් කළ නොහැකි සිද්ධවීමක් තිබුණත් එය යක්ෂයන් විසින් කරන ලදැයි සිතීම නුවණට හුරු නොවේ.

කතළුවේ එක්තරා ගෘහයකට මළ යකෙක් වැහී සිටින බවත් ඒ මළ යකා ඒ ගෙදර මිනිසුන්ට නොයෙක් හිරිහැර කරන බවත් ඒ පළාතේ වැදගත් උගත් මිත්‍රයෙක් මා සමග කීවේ ය.

තවත් වැඩිදුරටත් "මෙය හොඳටම ඇත්තය, අවිශ්වාස කරන්ට එපාය, එහෙම අවිශ්වාස කළයුතු එකක් නොවේ ය. ඇසින් දැකපු එකක්" යයි කීවේ ය. මා වික වේලාවක් නිශ්ශබ්දව සිට එය මහත්මයාගේ ම ඇස්දෙකින් දුටුවාදැයි ප්‍රශ්න කළවිට පුදුමයටමෙන් "මම දුටුවේ නැහැ. මට හොඳටම විශ්වාස කවදාවත් බොරු නොකියන එය ඇසින් දැකපු කෙනෙක් කීවා" යන වචන අසන්ට ලැබුණේ ය. මෙබඳු කරුණු ගැන අපරට බොහෝ දෙනා තුළ තිබෙන පක්ෂභාගී සිත පුදුම සහිත යි. සමහරු මෙබඳු කරුණු ගැන කථා කරනවිට තමන් නුදුටු දේ පවා දුටුවෝ යයි කියත්.

මේ ආදීන් සලකා බලන විට පුරාණ ඉතිහාසයන්හි සඳහන් අද්භූත කථාන්තර පිළිගැනීමට අපි කෙතරම් පරීක්ෂාකාරී විය යුතු ද? ඒවා පිළිගැනීමට කෙතරම් බලවත් බිඳ හෙළිය නොහැකි සාක්ෂි තිබෙන්ට ඕනෑ ද?





පුරාණ ඉතිහාසයන්හි අද්භූත සිද්ධවීම් ඉහත කී අන්දමට උගත් මනුෂ්‍යයන්ගේ සිත් සතුටුවන තරම් සාක්ෂි ඇතුව සඳහන් කර තිබේ ද?"*

මේ ළඟට යක්ෂ ප්‍රේතයන් පිළිබඳ අප රට ජනයා තුළ තිබෙන නොගැලපෙන අදහස් ගැන පරීක්ෂාකර බලමු. ලංකාවේ සිටි යක්ෂයෝ පිටිසක්වළට එළවන ලද්දෝයයි අපේ යකැදුරෝ කියත්. පිටිසක්වළ තිබෙන්නේ කොහේ ද? පිටිසක්වළය කියන්නේ අපේ පෘථිවියේම කොටසක් ද? එසේනම් යකුන්ට මෙහි එන්ට බැරිය කියන්නේ මන් ද? පිටිසක්වළය කියන්නේ අන්‍යලෝකයක් විය යුතු යි. අපේ පෘථිවියට ඉතා ආසන්නව තිබේයයි කියන අඟහරු තාරකාවේවත් යක්කු සිටිනවා හේමා! යක්ෂයන් විසින් දෘෂ්ටිය හෙළීමෙන් මනුෂ්‍යයෝ ලෙඩ කරනු ලබන්නාහයි යකැදුරෝ කියත්. හැතැප්ම ලක්ෂ ගණනක් ඈත්ව තිබෙන අඟහරු තාරකාවේ සිටින යකෙක් අප පෘථිවියේ මනුෂ්‍යයෙකුට දෘෂ්ටිය හෙළනවාය යන්න මනුෂ්‍ය ඥානයෙන් කල්පනා කළ හැකි ද? යාරගණනක් ඈත්ව තිබෙන කුඩා ද්‍රව්‍යයක් අපේ ඇසට නො පෙනෙනකොට හැතැප්ම ලක්ෂ ගණනක් ඈත සිටින යක්කුන්ට අප දර්ශනය කරන්ට පුළුවන කියා අපේ කෙසේ කල්පනා කරමු ද? යකෙක් දෘෂ්ටිය හෙලූ පමණින් මනුෂ්‍යයෙක් ලෙඩ වෙන්නේ කොහොම ද? එහෙත් සමහරු කොට යකා වැහිලාය රීරි යකා වැහිලායයි කථා කරත්. මෙහි එන්ට නොහැකි යකෙක් මනුෂ්‍යයෙකුට ආරූඪවෙන්නේ කොහොම ද? ආරූඪ වෙනවාය කියන්නේ යකා මනුෂ්‍ය ශරීරයට ඇතුල් වීම ද? සමහරු පිස්සන් ගැන කථා කරන විට 'ඔහුට රීරියකාගේ දෘෂ්ටිය වැහිලාය' කියත්. මේ අණ්ඩර දෙමළ විස්තර කරන්ට පුළුවන් සමර්ථයා කව් ද?

යකදුරන් කියන අන්දමට මනුෂ්‍යයන් ලෙඩකරන්නේ කළුයකා, රීරියකා, සන්නියකා ආදී යක්ෂයෝයි. මේ යක්ෂයන්ගේ උත්පත්තිකථා ගැන බලමු.

## මහසෝනාගේ උත්පත්තිය

"පැරකුම් රජුන් පෙ ර
රජකළ පොළොන්නරු පු ර
කුඹලෙකුගේ ගෙද ර
උපත් කුමරෙකි ඉතා රූබ ර

* මේ වාක්‍යය "ඩේවිඩ් හියුම්" නම් ඉංග්‍රීසි ග්‍රන්ථ කර්තෘගේ පොත්වලින් කරුණු උපුටා ලියනලදී.



Scanned with CamScanner

| | |
|---|---|
| දියෙහේ දිය වැටෙමි | හ |
| සත් මස පිරි ගිය කැ | හ |
| මත් මේ වටවමි | හ |
| තැලි තම් රජසොහොනේ එම දී | හ |
| රැලි තම් රජසොහොන | හ් |
| සුම දිහ ඒ තම් තැලිමට | හ් |
| හෙළින් වෙසමුනි ගෙ | හ් |
| වරම් ලැබ තරලොවට බසිමි | හ් |
| අහසින් යනව | රා |
| දුක ලිය ඒ ගෝඩිමට | රා |
| මැස යකු ඒ ව | රා |
| නැසී ගිය බිසවගෙ සියලු රූබ | රා |
| රජ සොහොනට ගොසි | හ් |
| සුදයට ඒ යකු සමගි | හ් |
| රතකලට සරොසි | හ් |
| ගැසිය වමපස ඒ සුලසිල්මෙ | හ් |
| සොහොවගෙ ඉඹ | රා |
| රජ සොහොනේ ඉස දෙද | රා |
| කවා පැහ එව | රා |
| වැටුණි ඒ යකු සොහොනෙ වැති | රා |
| දෙවි රදින දුක | ලා |
| වලසෙකු සිරස සිද | ලා |
| යක් කදට අල් | ලා |
| සිරෙ පැන් ඉස නැගුටුවා | ලා"* |

රිරි යකා ආදී යක්ෂයන්ගේ උත්පත්ති කථාත් මීට දෙවැනි නොවේ. මේවා පුරාණ කථා නිසා කොහොම සිද්ධවෙච්ච ඒවාද කියන්ට බැරිය කියන උගත් බෞද්ධ පිරිසකුත් සිටින බැවින් මේ මිථ්‍යා කථාන්තර ගැන නූගත් බෞද්ධයන්ගේ අදහස් සෙවිය යුතු ද?

අප අතර තිබෙන මේ ලාමක කලින් කල එක එක්කෙනා විසින් අමුතුවෙන් ඇතිකරන ලද ඒවා නොව ලෝකයේ මනුෂ්‍ය වාසවූ තැන් පටන් පැවතවිත් ශේෂව තිබෙන ඒවා බැව් සත්‍යයකි.

* භූතශාන්තිය



## 11 පරිච්ඡේදය

යමෙක් කිඹිස්ස කල "ආයුබෝවන්" කියා ආචාර කිරීම අපරට ගම්බද පලාත්වල ඇතැම් ජනයා අතර පවතින සිරිතකි. මෙය වර්තමාන වනචාරී මනුෂ්‍යයන් අතරේ ද පවතින සිරිතකි. අපරට ගම්බද පලාත්වල ජනයා අතරින් නැතිවෙගෙන යන මේ සිරිතෙහි යම්කිසි අර්ථයක් තිබෙන බැව් නොපෙනේ. නමුත් වනචාරී මනුෂ්‍යයන් යමෙක් කිඹිස්ස කල "ආයුබෝවන්" කියා ආචාර කරන්නේ" යමෙක් කිඹිසින්නේ ඔහුගේ ශරීරයට ආරූඪව සිටි යකෙක් පිටවෙන විට" යයි ඔවුන් විශ්වාස කරන නිසායි ශරීරයට ආරූඪව සිටි නපුරු යකෙක් ඉන් පිටවීම ඔහුට දීර්ඝායුලැබීමට හේතුවක් බැවින් "ආයුබෝවන්" කියා ආචාර කෙරීමෙන් දීර්ඝායු ලැබීම ඔවුන්ගේ අදහසට එකගවන ක්‍රියාවකි. මේ පිළිබඳව එක්තරා ජාතක කථාවක් ද තිබේ.* 'බරණැස් නුවර අම්බලමක සිටි යකෙක් එහි නවාතැන් ගන්නන්ගෙන් කෙනෙන් කිඹිස්ස කල ආනොවැඩූ නැනැත්තෝ මරා අනුභව කරනු ලබන්නාහ' යි යථෝක්ත ජාතක කථාවෙන් ප්‍රකාශ වේ. මෙහි තිබෙන පුදුම සම්බන්ධය ගැන කල්පනා කළ යුතුයි.

ගම්බද පළාත්වල ළමයින් අතර කෙළිබඩුවක් මෙන් පාවිච්චි කරන "කොටිපෙත්ත" (Bull - roarer), මෙය අඟල් හත අටක් දිග සහ අඟල් දෙකක් තුනක් පළල ලී පතුරකින් සාදාගන්නා කෙළි බඩුවකි. මෙය ලනුවක ගැටගසා හිස වටේ කරකැවීමෙන් භයංකර නාදයක් පිටවේ) ගැන කල්පනාකර බලනු. මේ ලී පතුර ශිෂ්ටාචාර මනුෂ්‍යයන් අතර කෙළිබඩුවක් මෙන් ශේෂව තිබෙන නමුත් වර්තමාන සියලුම වනචාරී මනුෂ්‍යයන්, ආගම සම්බන්ධ

* ගග්ග ජාතකය

උත්සවයන්හිදී හා යන්ත්‍ර මන්ත්‍ර කිරීමාදියෙහිදීත් පාවිච්චිකරන මහානුභාව සම්පන්න වස්තුවක් මෙන් සලකන ද්‍රව්‍යයකි.*

මේ "කොටි පෙත්ත" සම්බන්ධ වූ ලාමක අදහස් නැතිවී ගොස් ශිෂ්ටාචාරය මනුෂ්‍යයන් අතර සෙල්ලම් බඩුවක් වශයෙන් ශේෂව තිබේ.

මෙසේ ශිෂ්ටාචාර මනුෂ්‍යයන් හා වනචර මනුෂ්‍යයන් අතරේත් තිබෙන සිරිත් විරිත් ලාමක අදහස් ආදියේ සම්බන්ධයක් ඇතිවීමට හේතුව දැනට ශිෂ්ටාචාරව සිටින ජාතිහු ද කාලයකදී වර්තමාන වනචර ජාතීන් මෙන් පහත් ස්වභාවයක සිට දියුණුවීමයි.** වර්තමාන කාලයෙහි තවමත් වනචරව සිටින ඔස්ට්‍රේලියාව, මැලනීසියාව, අප්‍රිකාව ආදී පලාත්වල මනුෂ්‍යයන්ගේ ලාමක අදහස් සිරිත් විරිත් ආදිය ගැන පරීක්ෂා කිරීමෙන් අප අතර නැතිවේගන යන්නා වූ ලාමක අදහස් ඇති වී තිබෙන අන්දම අවබෝධ කරගත හැකියි.

වනචර මනුෂ්‍යයන්ට සිහිනෙන් කරන ක්‍රියාවලත් හැබවින් කරන ක්‍රියාවලත් වෙනසක් නොමැතියි. ඔවුන්ගේ නෑසීගිය නෑ මිත්‍රාදීහු සිහිනෙන් පෙනී ඔවුන් සමග කාඩ් සෙල්ලම්කිරීම, සණ්ඩු දබරකරගැනීම, වනමෘගයන් ලුහුබැඳ ගොස් ඔවුන් විදමැරීම, යනාදිය ඔවුහු සිහිනයක් මෙන් නොසලකත්. ඇලක් දොලක් ළඟට ගියවිට හෝ ආලෝකයේ ඇවිදිනවිට ඔහුගේ ඡායාව පෙනීමාදී නොයෙක්

* We find the use of the bull-roarer in connection with initiation ceremonies in Australia, New Guinea, The Solomon Islands, South and west Africa and Brazil. Even in some savage communities the bull – roarer has degenerated into a plaything, as has been the case in our own country. This insignificant object is perhaps the most ancient, widely spread, and sacred religious symbol, in the world.

(Prof. Haddon's Introduction to the Customs of the World)

** Folklore represents, in the midst of a civilised race, the savage ideas out of which civilisation has been evolved. The conclusion will usually be that the fact which puzzles us by its presence in civilisation is a relic surviving from the time when the ancestors of a civilised race were in the state of savagery.

*(Andrew Langs' Custom and Myth, p.13)*





කරුණුවලින් ඔහුගේ ශරීරය තුළ ඇසට නොපෙනෙන භූතයෙක් සිටින බැව් ඔව්හු තේරුම් කරත්. ඔහු නිදාගත්තාට පසු සිහිනෙන් පෙනෙන දේ ඔහුගේ ශරීරය තුළ සිටින භූතයා ඉන් පිටවී කරන දේ මෙන් කල්පනාකරයි. ළදරු කල්පනාවෙන් යුත් වනචර මනුෂ්‍යයන්ට යථෝක්ත කරුණු මීට වඩා හොඳින් තේරුම්ගන්ට නුපුළුවන්වීම පුදුමයක් නොවේ.

"මා සමග සිටි ඉන්දියානු මනුෂ්‍යයන්ගෙන් කිහිප දෙනෙක් රෝගාතුරව සිටි නිසා ගංගාව අසල කුඩාරමෙහි දවස් ගණනක් ප්‍රමාද වෙන්ට සිදුවිය. රෝගාතුරව සිටි මිනිසුන්ට ටිකක් සුව ලැබුණාට පසු යන්ට සූදානම් වූවිට රෝගාතුරව සිටියවුන්ගෙන් කෙනෙක් මා සමග කෝපවී ඔහුට යන්ට බැරිබව කීවේ ය. මොහු මා සමග කෝපවෙන්ට හේතුව කුමක්දැයි පරීක්ෂා කළවිට ඔහු අසනීපයෙන් සිටිද්දීත් ඒ ගැන නොසලකා පසුගිය රාත්‍රියෙහි ඔහු ලවා වැඩකෙරෙව් බැව් කීවේ ය. මෙය ඔහු රෑ දකිනලද ස්වප්නයක් බැව් අවබෝධ කරවන්ට උත්සාහ කළ නුමුත් බැරිවිය.

ඒ දවස්වල කෑම හිඟකම තිබුණ නිසා නිතර හීන පෙනීමෙන් මෙබඳු කරුණු සිදුවූහ. සමහරු උදේ නැගිට රෑ ඔවුන්ගේ විරුද්ධකාරයෙක් විත් අඩන්තේට්ටම් කර ගියේයයි කියමින් පහර වැදිච්ච ස්ථාන අතගෑවෝ ය."* මෙය වනචාරී මනුෂ්‍යයන් අතර වර්ෂ ගණනක් සිටි ඔවුන්ගේ අදහස් පරීක්ෂා කළ ඉංග්‍රීසි පඬිවරයෙක් විසින් ලියනලද ප්‍රවෘත්තියකි.

අප අතර තිබෙන යක්ෂ, ප්‍රේතයන් පිළිබඳ කථා ආදියෙන් වැඩිෙ කොටස ඉහත කී විශ්වාසය නිසා ඇතිවී ශේෂව තිබෙන ඒවායයි සිතිය හැකි යි. ස්වකීය ශරීරය තුළ භූතයෙක් සිටිනවායයි විශ්වාසකරන වනචාරී මනුෂ්‍යයෝ මරණය සිදුවෙන්නේ යථෝක්ත භූතයා ශරීරයෙන් පිටවීමෙනැයි කල්පනාකාරත්. ඔවුන්ගේ ප්‍රධානියෙක් මළවිට ඔහුගේ ජීවත්ව සිටින වැඩකරුවන් දෙතුන් දෙනෙක් සොහොන් භූමියෙහිදී මරාදැමීම ඇතැම් වනචාරී මනුෂ්‍යයන් අතර පවතින සිරිතකි. මේ සිරිත ඇති වී තිබෙන්නේ මළා වූ ප්‍රධානියාගේ අවතාරයට අනිත් ලෝකයේදී ආවතේව කිරීමට වැඩකරුවන් වුවමනා බැවින් ඔහුගේ වැඩකරුවන් මැරීමෙන් ඔවුන්ගේ අවතාරය ද මළා වූ ප්‍රධානියාගේ අවතාර හා එක්ව

* Sir Everard in Thurn, *Indians of Guiana*, (From Edward Olodd's *Animism* p. 31).

යන්නාහ'' යන විශ්වාසය නිසා බව හැඟේ. ''ගෙයින් පිටදී මිනිහෙක් මළවිට ඔහුගේ අවතාරය උදෑසනම නැගිටවා ගෙදර ගමන් කරවීම පිණිස ඒ ස්ථානයේදී කුකුලෙක් මැරීම'' ඉන්දියාවේ කාසි නම් මනුෂ්‍යයන් අතර පවතින සිරිතකි. ගෙදරින් දුර ස්ථානයක මිනිහෙක් මළවිට ඔහුගේ අවතාරයට ජලය ස්පර්ශ නොවී*එගොඩවී ගෙදර ඒමට ගෙට නුදුරු ස්ථානයන්හි තිබෙන ඇල දොලවල ලනු ඇද තැබීමක් යථොක්ත මනුෂ්‍යයන් අතර පවතින සිරිතකි. අපරට ගම්බද පලාත්වල ජනයාට සොහොන් භූමියෙහි පහනක් දැල්වීමට පුරුදු වී තිබෙන සිරිත ද යථොක්ත ළාමක අදහස නිසා ඇති වී පැවතවිත් ගේවෙ තිබෙන වා යයි සිතිය හැකියි. ස්වාමිපුරුෂයා මළවිට සොහොන් භූමියෙහිදී භාර්යාව ද මැරීම ඉන්දියාවාසීන් අතර පැවිත සිරිතකි. මෙය ද ඉහත කී ළාමක අදහස නිසාම ඇති වී තිබෙන සිරිතක් බවට සැක නැත්තේ ය.**

ස්වකීය ශරීරය තුළ භූතයෙක් සිටිනවාය යන විශ්වාසය සමගම මනුෂ්‍යයෙක් මළවිට ඔහුගේ ශරීරය අත්හැර යන භූතයාට ඔහුගේ නෑ මිත්‍රාදීන් විසින් වාසස්ථාන කෑමබීමාදිය සපයන්ට උවමනාය යන්න සහ එසේ නොකිරීමෙන් මළ තැනැත්තාගේ භූතයා ඔවුන්ට හිරිහැර අන්තරාය පමුණුවනවාය යන විශ්වාසය ද ඇතිවේ. ''ළදරුවෙක්, ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් මැරී ටික දවසකින් යකෙත් වෙනවායයි ද, ඔවුන්ට පුදපූජා පැවැත්වීමෙන් උපකාර ලැබිය හැකියයි ද, පුදපූජා නොපැවැත්වීමෙන් අනතුරු පැමිණෙන වායයි ද''*** බින්තැන්නේ වැද්දෝ විශ්වාස කරත්. මේ අන්දමට බින්තැන්නේ වැද්දන් අතර මනුෂ්‍යයන් මැරෙණ තරමට යක්ෂයන්ගේ ගණන ද වැඩිවේ. මෙසේ මළගිය තැනැත්තාගේ අවාතරයට පුදපූජා

* අවතාරයන්ට ජලය තිබෙන ස්ථානවලින් එගොඩ වෙන්ට බැරියයි අපරට නුගත් ජනයා ද විශ්වාස කරත්.

* මෙබඳු සිරිත් සම්බන්ධව වර්තමාන විස්තරය හෝ අදහස අනිකක් වුවත් මෙවා මුලින් ඇතිවී තිබෙන්නේ ඉහත කී ළාමක අදහස නිසා බැව් පිළි නොගැනීමට කරුණක් නොපෙනේ.

***According to most Veddas, the spirit of every dead man. woman or child becomes a Yaka within a few days of death who, if well treated, will continue their loving kindness to their survivors, and only when neglected will show their disgust and anger by withdrawing their assistance or even becoming hostile. Veddas by Prof. C. G Seligman (Customs of the World, part xi).





පැවැත්වීමෙන් ඔහු ජීවත්ව සිටියදී ප්‍රසිද්ධව සිටිය කෙනෙක් නම් කලකදී දෙවියෙක් හෝ රෞද්‍ර යකෙක් වන්නේ ය. ''ඉන්දියාවේ එක්තරා ප්‍රදේශයක 'ලාලා' (Hurdeo Lala) නම් මනුෂ්‍යයෙක් ඔහුගේ සහෝදරයා විසින් වස දී මරණ ලදී. මොහු මතක් විටම ඒ පළාතේ වැස්සන් විසින් පන්සලක් තනන ලදී. ටික කලකට පසුව යථොක්ත පන්සලට නුදුරුව තුබුණ ගෘහයන්හි මනුෂ්‍යයෝ කොලරාව වැළඳී මැරෙන්ට පටන්ගත්හ. කොලරාව ඇතිවෙන්ට හේතුව වස කා මළ තැනැත්තාගේ අවතාරය යි ඒ පළාත් වැස්සෝ සැලකූහ. මීට පසුව වස කා මළ 'ලාලා' නම් අය ඒ පළාතේ කොලරාව ආදී වසංගත බෝකරන විශේෂ දෙවියෙක් මෙන් සලකන්ට විය.''* අපරට ජනයාගේ 'කොස්ගම රාළහාමි, දෙවොල් දෙවියෝ, මොරටු දෙවියෝ, ගලේබණ්ඩාර, කැලේබණ්ඩාර, යනාදීහු ද මැරීගිය මනුෂ්‍යයෝ ඉහත කී අන්දමට දේව යක්ෂ සංඛ්‍යාවට පැමුණුන තැනැත්තෝ යි.

''නුවරට නැගෙනහිර කාළවෙළ යක්ෂයා පිහිටවී හෝ කාළවෙළ යකු දෙවොල ඉදි කළේ ය. ඒ චිත්‍රරාජයකු අභයවාපියට භාගයෙහි වාසයකරවී. යක්ෂයෝනියෙහි උපන්නාවූ පූර්වොපකාරී ඒ දාසිය නුවර දකුණු දිග් දොර කෙළෙහි ගුණදන්නා ඒ තෙම වාසය කරවී. වළවාමුඛ යකිනි රජ ගෙවුයන් ඇතුළත වැස්වී උන්ට ද අන්‍යයන්ට ද අවුරුදු පතා බලිදානය කරවී''** මෙය ඉතහ කී කාරණයට ඉතිහාසයෙන් ද සාක්ෂ්‍යයකි. පුරාණ ''මහසෝන්'' රිහිරි කලුකුමාර ආදිහු ද ඉහත කී අන්දමට ඇති වී තිබෙන යක්ෂයන් නුමුත් කල්යාමෙන් ඔවුන් සම්බන්ධව එකතුවී තිබෙන මිථ්‍යා කථාන්තර නිසා ඒ බැව් තේරුම් ගැනීම අපහසු වී තිබේ. මේ අන්දමට යක්ෂයන් සහ දේවතාවනුත් වර්තමාන කාලයෙහි පවා ඉන්දියාවේ වනචාරී ජාතීන් අතර ඇතිවෙන බැව් කියා තිබේ.

නාගයන් සම්බන්ධව අපරට ජනයා අතර නොයෙක් අන්දමේ මිථ්‍යා කථාන්තර පැවත එන්නාක් මෙන් ජපන් රට වැස්සන් අතර ද සිවලුන් පිළිබඳව නොයෙක් අන්දමේ මිථ්‍යා කථාන්තර පැවත එන්නාහ. ස්ත්‍රී වෙස්ගෙන මනුෂ්‍යයන් හා සරණවී සිටී ''නාග කන්‍යාවන්'' පිළිබඳව අපරට ජනයා අතර නොයෙක් අන්දමේ මිථ්‍යා කථා පැවත එන්නාක් මෙන් ජපන්රට මනුෂ්‍යයන් අතර ද ස්ත්‍රී

* Sir A. C. Lyall's "Asiatic Studies"

** මහාවංශය



Scanned with CamScanner

වෙස්ගෙන මනුෂ්‍යයන් සමග සරණ වී සිටි සිවලුන් සම්බන්ධව ද මුඛපරම්පරා කථා පැවත එන්නාහ.

"Fox is accredited with all kinds of supernatural powers. A common and widespread belief is that fox can transform itself into the form of a beautiful woman to bewitch and seduce young men. There are stories of men married to foxes for many years without knowing it fox – woman playing the part of a loving and faithful wife" (Japan by Mme. Yei zaki).

අදහස, (ජපන්රට සාමාන්‍ය මනුෂ්‍යයෝ) සිවලා දිව්‍ය බලයකින් යුත් සත්වයෙකැයි විශ්වාස කරත්. සිවලුන්ට ස්ත්‍රී වෙස්ගෙන තරුණයන් රවටා විනාශයට පමුණුවන්ට පුළුවන යන්න ජපන් රට ව්‍යාප්තව පැතිර තිබෙන විශ්වාසයකි. ස්ත්‍රී වෙස්ගත් සිවලුන් සමග විවාහ වී සිටි මනුෂ්‍යයන් සම්බන්ධව ද කථා ඇත්තාහ. අප රටේ මනුෂ්‍ය වෙස්ගෙන මහණ වී සිටි නාගයන් සම්බන්ධවත් මනුෂ්‍යයන් සමග සරණ වී සිටි" නාගකන්‍යාවන්" ගැනත් පැවත එන මුඛ පරම්පරා කථා ලිවීමට මෙහි ඉඩ නොමැතියි.

තමන්ගේ ශරීරය තුළ භූතයෙක් සිටිනවා යයි සිතන්නාක් මෙන් අනිත් සචෙතනික සියලු සත්වයන් තුළත් ගස් ගල් කඳු හෙල් ආදියේත් ප්‍රාණයක් (භූතයෙක්) සිටිනවා යයි වනචර මනුෂ්‍යයෝ විශ්වාස කරත්. චංචල වීම (Motion) සම්බන්ධව ශාස්ත්‍රානුකූල දැනීමක් නැති ළදරු කල්පනාවෙන් යුත් ඔව්හු ගංගා ඇල දොළවල් ගලා බැසීම වෘක්ෂලතාදිය සෙලවීම වැඩීමාලිදය සිද්ධ වන්නේ ඒවායේත් තමන්ගේ ශරීරයෙහි මෙන් භූතයෙක් (ප්‍රාණයක්) සිටින නිසා යයි සලකත්. ගලක් පෙරළී විත් ඔහුගේ ශරීයෙහි හැපීමෙන් හෝ එහු ළඟක ගැසීමෙන් වේදනාව ඇති වූ කල එය ගලෙහි සිටින අවතාරය (ප්‍රාණය) විසින් කරන ලද්දක් මෙන් සලකනු ලැබේ.

වෘක්ෂලතාදිය පැලවී මැරී යෑම විශාල වෘක්ෂ දෙකක් එකට හැපීමෙන් ශබ්ද පටවීම යනාදිය දැකීමෙන් ඇසීමෙන් ගස් ගල් වෘක්ෂලතාදියෙහිත් භූතයෙක් (ප්‍රාණයක්) සිටින බැව් වැඩිදුරටත් සලකාගන්ට ඔවුන්ට පුළුවන් වේ. වර්තමාන වනචර මනුෂ්‍යයන්ගේ ආගමික් ශාස්ත්‍රයන් දෙකම මේ ළාමක අදහසයි එන්ම චංචලවන්නාවූ සියල්ලෙහිම භූතයෙක් (ප්‍රාණයක්) සිටිනවායයි විශ්වාස කිරීමයි. අහසෙහි ගමන් රකන ඉර හඳ තාරකාදිය ද ප්‍රාණික සත්වයන් මෙන් සලකත්. තවමත් අපරට ඇමිබද පලාත්වල නුගත් ජනයා





ග්‍රහතාරකාදිය දෙවිවරුන් මෙන් හෝ ඔවුන්ගේ "විමාන" මෙන් සලකත්. තවමත් ග්‍රහතාරකාවලට "සෙනසුරු හාමුදුරුවෝ" යයි නම් කරන තේන්ද්‍රකාරයෝ අප අතර සිටිත්.

"ගහයෝ නම් අඹ ර
දෙවියෝ ය ළු සුරපු ර"*

යන්න ලියන්ටත් හේතුව ඉහතකී ළාමක අදහස ශේෂව තිබීම බැව් පෙනේ. අපරට ජනයා අතර තිබෙන වෘක්ෂ දේවතාවන් සහ ජල රකුසන් පිළිබඳ කථා ආදියෙන් යථෝක්ත ළාමක අදහස ස්වල්ප වෙනසක් ඇතුව ශේෂව තිබෙන බැව් තේරුම් ගැනීම අපහසු නොවේ.

"මෙසේ පාපි වූ පුද්ගයා පොළවට වන් කල්හි ඒ වන ලැහැබ වසන්නා වූ වෘක්ෂ දේවතාවා අකෘතඥ මිත්‍රද්‍රෝහි පුද්ගලයාට චක්‍රවර්ති රාජ්‍යශ්‍රීය දීත් සතුටු කරවන්ට නො පිළිවනැයි වන ලැහැබ එකනින් නාද කොට මෙසේ ධර්ම දේශනා කළේ ය."**

"නුගගස දේවතාවාට ආරාධනා කොට," "අපගේ දෙවතාවා රුකින් බැසපීය අතින් කිරිපිඩු පිළිගන්ට උන්වනැයි බියපත්ව"*** යනාදිය ගැන කල්පනා කර බැලිය යුතුයි.

කොග්ගල පළාතේ තිබෙන "දේවාලේගල" යයි ප්‍රසිද්ධ ගල් පර්වතයට බොහෝදෙනා පුදපූජා කරත්. සමහරු මේ පර්වතයට අධිගෘහිත දෙවතාවෙක් සිටිනවායයි සලකත්. සමහරු වැඳුම් පිදුම් කරන නුමුත් කුමන අදහසිකින එසේ කරවාදැයි ප්‍රශ්න කළොත් ඒ ගැන කිසිම විස්තරයක් දිය නො හැකියි. දෙවතාවෝ සිටිනවා යයි ද "අනුහස්" තිබෙනවා යයි ද විශ්වාස කරන අනුපතරින් ගැවසිගත් විශාල වෘක්ෂ පර්වතාදිය අප රටේ බොහෝ ඇත්තාහ.

"(මහිංසාස කුමාරයෝ) එතනට ගොස් දෙදෙනා ම විලට බව පියවර සටහන් දැක මේ විල රාක්ෂය අධිගෘහිත විලක් වුව මැනවයි සිතා කඩුව උරයේ එල්වාගෙන දුන්න නගා දුනුමිට හියලාගෙන සිටියාහු ය"*** "මනුෂ්‍යයෙක් දියෙහි යයි මලයිරට වනචර මනුෂ්‍යයෝ විශ්වාස කරති", මත්ස්‍යයන් වැඩිපුර ඇල්වීමට ශරව් නැවීම ආදිය අපරට මස් මරන්නන් අතර පවතී. ලංකාවේ කොයි

* බුදුගුණාලංකාරය

** සීලව නාගරාජ ජාතකය (ජාතක පොත) *** ථූපවංශය

*** ජාතක පොත

පළාත්වලත් තුගත් මනුෂ්‍යයන් අතර මුහුදු ගංගාවල් ආදියේ ඇතැම් ස්ථානවලට අවුරුද්දකට වතාවක් "බිල්ලක්" වුවමනාය යන විශ්වාසයක් පවතී. මේ ලාමක අදහස් ඉහත කී වනචර මනුෂ්‍යයන්ගේ චංචල වන්නා වූ සියල්ලෙහිම භූතයෙක් සිටිනවාය යන විශ්වාසය නිසා ඇතිවී ශේෂව තිබෙන බැව් බොරු කළ නොහැකි සත්‍යයකි.

"ඉන්දියාවේ බිරර් නම් ප්‍රදේශයේ ශුද්ධ (දෙවි දෙවතාවුන් අරක්ගත්) කැලෑ ප්‍රදේශ බොහෝ ඇත්තාහ. ඒ පළාතේ දරවලට ගැනීමට ලීදඬු ආදිය හිඟ නුමුත් දෙවියන් අරක්ගත් යථෝක්ත කැලෑවලින් වියලී ගිය කෝටුවක් පමණවත් කැඩීමට ඔව්හු ඒ පළාතේ මනුෂ්‍යයෝ) නොයත්."*

දෙවියන් අරක්ගත් මෙබඳු ප්‍රදේශ අප රටෙත් හිඟ නැහැ.

"(ශ්‍රීපාදකන්දේ) සමන්දෙවියෙන්ගේ අලංකාර උද්‍යානය අසලදී කිසිවෙකුට සතෙකු මැරිය නොහැක්කේ ය. මේ බව හොරතලා දන්නේ ය. ඒ බව වින්සන්ට් එකිසිත් විශ්වාස නොකළේ ය."**

මේවා එකිනෙකට කියනට ඔනෑ නොවේ. කල්පනාවන්ත මනුෂ්‍යයෙකුට නම් අප අතර මේ ශේෂව ලාමක අදහස් ඇතිවී තිබෙන අන්දම හොඳින් තේරුම් ගත හැකියි.

ගසකට යට වී කෙනෙක් මැරුණොත් ඔහුගේ නෑදෑයන් එකතු වී යථෝක්ත වෘක්ෂය කපා සුණුවිසුණුකිරීම ඇතැම් වනචර ජාතීන් අතර පවතින සිරිතකි.

"ඒ කුමර තෙමෙ රථ නැගී නිසාවැවට යන්නේ මව් සමග මගහොත් ඉතා තරුණ වස්සෙකු රියසකින් බෙල්ල ඇක්මනොදත මැරුයේ ය. ඒ දෙන් තොමෝ කිපි සිත් ඇත්තී ගොස් ඒ මිණි ගෙඩිය ගැසුවා, රජතෙමේ චක්‍රයෙන්ම පුත්‍රයාගේ හිස සිඳවී."

"තල්රුකෙක (කැදල්ලෙක හුන්) ලිහිණි පැටියෙක් එක් සර්පයෙක් කෑයේ ය. ඒ පැටියාගේ මව් ලිහිණි තොම මිණිය ගැසුවා. රජතෙමේ ඒ සර්පයා ගෙන්වා උගේ බඩ පලා ඒ පැටියා බැහැර කොට තල්ගස ඇතගැස්වී."

"එක්මැහැල්ලක් තොමෝ වී වේලන්ට අව්වෙහි දමුවා. නොකල් වැස්සෙක් වැස ඒ වී තෙමුයේයි. ඔතොමෝ වී ගෙන

* Sir A. C. Lyall's "Asiatic Studies"

** වාසනාවන්ත විවාහය - පියදාස සිරිසේන





ගොස් ඒ මිණිය පහළා. ඒ අකල්වැස්ස අසා මැහැලි යවා රජතෙමේ දහමිහි වැටෙන්නේ සුදුසු කල වර්ෂාව ලබායයි ඇයගේ බස විනිශ්චය කරනු පිණිස පෙහෙව හොත්තේ ය*." යනාදිය ගැන කල්පනා කලයුතුයි.

ජලෙ විෂ්ණුඃස්ථලෙ විෂ්ණුඃවිෂ්ණුපර්වත මස්තකෙ

ජ්වාල මාලා කුලෙ විෂ්ණුඃ සර්වං විෂ්ණු මයං ජගත්

යන්න 'ලෝකයේ ඇත්තාක් මිථ්‍යා ආගම්වල මුල'** යයි උගත් භික්ෂූන් වහන්සේ කෙනෙකුන් විසින් ලියා තිබේ. චංචල වන්නා වූ සියල්ලෙහිම තමන්ගේ ශරීරයෙහි මෙන් ප්‍රාණයක් (භූතයෙක්) තිබෙනවාය යන වනචාරි මනුෂ්‍යයන්ගේ විශ්වාසය මිථ්‍යා ආගම්වල නොව යක්ෂ ප්‍රේතාදීන්ගේ මුල බැව් කීවා නම් ශාස්ත්‍රයට යුක්තියට ගැලපෙන බව පෙනේ. නුමුත් ඉහතකී ශ්ලෝකයෙන් එබඳු ලාමක අදහසක් නොව උසස් ආත්මික හැඟීමක් ප්‍රාකශ වේ.

සචෙතනික අචෙතනික සියල්ලෙහිම එක සමාන ප්‍රාණයක් තිබෙනවායයි සලකන වනචාරී මනුෂ්‍යයෝ අහස ගෙරවීම, වෘක්ෂ ලතාදිය බිඳ හෙළමින් හමන මාරුතය, අග්නිහුදරයන්ගෙන් ගිනි පිටවී හාත්පස විනාශවීමාදිය රෞද්‍ර යක්ෂ ප්‍රේතයන්ගේ වැඩ මෙන් සලකත්. මේ සියල්ලටම වඩා ඔවුන්ට භය උපදවන්නා වූ ලෙඩ දුක් සෑදීම හා මරණය රෞද්‍ර යක්ෂ, ප්‍රේතයන්ගේ වැඩ මෙන් සලකත්. අසරණ වූ මොවුන්ට යථෝක්ත භූත පිශාචාදීන්ගේ ගැලවීටම වෙන කිසිම මාර්ගයක් නැති බැවින් ඔවුන්ට යාච්ඤා කරන්ටත්, පුද පූජා පවත්වන්ටත් පටන්ගනිත්. උත්පත්තිය, මරණය, විවාහය යනාදි ප්‍රස්තාවයන්හිදී අපරට ජනයා පමණක් නොව ලෝකයේ ශිෂ්ටාචාර කොයි ජාතීන් විසිනුත් පවත්වනු ලබන සිරිත් විරිත් වලින් සමහරක් අපේ මුල් මනුෂ්‍යයන්ගේ ලාමක අදහස් නිසා ඇතිවී ශේෂව තිබෙන ඒවා බැව් සත්‍යයකි.

"පැරගුවේ (Paraguay) රට මනුෂ්‍යයෝ මෙස ගර්ජනා සහිත තද කුණාටුව ඇතිවූ කල එය ඔවුන්ට අනතුරු කිරීමට යක්ෂ ප්‍රේතයන් විසින් කරන ලද්දකැයි සිතා දුනු, පොලු, මුගුරු ආදිය ගෙන කෑ කෝ ගසමින් යුද්දයට එළඹෙත්" මෙස ගර්ජනාව ඇතිවීමට හේතුව අහසෙහි දෙවිවරු දෙදෙනෙක් අතර ඇතිවෙන කෝලාහලයකැයි

* මහාවංශය

** බෞද්ධ ලබ්ධි විශොධනය

ගම්බද පලාත්වල නූගත් මනුෂ්‍යයෝ සලකත්. "එකෙකෙණි ශක්‍රදේවේන්ද්‍රයාගේ පාඬු කම්බල ශෛලාසනය උනුවිය. ඒ කාරණාව දන වස්සවලාහක දිව්‍ය පුත්‍රයා කැඳවා, දරුව ....... වහා සියලු කොසොල් රට එක මෙඝය කොට වර්ෂාව වස්වයි විදාන කළේ ය"* යන්න ලිවීමටත් හේතුව යථොක්ත ළාමක අදහස බැව් කියන්ට උවමනා නොවේ.

අදෘශ්‍යමාන යක්ෂ ප්‍රේතාදීහු සිටිනවාය යන විශ්වාසය ඇතිවන ශිෂ්ඨ නූගත් මනුෂ්‍යයන් අතර විපත්තිදායක ළාමක අදහස් රාශියක් ඇතිවීමට ප්‍රධාන හේතුවක් විය. අදෘශ්‍යමාන යක්ෂ ප්‍රේතයන්ගෙන් ලෝකය පිරී තිබෙනවාය යන විශ්වාසය සියලුම වනචර මනුෂ්‍යයන් අතර තිබේ.

"ආකාශයෙහි පමණක් නොව වනාන්තර කඳු හෙල් ආදි සියලු තන්හිම යක්ෂ ප්‍රේතයෝ පිරී සිටිත් යනු ඔස්ට්‍රේලියාවේ පදිංචි කාරයන්ගේ බලවත් විශ්වාසයකි." ප්‍රේතයෙක් ස්පර්ශ නොවී දොරට බහින්ට හැරී ය, ගේ ඇතුළේ ද කෙළගැසූ තැන ද සියලු තන්හි ප්‍රේතයෝ පිරී සටිනවාය" යි අපරට නූගත් ජනයා විශ්වාස කරත්.

මහ සොහොන් යක්ෂයා ද යන එන සඳ අන්‍යයන්ට නොපෙනෙන පරිද්දෙන් තමාට සැඟවී සිටින්ට අන්ධකාරයෙන් රහස් තැනක් ද, ආකාශයේ ඝණ වලාකුලෙන් තමා වටකොට මණ්ඩපයක් ද සාදාගන්නේයයි කියා (යමතග්ගි විශිෂ්ට කාශ්‍යපාදී) ඍෂිවරයන් දසදෙනා විසින් කරන ලද (ගෞරීගේ) ස්වාමී වූ මහදෙවියා සම්බන්ධවූ මන්ත්‍ර ශාස්ත්‍රයෙහි කියාතිබේ.**

යක්ෂයන් පිළිබඳව යථොක්ත අතීත වර්තමාන අනාගත තුන් කල් පෙනෙන්නා වූ මහර්ෂින්ගේ කියමන එබඳු දිව්‍ය ඥානයක් නැති බැබිලෝනියාව ආදී රටවල මනුෂ්‍යයන්ගේ යක්සයන්ගේ වාසස්ථාන අවකාශයෙහි වූහ. ඔව්හු මනුෂ්‍ය ඇසට නො පෙනෙන්නාහ" යන විස්තරය හා සමානකර බලනු. මහමත් භක්තිකයන්ගේ 'ජීන්' නම් යක්ෂ සමාගමෙහි කොම්පැනි හතළිහක් සහ එක කොම්පැනියට හයලක්ෂය බැගින් යක්ෂ ප්‍රේතයෝ සිටිත්. "සතාගිරි නම් හෙමවත නම් යක්ෂ සෙනාධිපතිහු දෙදෙනා බුදුන් දෙව්රමහි වැද යක්ෂ සමාගමයට යමහ යි සහ පිරිවරින් නත් නත්

* මච්ඡ ජාතකය (ජාතක පොත)

** දුර්වාදීහෘදය විදාරණය





යානායෙන් අහසින් යෙති."* මෙය අපේ යක්ෂ "කොම්පැනියක" ප්‍රධානාසනය පිළිගැනීමට ගිය යමෙක් සහ ඔහුගේ පිරිස ගැනත් ලියන ලද්දකි. අසූ ලක්ෂයක් දෙවි දෙවතාවෝ සිටිනවායයි ජපන්රට වැස්සන් විශ්වාස කරන්නාක් මෙන් අපරට ජනයාතේ තිස්තුන් කෝටියක් දෙවි දෙවතාවුන්ට පින්දීම අතපසු නොකරත්.

සත්ව ශරීරය කපා කොටා බලා අවයවයන්ගේ විශේෂ විභාග දන සිටින ශාස්ත්‍රඥයන් සිටින්නාක් මෙන් යක්ෂයන්ගේ ශරීර කපා කොටා ඒ සම්බන්ධව විශේෂ විභාග දන සිටින්නෝ ද වර්තමාන කාලයෙහි අප අතර සිටිත්.

"සමහරු භූත පිශාච වර්ගයන් කෙරෙහි යකුනුත් ගණන් ගනිති. ඒ සාපරාධයකි. යොනි වසයෙන් පවා ඔවුන්ගේ විසංකරත්වයක් ඇති හෙයිනි!"** මෙය සත්ව විද්‍යාව අත් දත් අය ඒ ඒ සත්වයන්ගේ ශරීර පරීක්‍ෂාකොට 'කොඳු ඇටය ඇති සත්වයන් සහ කොඳු ඇටය නැති සත්වයෝ" යනාදි වශයෙන් සත්වයන් පිළියෙල කරන්නාක් මෙන් අපරට පඬිවරයෙකුගේ 'යක්ෂ ප්‍රේත භූත පිශාචාදීන් පිළියෙළ කිරීමකි' "අන්දයෙක් කළුවර කාමරයක කළු බළලෙක් සිටිනවායයි සිතා ඌ අල්ලන්ට තැත්කරන්නාක් මෙනි" ය කියන්නේ මෙබඳු ඒවාට හේමා!

ලෝකයේ ශාස්ත්‍රාලෝකය පැතිර යන මේ කාලයේ යක්ෂ ප්‍රේත භූත පිශාචාදීන්ට ක්‍රියා කිරීටම අන්ධකාර ස්ථාන ශිෂ්ටාචාර ජාතීන් අතර නැතිවේගන යන්නාහ. ශාස්ත්‍රය නමැති රාම කුමාරයා විසින් නූගත්කම නැමැති රාවණා සහිත යක්ෂ ප්‍රේත භූත පිශාචාදීන් සහ මිථ්‍යා දෙවි දෙවතාවන් නැමැති පිරිස ද විනාශකර දමන ලද්දාහ."

මෙහිදී ලීලාගේ මැණියන් විත් ඇට කථා කළ බැවින් පොත කියවීම නවත්වන්ට සිදුවිය.

මැයි මස 18 වෙනි දින සිරි නිවසෙහි පමණක් නොව ඒ පළාත් වාසීන්ට ද ඉතා ප්‍රීතිමත් දවසක් විය. මෙදින සිරිනිවස ඉතා අලංකාර ලෙස සරසා තිබුණේ ය. රත්නවීර නොතාරිස්ගේ නෑ මිත්‍රාදීහු ද එදින සිරි නිවසට පැමිණෙන්ට වූහ. ලීලා සහ ගිල්බට්ගේ

* අමාවතුර

** එච්. ඇස්. මයුරපාද (සිළුමිණ)



Scanned with CamScanner

විවාහ බන්දනය රිජිෂ්ට්‍රාර් තැන ගෙන්වා සිරි නිවසෙහිදීම කිරීමට සූදානම් කර තිබුණේ ය. නියම වේලාවට රිජිෂ්ට්‍රාර් තැන පැමිණ ඇ ස්ව උන් සමූහයා ඉදිරියෙහි විවාහ බන්ධනය සිදු කිරීමට කටයුතු සූදානම් කළේ ය.

රිජිෂ්ට්‍රාර්තැන ඉදිරියෙහි තිබුණ අලංකාර මේසය දෙපාර්ශ්වයේ තබන ලද පුටු දෙකක ලීලා සහ ගිල්බට් ද වාඩි වී සිටියේ ය. මේ වෙලාවේදී මෙහි සිටි සියලුදෙනාම ප්‍රීති සහගත සිනහ සහිත මුහුණු වලින් යුක්තව සිටිනුමුත් ලීලාගේ මුහුණ පමණක් ඉතා මලානික ස්වභාවයක් ඉසුලුවේ ය. මේ වේලාවේදී ඇ අන්‍යයන් අණකළ පරිදි ක්‍රියාකළා මිස ඇගේ සිතින් යමක් සිතා ඒ අනුව ක්‍රියා නොකළා ය. ඇට කිසිත් කල්පනා කරන්ට නොහැකි විය. ඇ තුළ තිබුන චින්තනය කිරීමෙ බලය නැතිවුනාක් මෙන් ඇට කිසිත් කල්පනා කරන්ට නොහැකි විය.

රිජිෂ්ට්‍රාර්තැන ගිල්බට් ලවා කියවිය යුතු වාක්‍ය කියවා ඔහු අත්සන් තබන තුරා බලා සිටියේ ය. මෙහිදී එහි සිටි කිසිවෙක් නාඳුනන්නා වූ තරුණයෙක් සහ ඉතා රූප සම්පන්න තරුණියක් ද පැමුණුණාහ. මේ අමුත්තන් දෙදෙනා දුටු ගිල්බට් එකෙණෙහිම ගල්වුණාක්මෙන් පුටුවෙහි වාඩි වී සිටියේ ය. ඔහුගේ නලළෙහි ඩහදිය පැතනැංගේ ය. සකල ශරීරය ගැහෙන්නට විය. මේ විප්‍රකාරය අන්‍යයන්ට නොහැගෙනසේ ක්‍රියා කරන්ට උත්සාහ කිරීමෙන් එය වඩ වඩාත් ප්‍රකාශ විය. එහි සිටි සියලු දෙනාම මේ කුමක් සිදුවෙන්ට යනවාදැයි මවිතව බලා සිටියෝ ය.

''මිත්‍රය ගිල්බට් මා නාඳුනන්නාක් මෙන් ඉන්නේ මන්දැයි'' තරුණයා ප්‍රශ්න කළේ ය.

''මා අඳුනන්ට බැරිද'' යි නැවතත් කථාකරමින් ඔහු කෝට් සාක්කුවේ අතදමා කඩදාසියක් ගෙන එය විවාහ රිජිෂ්ටාර් තැන අතට දුන්නේ ය. ''අපේ මේ ප්‍රවෘත්තිය දනුම් දෙන්ට කලින් එන්ට බැරිවිය. අපට දනගන්ට ලැබුණේ ප්‍රමාද වෙලා. අපි දනගත් හැටියේම පිටත්වී ආවා ය'' යි කියමින් කථාව නවත්වා රිජිෂ්ට්‍රාර් තැන දෙස බලා සිටියේ ය.

කර්දාසිය කියෙවූ සියල්ලෝම ලජ්ජාවට සහ පුදුමයට පත්වූවෝ ය. මේ ලියවිල්ලෙන් මීට ස්වල්ප කලකට පෙර ගිල්බට්





මේ ඇවිත් සිටින තරුණිය හා නීති ප්‍රකාර විවාහ වී තිබෙන බැව් ප්‍රකාශ වේ. ඔව්හු කාරණය තේරුම්ගෙන ලජ්ජාවට පත්ව සිටි නුමුත් වැඩි විස්තර දනගැනීමට අකමැති නොවූහ. ඒ බැව් දනගත් තරුණයා ගිල්බට්ගේ රහස් විවාහය සම්බන්ධව විස්තර කියන්ට පටන්ගත්තේ ය.

''ගිල්බට් මගේ මිත්‍රයෙකි. වේයන්ගොඩ සිටි කාලයේදී ඔහු මා ආශ්‍රය කරමින් උන්නේ ය. ගිල්බට් මැ සමග නීති ප්‍රකාර විවාහ වුණ බැව් අදවන තුරු කල්පනා කරන්ට නැහැ. විවාහ රිජිෂ්ට්‍රාර්තැනට උපකාරකොට ඇ ඉදිරියෙහි නීතිප්‍රකාර විවාහය සිදුකරන්නාක් මෙන් අඟවා බොරුවට කටයුතු කොට ඇ රවටන්ට උත්සාහ කළ නුමුත් අපි ඊට ඉඩ නුදුන්නෙමු. ගිල්බට්ටත් හඟවන්නේ නැතිව නීති ප්‍රකාර විවාහය සිද්ධකරන ලදී. ගිල්බට් රැවටුණා මිස අහිංසක ඇ රැවටුණේ නැහැ.'' මෙහිදී තරුණියගේ ඇස්වලින් කඳුලු වැගිරෙන්ට වන ඇ ලජ්ජාවෙන් මිරිකී බිම බලාගෙන සිටියා ය.

''ගිල්බට් ඇ සමග නිතිප්‍රකාර විවාහ වුණේ නැතැයි ගිල්බට් මෙපමණ දවස් සිතා ඉන්ට ඇති. අපේ වැරැද්දෙන් ඔහුට ඒ බව කලින් දන්වන්ට බැරිවි ය. කලින් දැන්නුවා නම් ගිල්බට් මේ අන්දමට ක්‍රියා කරන එකක් නැහැ. ඒ මගේ වැරැද්දයි. ගිල්බට්ට ඇ තුළ සැබෑ ආදරයක් තිබෙන බැව් ගිල්බට් දන්නවා ඇති එමෙන්ම ගිල්බට්ගේ සිතෙහිත් ඇට ආල ඇතුවාට සැක නැහැ.''



Scanned with CamScanner

# 12 පරිච්ඡේදය

An unbroken continuity can be traced between most of our customs and those of our forefathers, who in their turn, received them from their savage ancestors.

*Prof. A. C. Haddon, SC. D. F.R.S.*

ගිල්බට් සමග විවාහවීමෙන් ලීලාට සිදුවෙන්ට ගිය භයානක අනතුරෙන් ඇ බේරීම සොම්නස්වීමට හේතුවක් නුමුත් මේ නිසා හටගත් ශෝකයෙන් ඇගේ මහලු මව රෝගාතුරවීම ඇට දරිය නොහැකි කනගාටුවක් විය. ඇගේ මවගේ සනීපයට උවමනා කටයුතු කරමින්ම කාලය ගත කළායින් ඇට වෙන කිසිවක් ගැන කල්පනා කරන්ට කාලයක් නැතිවිය. ඇ නිතරම රෝගාතුර වූ මවට සත්කාර කරමින් ඇ ළගම කාලය ගත කළා ය. තුන් හතර දවසක් ගතවුණාට පසු ඇගේ මවට ටිකක් සුව ලැබුණේ ය. මෙය ලීලාගේ සිතේ කනස්සලු ස්වභාවය අඩු වී වෙන වෙන කාරණා ගැන කල්පනා කරන්ට හේතුවිය. දිනක් ඇ වැඩපල ඉවරකොට ඇගේ කාමරයට ගොස් සයනයක හාන්සිවී පසුගිය ජීවිතය ගැන කල්පනා කරන්ට පටන් ගත්තා ය.

ඇ පොඩි කාලයේ පාඨශාලාවට යද්දී ඇල්බට් සමග එකට සෙල්ලම් කරමින් කාලය ගත කළ හැටිත් පසුව ඔහුට ඇගේ සිතෙහි ඇති වූ බලවත් ආදරය ගැනත් ඔහු ප්‍රසිද්ධයේ ඔහුගේ අදහස් ප්‍රකාශ කරන්ට පටන් ගැනීමෙන් ඒ පළාතේ බොහෝ දෙනා ඔහු සමග විරුද්ධ වූ හැටිත් ඔහු කරන්ට නැත් කළ අපරාධය නිසා ඇගේ මව් පිය දෙදෙනා පමණක් නොව ඇත් ඔහු පිළිකුල් කරන්ට පටන්ගත් හැටිත් කල්පනා කළා ය. "හා මගේ වාසනාවකට මෙන් ගිල්බට් ගෙන් බේරෙන්ට ලැබුණා නෙව ද?" ඇ කල්පනා කළා ය. "නුමුත් එයින් මගේ හිතේ කනගාටු වැඩිවුණා මිසක් අඩුවුණේ නැහැ. ගිල්බට් සමග විවාහ වෙන්ට කැමැත්ත දුන්නේ මගේ මව නිසයි." ඇගේ මතු ජීවිතය ගැන ඇ කිසිත් කල්පනා නොකළා ය." ඇල්බට් හා



ඔහු කොහේද? එහු කුමක් කරනවා ද? ඔහු වෙනස් මිනිහෙක් වෙලා ඇති" ඇල්බට් භාරයාවක් සරණ පාවාගෙන සිටින හැටි ඇගේ සිතෙහි සිතියම් කරත්තා ය.

මෙසේ කල්පනා කරමින් ඇ ඉදිරියෙහි මේසය අඩ තිබුණ පොතක් අතට ගත්තා ය. එය ලීලා ස්වල්ප දවසකට පෙර කියවමින් සිටි ඇල්බට්ගේ ලියවිල්ල ප්‍රසිද්ධ වී තිබුණ සඟරා විය. ඇ පළමු දවසේ එහි තිබුන ලියවිල්ල කියවමින් සිටින විට මැණියන් ඇට කථාකොට ඇ පොත කියවීම නවත්වා එහි ගිය බැවින් එය කියවා ඉවර කරන්ට බැරිවී ය. ඇල්බට් ගැන තොරතුරු දැන ගැනීටම දැන් ඇ වැඩියත් ආශාවෙන් සිටින බැවින් ඇල්බට්ගේ ලියවිල්ලේ ඉතිරි කොටස ඉතා ආශාවෙන් කියවන්ට පටන් ගත්තා ය.

"මේ ළගට මන්ත්‍ර ශාස්ත්‍රය ගැන ටිකක් පරීක්‍ෂා කර බලමු. මන්ත්‍රයක් කවියක් හෝ යම්කිසි වචනයක් කීමෙන් යම්කිසි අර්ථයක් සිද්ධකළ හැකියයි සිහි ඇති මනුෂ්‍යයෝ විශ්වාස නොකරත්. යන්ත්‍ර මන්ත්‍ර කොඩිවිනාදි ය කිරීමෙන් ඒ විශ්වාස කරන රැවටෙනසුලු මනුෂ්‍යයන්ගේ සිතෙහි වෙනසක් ඇතිවීමෙන් යම් කිසි අර්ථයක් සිදුවෙනවා යයි සලකා ගනු මිස මේවා විශ්වාස කරන්නන් කියන අන්දමට යක්ෂ ප්‍රේත දෙවි දෙවතාවුන්ගේ බලයකින් හෝ "දිව්‍යමය අනුගසකින්" සිද්ධවෙන ඒවායයි සිහි ඇති මුනුෂ්‍යයෝ පිළිගැනීමට පසුබට වෙත්. යන්ත්‍ර මන්ත්‍ර ආදියෙන් ලෙඩ සුවකිරීමට "බොරු මනස්කාර සුවය"* යයි නම් කිරීම ඉතා සෑහේ. මන්ත්‍ර මන්ත්‍ර ආදිය පිළිබඳව "රහසක්" තිබෙනවා යයි විශ්වාස කරන්නන් ඉහතකී "බොරු මනස්කාර සුවය" යන වචනයේ අර්ථය තේරුම්ගන්ට උත්සාහ කරනවා නම් "විස්තර කළ නොහැකි රහස" නැති වී යනවාට සැක නැත්තේ ය.

යන්ත්‍ර මන්ත්‍ර කොඩිවින වස් කවි සෙත් කවි ආදිය ද
"එ ක ය ම ර ජ අ ණ න ළ අං අවා ක ර
උ ප බ ග හා නරනම්තිරි වේ අම ර

යනාදිය සහ

අඹ ත ල ඇ වග වණ සිටි පිළි වෙළි නා
යොදා නකුල් මියු මහවත් වග සපු නා"**

---

* ව්‍යි සිරණ
** සිදත් සඟරාව

යනාදිය ද බෞද්ධාගමෙහිත් උසස් ඉගැන්වීමක් වූ මෛත්‍රී ප්‍රත්‍යය ධර්මය අනුව ආරක්ෂා කරන්නේ කෙසේදැයි නොදනිමි. මේවා හේතු ඵල සම්බන්ධයට අනුකූල ද?

මන්ත්‍ර ශාස්ත්‍රය නමින් ලෝකයේ ශිෂ්ටාචාර ජාතීන් අතර ශේෂව තිබෙන මේ ළාමක අදහස් ඇති වී තිබෙන අන්දම තේරුම් ගැනීමට වර්තමාන වනචර ජාතීන් අතර තිබෙන ඒ සමානම ළාමක අදහස් හා සංසන්දනය කර බැලිය යුතු යි. අප රට මන්ත්‍රකාරයන් යම් මනුෂ්‍යයෙකුට කොඩිවිනයක් කරන්ට උවමනා වූ විට ඔහුගේ ශරීරයට අයිති නිය පොත්තක් ඉසකේ රොදක් ගැනීමට හේතුව කුමක් ද? මීට යම් කිසි හේතුවක් තිබෙන බැව් අපට නොපෙනේ. මීට සම්බන්ධ කළහැකිව තිබුණ ළාමක අදහස අප අතරින් නැති වී ගොස් තිබෙන බැවින් එය තේරුම් ගැනිම අපහසු වී තිබේ. නුමුත් මේ අන්දමින් ම කොඩිවින පුරුදු කරන වනචර මනුෂ්‍යයන්ට නියපොත්තක් හිසකේ රොදක් ආදි කොඩි වින කළ යුතු තැනැත්තාගේ ශරීරය සම්බන්ධ වූ යම්කිසි ද්‍රව්‍යයක් ගැනීටම කරුණු තිබේ. එකට සම්බන්ධව තිබෙන යම් වස්තුවකින් කොටසක් වෙන්කොට ඒ වෙන් කළ කොටසට යම් අනර්ථයක් සිදු කළොත් අනික් වෙන්ව තිබුණ කොටසට ද ඒ අනර්ථය සිදුවෙනවා ය යනුවෙන් ද්‍රව්‍යයන්ගේ සම්බන්ධයක් තිබෙනවා යයි ඔව්හු (වනචර මනුෂ්‍යයෝ) විශ්වාස කරත්. මෙබඳු විශ්වාසයක් ඇති වනචර මනුෂ්‍යන්ට නිය පොත්කක් හෝ හිසකේ රොදක් ගෙන ඊට යම් කිසි අනර්තයක් සිදු කිරීමෙන් යථෝක්ත නිය පොත්ත හෝ හිසකේ රොද අයිති තැනැත්තාට ද අනර්ථයක් සිදු වෙනවායයි සිතා ගැනීම අපහසු නොවේ. මේ අන්දමට කොඩිවින වලට ගන්නවාට බියෙන් නියපොතු දත්, හිස කේ, සෙම්, සොටු ආදි ශරීරය හා සම්බන්ධ වූ ද්‍රව්‍යයන් කිසිවෙකුට ගත නොහැකි වන සේ තැන්පත් කර තැබීම ඔස්ට්‍රේලියාව, මැලනිසියාව, අප්‍රිකාව ආදී රටවල වනචර මනුෂ්‍යයන් ගේ සිරිතකි. මේ පුරුද්ද තවමත් ශිෂ්ටාචාර මනුෂ්‍යයන් අතර පවා ශේෂව තිබේ.

දතක් වැටුණු විට හෝ නියපොතු කැපූවිට කොඩි විනවලට ගන්නවාට බියෙන් ඒවා ප්‍රවේසම් කර තැබීම හෝ පස්යට කර තැබිම අපරට ගම්බද පලාත්වාසීන් අතර තවමත් ශේෂව තිබෙන සිරිතකි. හිස පීරීමෙන් පනාවෙහි පැටලැවී එන හිසකෙස් කෙලගසා





ඉවත ලැම හෝ පස්යට කර තැබීම ද ගම්බද පලාත් වාසීන් අතර තිබෙන සිරිතකි. ජර්මනියේ සමහර පලාත්වල මනුෂ්‍යයන් ද කොඩි වින වලට ගන්නවාට බියෙන් දත්, නියපොතු ආදිය කැපූවිට ඒවා පස්යට කර තබන බැව් කියා තිබේ.

"හවායි දූපත් වල ස්වදේශ ජන ප්‍රධානියෙක් ගමනක් යනවිට කෙළගැසීමට ඔහුගේ වැඩකරුවෙක් විසින් පඩික්කමක් ඇරගෙන යායුතු වේ."

බිම කෙළගැසූ විට එය පාදයෙන් මකා දැමීම අපරට ජනයා අතර පමණක් පවත්නා සිරිතක් නොව කොයි රටවලත් නූගත් ජනයා අතර තවමත් පවතින සිරිතකි. මේ සිරිත ඇති වී තිබෙන්නේත් ඉහත කී ළාමක අදහස නිසා බැව් මෙහි සඳහන් කළ යුතු නොවේ.

කොඩිවින කිරීමට ඔහුගේ ශරීරය හා සම්බන්ධ වූ දෙයක්ම වුවමනා නොවේ. කොඩිවින කළයුතු තැනැත්තා හඳින වස්ත්‍රයෙන් කැබැල්ලක් හෝ ඔහු නිතර පාවිච්චි කරන යම් බඩුවකින් සුළු කොටසක් හෝ කොඩිවිනය කිරීමට ප්‍රමාණ වේ. යමෙක් හඳින වස්ත්‍රයේ සහ එය අඳින තැනැත්තාගේ ද සම්බන්ධයක් තිබෙනවා යයි සලකන බැව් මෙයින් පෙනේ. වස්ත්‍රයට හෝ ඉන් කොටසකට යම් අනර්ථයක් සිදු කළොත් ඒ වස්ත්‍රය පාවිච්චි කළ තැනැත්තාට ද අනර්ථයක් සිදුවෙනවා යයි සිතා ගැනීම වනචරයින්ට අපහසු නොවේ. අපරට ගම්බද පලාත්වල නූගත් ජනයා අතර "මුවන්තිස්ස කුමාරයාගේ කථාව" නමින් තිබෙන මුඛ පරම්පරා කථාවෙන් ද යථෝක්ත විශ්වාසය ඉතා පැහැදිලිව ප්‍රකාශ වේ. මුවන්තිස්ස කුමාරයාගේ ජීවිතය නැති කරන්ට ඕනෑවූ විට ඔහු පාවිච්චි කළ රන් කඩුව එක්තරා මහලු ස්ත්‍රියක් විසින් සොරකම් කොට ගින්දරට දැමීමෙන් යථෝක්ත කඩුව ටිකෙන් ටික උණු වෙනවාත් සමඟම කුමාරයාගේ ප්‍රාණය හානිවේගන ආ බවත් යථෝක්ත කුමාරයාගේ මිත්‍රයෙක් විත් ගින්න නිවා රන් කඩුවේ නොදා ශේෂව තිබුන ස්වල්පය බේරා ගැනීමෙන් මුවන්තිස්ස කුමාරයා මරණයෙන් බේරුණ බවත් යථෝක්ත මුඛ පරම්පරා කථාවෙන් ප්‍රකාශ වේ. මෙයින් යථෝක්ත කුමාරයා නිතර පාවිච්චි කළ කඩුවෙන් ඔහුගේත් සම්බන්ධයක් තිබෙනවාය යන විශ්වාසය හොඳින් ප්‍රකාශවේ.

යමෙකුගේ පාදයට ස්පර්ශ වූ ධූවිලි ටිකක් ගෙන ගිනි උදුනෙහි දැමීමෙන් ඔහුට වේදනාව ඇතිවෙනවා යයි ද ඔහුගේ පා සටහන වූ



Scanned with CamScanner

ස්ථානයෙහි යකඩ ඇණ බෝතල කටු ආදිය ගැසීමෙන් ඔහු කොරවෙනවා යයි ද සමහර විට මරණයට පත්වෙනවා යයි ද යන විශ්වාසය ජර්මනියේ ඉතා ප්‍රකටව තිබෙන බැව් කියා තිබේ. ඕස්ට්‍රේලියාව අප්‍රිකාව ආදී පළාත්වල වනචර මනුෂ්‍යයෝ ද ඔවුන්ගේ සතුරෙකුට අනතුරු කරන්ට උවමනා වූ විට ඔහුගේ පාද සටහන ඇති වූ ස්ථානයෙහි බෝතලකටු තිරුවානා ගල් ආදිය ගසත්.* අපරදි කෙඩිවින කාරයන් ද මේවා පුරුදු කරන බැව් ගම්බද පළාත්වල තොරතුරු දන්නෝ දනිත්.

මනුෂ්‍යයෙකුගෙන් ඔහුගේ පාදයට ස්පර්ශවන ධූවිලි ටිකෙහිත් පවා සම්බන්ධයක් හෝ ඔහු පාගන ලද ධූවිලිවලටත් ඔහුගේ ගතිය ඇති වෙනවාය යන විශ්වාසය මෙයින් ප්‍රකාශ වේ.

''පණ්ඩිතයන් වහන්සේ උඩ නොබලාම පවනට බැ වේගයෙන් දිව උකුස්සාගේ ඡායාව මැඩගෙන, අත්ලෙන් අත්ල ගසා මහත් වූ නාද කළසේක. ඒ මහතාණන් වහන්සේගේ ආනුභාවයෙන් ඒ නාද උකුස්සාගේ ළෙහි ඇනී පිටින් නැගෙන්නා සේ වූයේ ය. ඒ උකුසු භයපත්ව මස් වැදැල්ල හෙළී ය''* මෙහි ''උකුස්සාගේ ඡායාව මැඩගෙන'' යන්න ගැන කල්පනා කර බැලිය යුතුයි. මෙයින් උකුස්සාගේත් උගේ ඡායාවෙන් සම්බන්ධයක් ගැන ප්‍රකාශ නොවන්නේ ද?

පුරාණ උත්තමයන්ගේ වස්ත්‍ර හෝ ඇටකටු ආදියෙහි ''අනුහසක්'' තිබෙනවාය යන විශ්වාසය ඇතිවීමට හේතුව ඉහත අදහසම බැව් තේරුම් ගැනීම අපහසු නොවේ. ජීවත්ව සිටියදී ඔවුන් තුළ යම් බලයක් යම් ගුණයක් පැවතුණා ද ඒ ගති සියල්ලම ඔහුගේ ඇටවල ද නිතර පාවිච්චි කරන වස්ත්‍ර වල ද ඇති වෙනවායයි සිතීම අපහසු නොවේ.

යම් යම් ද්‍රව්‍ය කෑමෙන් හෝ පාවිච්චි කිරීමෙන් ඒවායේ ගතිය ඒ පාවිච්චි කරන හෝ කන තැනැත්තාට ද ඇතිවෙනවා යයි විශ්වාස කරන බැවින් ඇමරිකන් ඉන්දියානු මනුෂ්‍යයන් සහ තවත් නොයෙක්

* These are also the practices of Australian and other savages. Sharp fragments of quartz, glass, bone or charcoal are buried in the foot-prints of the victim. They are supposed to enter the victim, and rheumatic affections are very frequently attributed to them. – Prof. Haddon's Magic and Fetishism.

* උම්මග්ග ජාතකය. (මංග ප්‍රශ්නය)





වනචර මනුෂ්‍යයෝ වලස් නියපොතු පළඳිත්. මෙයින් වලසෙකුට මෙන් නපුරුකමත් ධෛර්යයත් ඇතිවෙනවා යයි විශ්වාසකරත්. ගිජුලිහිණියෙකුට මෙන් ඇස් පෙනීම ඇතිවීමට ගිජුලිහිණි පිහාටු පළඳිත්. අනතුරකදී උකුස්සකුමෙන් වේගයෙන් පළායෑමට ළදරුවන්ගේ ග්‍රීවයෙහි උකුස්සන්ගේ පාද එල්වත්. සමහරු සියලු අනතුරුවලදීම සිංහයෙකු මෙන් ඉදිරියට ගොස් නිර්භීතව ක්‍රියා කිරීමෙට සිංහයන්ගේ නියපොතු පළඳිත්.*

අපරට ගම්බද පළාත්වල ජනයාගේ ''ආරක්ෂාවට'' ය කියා කොට්දත් අලිකෙඳි ආදිය පැළඳීමට ද යථෝක්ත ග්‍රාම්‍ය අදහස නිසාම ඇති වී පැවතවිත් ශේෂව තිබෙන සිරිතක් බවට සැක නැහැ. දැන් බොහෝ දෙනා අලිකෙඳි ආදිය පැළඳීම ස්ටයිල් එකක්මෙන් සලකා කරත්. මෙයින් අලිකෙඳි කොට්දත් ආදිය පැළඳීම හා සම්බන්ධ වූ ග්‍රාම්‍ය අදහස අප අතරින් නැතිවේගන යන හැටි හොඳින් තේරුම් ගත හැකියි. නුමුත් ගම්බද පළාත්වල නූගත ජනයා ''ආරක්ෂාවට'' ය කියා පළඳින බැවින් වනචර මනුෂ්‍යයන්ගේ ග්‍රාම්‍ය අදහසක් තවමත් අප අතර ස්වල්ප වෙනසක් ඇතිව ශේෂව තිබෙන හැටි තේරුම්ගත හැකියි. අපේ ළදරුවන්ගේ ග්‍රීවයෙහි එල්ලන පංචායුධය නම් ආභරණය ද මේ ග්‍රාම්‍ය අදහස නිසාම භාවිතයට ඇවිත් තිබෙනවායයි සිතිය හැකි ය. ඕස්ට්‍රේලියාවේ වනචර මනුෂ්‍යයන් අනතුරකදී උකුස්සෙකු මෙන් වේගයෙන් ඉන් පළා යෑමට පුළුවනැයි සිතා ළදරුවන්ගේ ග්‍රීවයෙහි උකුස්සන්ගේ පාද එල්ලන්නාක් මෙන් අපේ ළදරුවන්ගේ ග්‍රීවයෙහි එල්ලන පංචායුධය ද ''ඔවුන්ට අනතුරක් පැමිණිවිට පහසුවෙන් ජයගැනීමට පුළුවන්වේ ය'' යන අදහස නිසා භාවිතාවට ඇවිත් තිබෙනවා යයි සිතන්ට බැරි ද?

ඇතැම් සත්වයන්ගේ මස්මාංස කෑමෙන් ද ඒ සත්වයන්ගේ ගතිය කන තැනැත්තාට ද ඇතිවෙනවා යයි විශ්වාස කරන බැවින් බෝර්නියෝ රටවාසීහු මුවමස් කෑමෙන් වැලකී සිටිත්. මුවමස් කෑමෙන් මෘදු මොලොක් හෝ භය සුළු ගතියක් ඇතිවෙනවා යයි සලකත්. පැරගුවේ රට වැස්සෝ බැටලුවන් ඉබ්බන් ආදීන්ගේ මස්කෑමෙන් දුර්වලකම සහ කම්මැලිකමත් ඇතිවෙනවා යයි විශ්වාසකොට එයින් වලකිත්. එමෙන්ම ධෛර්යය සහ රෞද්‍ර කමත් ඇතිවෙනවා යයි සලකා කොටිමස්, ගෝනමස්, වල් ඌරුමස් ආදිය

* From Haddon's "Magic and Fetishism".



Scanned with CamScanner

ඉතා ආශාවෙන් කන්නාහ. හරක්මස් කෑමෙන් "හරකෙකුට මෙන් මූඪකම" ඇති වෙනවා යයි සිතන්ට ඉඩ තිබුණ බැවින් ගවමස් කන්නන් නීචයන් මෙන් සැලකීමට අපට පුරුදු වී තිබෙන්නේත් යථොක්ත අදහස නිසා යයි සිතන්ට ඉඩ තිබේ.

වලස්තෙල් හිස ගෑමෙන් හිසකේ දීර්ඝව වැඩෙනවා ය යන අපරට ගම්බද පළාත්වල ජනයාගේ විශ්වාසය ද ඉහත කී ළාමක අදහස නිසාම ඇති වී තිබෙන බැව් පෙනේ. වලසුන්ගේ ශරීරයෙහි ලොම් ඉතා දීර්ඝව තිබෙන නිසා වලස් තෙල්වල ද යථොක්ත ගුණය තිබෙනවායයි සිතාගැනීම අපහසු නොවේ.

ලංකාවේ ගම්බද පළාත්වල උගත් නූගත් කව්රුත් සිංහ තෙල් කොටිතෙල් ආදි තෙල්වර්ග ලෝහවර්ග වලින් සාදන ලද සූරවල දමා අත්පා ආදියේ බැඳ ගනිත්. සිංහයෙකුට මෙන් නිර්භීත කම සහ රෞද්‍රකමක් ඇති වෙනවායයි සලකා වනචර මනුෂ්‍යයන් සිංහයාගේ නියපොතු පැළඳීමෙත් අපරට ජනයා "ආරක්ෂාවට" ය කියා සිංහතෙල් සූරවල දමා පැළඳීමේත් වෙනසක් තිබේ ද? මෙහි වෙනසක් තිබේනම් එය වනචර මනුෂ්‍යයන් අතර පැහැදිලිව තිබෙන ළාමක අදහසක් අප අතර ස්වල්ප වෙනසක් ඇතිව "ආරක්ෂාව" නමින් ශේෂව තිබීම පමණයි.

ඉබ්බන්ගේ යටි හක්කේ ඇටය දත් කැක්කුම වැලක්වීමට පැළඳීම ඇතැම් වනචර ජාතීන් අතර පවතින සිරිතකි. මීට හේතුව ඉබ්බන්ට දත් නැති නිසා උන්ට දත් කැක්කුමක් නැති බැවින් ඉබ්බන්ගේ දත් නැති හක්ක පැළඳීමෙන් දත් කැක්කුම කිස් කලෙක සෑදෙන්නේ නැතැයි සිතීමයි. එමෙන්ම තුනටියේ රුදාව සුවවීටම සර්පයන්ගේ කොඳු ඇට නූලක අමුණා තුනටිය හාත්පස බැඳ ගනිත්* සර්පයන්ගේ කොඳු ඇට පැළඳීමෙන් තුනටියේ රුදාව සුවවෙනාවාය යන විශ්වාසය තවමත් අපරට ඇතැම් පිටිසර පළාත්වල නූගත් ජනයා අතර පවතී. මේ විශ්වාසය ඇතිවීමට හේතුව සර්පයාගේ තුනටියක් නැති කොඳු ඇටය තුනටියේ රුදාව සුව කරනවාය යන අදහසයි. අපරට යකැදුරන් පිදේනි වලට කුකුළු කබොලු හම්කැලි ආදිය ගැනීමේ අදහසක් ඉහත කී අන්දමට හොඳින් තේරුම්ගත හැකියි.

* From Haddon's "Magic and Fetishism".





තොවිල් නැටීම ආදිය ඇති වී තිබෙන්නේ අන්‍ය ක්‍රමයකිනි. තොවිල් නැටීම් ආදිය ඉහත කී අන්දමට තේරුම්ගත නොහැකියි. නූගත් වනචර මනුෂ්‍යයන්ට හේතු ප්‍රත්‍යයන්ගේ විශේෂ විභාගයක් දැනගත නොහැකි යි. වැසි වැසීම ආදි ස්වභාව ධර්මානුකූල සිද්ධවීම ඔවුන්වත් කළ හැකියයි කල්පනා කරත්. එනම් වර්ෂාව වහිනවිට ඇතිවන කුනාටුව අහස ගෙරවීම ආදිය මෙන් තමනුත් ඒ අනුව යම් යම් දේ කිරීමෙන් වර්ෂාව ඇතිකළ හැකියයි ඔව්හු කල්පනා කරත්. යම් සිද්ධවීමකින් ඇතිවන ප්‍රතිඵලය හා සමාන ප්‍රතිඵලයක් තමනුත් ඒ සිද්ධවීම හා සමාන දෙයක් කිරීමෙන් ඇතිවේ යයි සලකත්.

වනචර මනුෂ්‍යයෝ ඉටිරූපාදිය තනා අනතුරු කළ යුතු තැනැත්තාගේ නාමය ඉටිරූපයෙහි ලියා ඉටිරූපයෙහි අත් පා ආදිය කඩත්. මෙයින් කොඩිවින කරන්ට අදහස් කළ තැනැත්තා මරණයට පත්වෙනවා යයි කල්පනා කරත්. කඩනලද අත් පා ආදිය නැවත ඉටිරූපයට යා කළොත් ඔහු නොමැරී ජීවිත වෙනවායයි ද කල්පනා කරත්. අයර්ලන්තයේ රොස්ෂයර් නම් ප්‍රදේශයේ මනුෂ්‍යයෝ ද ඉටිරූප තනා එහි ඉදිකටු ගසා ගලා බසින දිය පාරකට දැමීමෙන් එයින් අන්තරාය කරන්ට අදහස් කරන ලද තැනැත්තා රෝගාතුර වී යථොක්ත ඉටිරූපය දියවී යන්නාක් මෙන් ජීවිතක්ෂයට පැමිණෙනවා යයි විශ්වාස කරත්. මේ කොඩිවින ක්‍රමය ගැන අප රටේ තවමත් පවතී.

තොවිල් නැටීම ද ඉහත කී අදහස පිට ඇති වී තිබෙන බැව් පෙනේ. යකෙක් මනුෂ්‍යයෙක් ලෙඩ කළ විට යකදුරා යකෙකු මෙන් ඇඳගෙන නටා ලෙඩ සුවකර තෑගි බෝග ලබාගෙන යන්නාක් මෙන් කරන ක්‍රියාවෙන් ලෙඩාගේ රෝගය සුවවෙනාවායයි කල්පනා කිරීම ඉතා පහසුයි. උපන් හැටියේ ළදරුවන්ට රන් කිරි කටගෑම, බලිතොවිල්, ග්‍රහතොවිල් ආදිය ද භාවිතා වි ඇවිත් තිබෙන්නේ ඉහත කී අදහස නිසාම බැව් තේරුම් ගැනීම අපහසු නොවේ.

ශිෂ්ටාචාර මනුෂ්‍යයන් අතරින් නැතිවේගන යන්නාවූ ද වනචර වැද්දන් අතර ඉතා ප්‍රකටව තිබෙන්නා වූ ද තවත් මේ ළාමක අදහස් රාශියක් සඳහන් කළ හැකියි. මේවා "ආර්ය සිංහල අපට මහා බ්‍රහ්මයා විසින් දෙනලද විශේෂ දෑවැද්දක් මෙන්" සලකනවිට මේ හා සමාන ළාමක අදහස් ඉතා දූරස්තර රටවල සිටින "ම්ලේච්ඡ හීන" වැද්දන් අතර පැවතීම අපට තේරුම් ගත නොහැකියි. ඔවුන්ට මන්ත්‍ර රචනා කිරීමට "දිව්‍යඥානය" ලත් ඍෂිවරයෝවත් මහා බ්‍රහ්මයෙක්වත් නැත්තාහ. එහෙත් ඔවුන් අතරෙත් මන්ත්‍ර රචනාකරන "ඍෂීහු" සිටිත්.*



Scanned with CamScanner

අපරට බොහෝදෙනා ජාතීය ආගමටත් වඩා භක්තියක් මේ ලාමක අදහස්වලට දක්වත්. ඔවුන්ගේ ආගමත් මේ ලාමක අදහස් බැව් කියයුතුවේ. අපරට ගම්බද පළාත්වල ජනයාගේ ආගම බුද්ධාගම නොව බහු දේවදෘෂ්ටියයයි කීම වඩා සැහේ. නූගත් වනචර මිනුෂ්‍යයන් මෙන් ලෝකය යක්ෂ ප්‍රේත භූත පිශාච දෙවිදේවතාවහුගෙන් පිරී තිබෙනවායයි ද ඔවුන්ට පුද පූජා පවත්වා ඔවුන්ගෙන් යම් යම් ප්‍රයෝජන ලබාගත හැකියයි ද සලකන මොවුන්ගේ ආගමට කියයුතු නාමය කුමක් ද? අපරට ජනයාගෙන් ඉතා ටිකදෙනෙක් හැර ඉතිරි සියල්ලෝම අර්ථ ශූන්‍ය ලාමක අදහස්වල එල්ලී සිටින විට අපේ දියුණුවක් ඇති වෙන්නේ කොහොම ද? රොස්ලින් පහට පමණ පොත කියවීම නවත්වා තේවතුර කෝප්පය බොන්ට අතට ගන්නවාත් සමගම හූනෙක් ඇඬුවේය. රොස්ලින්ලා කලින් කතෝලික දෘෂ්ටිකව සිටි බැවින් හූනන්ගේ හැඬීම් ආදියෙන් සුභාසුභ දැනගැනීමට තිබෙන මාහැඟි ගුප්ත විද්‍යාව නොදනීමෙන් මේ හූනාගේ හැඬීම නොසැලකුයේය."* මෙය යමක් තේරුම්ගන්ට පුළුවන් අපේ ග්‍රන්ථ කර්තෘ කෙනෙක් විසින් ලියන ලද්දකි. දෘෂ්ටිය කොයි එක වුණත් මනුෂ්‍යයන්ගේ ලාමක අදහස් වෙනස් නොවේ. මේ "ගුප්ත විද්‍යා" අපට පමණ අයිති වී තිබෙන ඒවා නොව ලෝකයේ කොයිජාතීන් අතරේත් තිබේ. මේවා ඉතා ප්‍රකටව තිබෙන්නේ අශිෂ්ටාචාර වනචර ජාතීන් අතර බැව් මැලනීසියාව ආදි රටවල මනුෂ්‍යයන්ගේ සිරිත් විරිත් ආදිය ගැන ලියන ලද පොතක් පතක් බැලීමෙන් දැනගත හැකියි.

"යුරෝපීය සිවිලිසේෂන් හෙවත් බටහිර ශිෂ්ටාචාර ආරූඪ කරගත් ඇතැම් හිංගල බොරු 'ෂොක්' කාරයන් මෙන් මමත් සුහුනු ශාස්ත්‍රය අසත්‍ය වූ කිසි අර්ථයක් නැති ඒවා යයි කියා සිනා සුනෙමි. සුහුනු ශාස්ත්‍රය බලා සොයා ඉගෙන ගැනීමට සිංහල අඥානයින්ගේ ඇස් පැහැදේවා!"**

---

* Even among such backward people as the Australians, certain of the medicine – men or sorcerers were bards who devoted their poetic faculties to the purposes or enchantment, such as the Bunjill yenjin of the kournai, whose peculiar branch of magic was composing and singing potent love charms.

* Prof. Haddon

* වාසනාවන්ත විවාහය





යනුවෙන් හූනාගේ හැඬීම ගැන නොසැලකීමත් අලුත් 'සිවිලිසේෂන්' එකේ වැරැද්දක් මෙන් පෙන්වන්ට උත්සාහ කිරීමෙන් මේ අභිනව ග්‍රන්ථ කර්තෘගේ ප්‍රමාණය ප්‍රකාශවෙනවා. මීස වෙන කුමන අර්ථයක් ද? හූනෙක් කැරලෙක් හැඬුවොත් තමන්කරන්ට යන වැඩේ අතපසු කරත්. ගෙයින් පිටත යන්ට ශුභ වේලාවක් ඕනෑ. කෑමට බීමට නෑමට මේ කොයිවැඩේටත් ශුභ වේලාවක් ඕනෑ. ළිප ගිලිමොලවන්ටත් ශුභ වේලාවක් ඕනෑ. අහෝ! පුදුමයක ඕනෑ. මේ අර්ථශූන්‍ය වැඩවලට තමන්ගේ කාලය ගතකරන්ට ගෙන මේ අර්ථශූන්‍ය වැඩවලට තමන්ගේ කාලය ගතකරන්ට සිදුවුණාම යම් මනුෂ්‍යයෙක් දියුණුවෙන්නේ කොහොම ද? ශාස්ත්‍රඥානයක් නැතිව පහත් ස්වභාවෙහි සිටි අපේ මුල්ම මනුෂ්‍යයන්ගේ මේ ලාමක අදහස් ශාස්ත්‍රයට එකඟ යයි කියමින් ආරක්ෂා කරන්නෝ අප අතර සිටිත්. ඊට නිදර්ශනයක් වශයෙන් ග්‍රහ අපල වලට මුදු අතේ දැම්ම සම්බන්ධව සමහරුන්ගේ තර්කණයක් ගෙනහැර දැක්විය හැකි. "ග්‍රහ අපලවලට පළඳින මුද්දට අල්ලන ගලෙහිපාට ඒ අපල සිදුකරන ග්‍රහතාරකාවේ වර්ණයට සමානයි! ඉතින් ඒ ග්‍රහතාරකාවේත් මුද්දට අල්ලන ගලෙහිත් වර්ණය එකාකාරයි! මේ දෙකේ ආකර්ෂණ ශක්තියක් තිබෙන බැවින්! එයින් යම් අර්ථයක් සිදුවෙන්ට ඕනෑ!" ආකර්ෂණ ශක්තිය යන අභිනව වචනය ඉවත්කොට මෙහි අදහස ගෙන බලනවිට වනචර මනුෂ්‍යයන් අතර තිබෙන ලාමක අදහසක්ම ප්‍රකාශ වේ. කෙතරම් අර්ථශූන්‍ය ලාමක අදහසක් වුවත් එය ශාස්ත්‍රානුකූලයයි කියමින් ආරක්ෂා කරන්නෝ සිටිත්.

"බල්ලන්ගේ උඩුබුරුලෑම, බළලුන්ගේ පොරකා හැඬීම, සිවලුන්ගේ හූකීම බකමූණන්ගේ හැඬීම, උලමුන්ගේ නාදය අශුභයයි මෙරට බොහෝ දෙනා විශ්වාස කරති." ........ යට දැක් වූ සත්වයන්ගේ නාද කරණකොට අසුභනිමිති ප්‍රකාශ යන්නාහ යනු මුඪජනයාගේ ප්‍රලාප දෙඩීමයයි අප විසිනුදු කලක් සලකන ලදී. එසේ ද වුවත් ඇස් ඉදිරිපටදීම යට දැක්වූ මරණ සිද්ධ වූ බැවින් මේවායෙහි යම් ශාස්ත්‍රීය යුක්තියක් හෝ ඥාණානුගත හේතුවක් හෝ ඇද්දැයි පරීක්ෂා කරන්ට සිදුවිය."* මෙහි ශාස්ත්‍ර යුක්තියක් තිබෙන බැව් අපේ පුරාණ "ඥාණවන්තයින්" අවබෝධකර ගෙන තිබෙන නුමුත් එබඳු "ඥාණයක් නැති මැලනීසියාව ආදි රටවල වනචර මනුෂ්‍යයන් ද

---

** "අහෝ මාගේ සුරතලී"

* ශ්‍රී ලංකා ශ්‍රී (5 වෙනි කලාපය)



Scanned with CamScanner

මෙහි තිබෙන ශාස්ත්‍රයුක්තිය අවබෝධ කරගෙන තිබෙන බැව් පෙනේ.

"The belief in omens is widely spread throughout Malanesia......... Some omens are warning of as evil event which is about to occur. In one of the New Hebrides Islands, if a frog, or some other creature not usually found in a house comes into it and cries, it indicates that a death will occur, if a certain brilliant gold coloured snake is found in one if their houses, it is a sigh of death, which will be by sickness if the snake is quiet, but a violent one if it is moving. In the Bank Islands cry of a kingfisher is ominous, in one of the islands near to the east end of new Guinea you find the cry of a certain sort of pigeon to be an omen that an ailing person in the house will die, and in another the entry of a firefly into a house at night foretells that someone in the house will die."

(Malanesia by R. W. Williamson, F.R.A.I Customs of the World, p. 84).

මෙහි අදහස

"ශුභාශුභ නිමිති ගැන විශ්වාසය මැලනීසියාවේ සියලු මනුෂ්‍යයන් අතර පවතී... ඇතැම් නිමිති මතු පැමිණෙන්ට තිබෙන උපද්‍රවයක් හැඟවීමේ පූර්ව ලක්ෂණ වන්නාහ. මැඩියෙක් හෝ සමාන්‍යයෙන් ගෙවල සම්භ නොවන සත්වයෙක් ගෙට වී හැඬුවොත් එයින් මරණයක් සිදුවෙන බව හඟවයි. රත්වන් පාට සර්පයෙක් ගෙයක සිටියොත් එය මරණයක් සිදුවෙන බැව් හැඟවීමේ ලකුණකි. සර්පයා නිශ්චලව සිටියොත් රෝගාතුර වී මියයන බවද ගමන් කරමින් සිටිනවා දුටුවොත් හදිසි අනතුරකින් මියයන බවද සඟවයි. "බැන්ක්" දූපත්වල මනුෂ්‍යයෝ පිළිහුඩුවෙකුගේ හැඬීම අශුභ නිමිත්තක් මෙන් සලකත්. එක්තරා පරෙවි වර්ගයකගේ හැඬීම ගෘහයක රෝගාතුරයෙකු මියයන බැව් හඟවන අසුභනිමිත්තකි. කදෝපැනියෙක් රාත්‍රීකාලයෙහි ගෘහයකට ඇතුළුවීම එම ගෘහයේ සිටින කෙනෙක් මියයන බැව් හැඟවීමේ පූර්ව ලකුණකි" මේවා මැලනීසියාවේ වනචර මනුෂ්‍යයන්ගේ විශ්වාස වෙත්. මේ විශ්වාස වනචර මනුෂ්‍යයන් අතර තිබෙන පලියටම ඉවතලෑම යුක්ති රහිතයි. මෙහි ශාස්ත්‍රීය යුක්තියක් හෝ "ඥාණානුගත හේතුවක්" තිබේනම්





අපිත් එය පිළිගන්ට ඕනෑ. මෙවාගේ අපට පිළිගැනීමට තරම් ශාස්ත්‍රීය යුක්තියක් තිබේදැයි සැලකිය යුතුයි.

මාංශ භක්ෂක සත්ව වර්ගයෙහි වූ යටකී බලු, බළල්, කැනහිල් බකමූහුණු, උලම්මු, යනාදි සත්වයෝ ද මනුෂ්‍යයෙකුගේ මරණය ඉව කරණකොටගෙණ දැනගන්නාහයි සිතීම උගහට නොවේ........ යම්කිසි ගෘහයක මෘත දේහයක් ළඟදීම ඇතිවන්නේය යනු යටකී මාංශභක්ෂක සත්වයන්ට රෝග බීජාඝ්‍රාණයෙන් සුලඟ ආශ්වාසයෙන් හෝ දැන ගත හැක්කේ ය, යනු විශ්වාස නොකිරීමට හේතුවක් නැත්තේ ය"* මේ අන්දමට නම් ලෝකයේ තිබෙන තරම් ළාමක අදහස් ශාස්ත්‍රානුකූලව කියා ඔප්පු කළ හැකියි. නුමුත් ශාස්ත්‍රයයි කියන්නේ එක එක්කෙනාගේ අදහස්වලට නොවේ. ඉව කරණ කොටගෙන යම් යම්දේ දැනගැනීමට පුළුවන්කම මනුෂ්‍යයන්ට වඩා පහත් සත්වයන් තුළ ප්‍රකාශව තිබෙන බැව් සත්‍යයකි. ඉව කරණකොටගෙන යම් යම්දේ දැනගැනීමට පුළුවන්කම ශිෂ්ටාචාර මනුෂ්‍යයන්ට වඩා වනචර මනුෂ්‍යයන් තුළ තිබෙන බව ද සත්‍යයකි. නුමුත් ඉවකරණකොටගෙන රෝග බීජාඝ්‍රාණයෙන් සුළඟ ආශ්වාසයෙන් හෝ මනුෂ්‍යයෙකුගේ මරණය දැනගත හැක්කේය' යි සිතීමට ශාස්ත්‍රයෙන් පිහිටක් නොමැතියි.

මනුෂ්‍යයන් අතර ඉගෙනීම දියුණු වෙනවාත් සමඟම ක්‍රමයෙන් මෙම ළාමක අදහස් නැතිවේගන යන නුමුත් ඇතැම් අය මේ ළාමක අදහස් සම්බන්ධව ස්වල්පයක්වත් ඉගෙනීමට උත්සාහ නොකොට මේවා 'ශාස්ත්‍ර' යන නාමයන් ආරූඪකොට 'දැන් අප අතර හරියට ශාස්ත්‍රය උගත් අය නොමැති ය පුරාණ කාලයේ ශාස්ත්‍ර හරියට තිබුණ නමුත් දැන සිටින මෝඩයන් බොරුකරනවාය' යන හිඟන අදෝනාව කියත්. තවත් එක්කොටසක මනුෂ්‍යයෝ පුරාණ කාලයේ ශාස්ත්‍රයන් රහස් වශයෙන් භාවිතකරගෙන ආ බැවිනි දැන් පැදුර යට හෝ කොට්ටය යට සඟවාගන්ට පුළුවන් දෙයක් නොවේ; යම් කෙනෙක් ලෝකයේ තිබෙන තරම් භාෂාවෙන් ඉගෙන ගත්තේ වී නුමුත් ඔහුට බාහිර ශාස්ත්‍රයන් ගැන දැනීමක් නැති නම් බාහිර ශාස්ත්‍රයන් අනුව දැනගත යුතු කරුණු සම්බන්ධව එබන්දන්ගේ කියුම්වලට වඩා ගරු කළ යුතු නොවේ. නුමුත් භාෂාව ව්‍යාකරණ නිරුක්ති ශාස්ත්‍රාදිය සහ ඉතිහාසය පිළිබඳව ඔවුන්ගේ කියුම් ගෞරවයෙන් හා යටහත් භාවයෙන් පිළිගතයුතුයි."

* ශ්‍රී ලංකා ශ්‍රී



Scanned with CamScanner

මෙහිදී වැඩකාරියෙක ලීලාට ලියමනක් ගෙනවිත් දුන්නා ය. ඇ ලියමන අතට ගෙන බලා වේයන්ගොඩින් තැපැල්කරන ලද්දක් බැව් දැන කඩා කියවන්ට පටන්ගත්තා ය. "ලීලා,

ගිල්බට් කෙබඳු මිනිහෙක් ද යනවග නුඹ තේරුම්ගන්ට ඇතැයි සිතමි. මා ක්‍රියා නොකළා නම් නුඹ ඔහුට අසූචි අවාසනාවන්ත ස්ත්‍රියක්වෙන්ට තිබුණා. විස්තර දෙවනු කියඤ්ඤා මේ කිසිත් දූත්ම කිසිවෙකුට දන්වන්ට එපා. මම පුලුවන් ඉක්මනින් ගමට එනවා.

ගිල්බට් ගැන මගේ සිතේ සැක ඉපදී තිබෙනවා. කුමක් නිසාදැයි තේරුම් ගන්ට බැහැ.

මේවගට,

ඇල්බට්"

මේ ලියමන කියෙවූ ලීලාගේ සිත මහා මුහුදසේ ව්‍යාකූල විය. ඇ ලියමන දෙතුන් විටක් කියවමින් සිහි නැති වූවෙකු මෙන් ක්‍රියා කළා ය. ටිකවේලාවක් යනතුරු ඇට ප්‍රකෘති සිහියෙන් කල්පනා කරන්ට නොහැකිවී ය. ටිකකලකට පෙර ඇල්බට් සහ ඇ අතරේත් සිදුවූ ප්‍රවෘත්තිය කල්පනා කළා ය. ඇ භයානක ප්‍රයෝගයකට අසු වී ක්‍රියාකර තිබෙන බැව් ඇට කල්පනා විය. "අහෝ එදා මගෙන් මුදුව ඉල්වාගත්තේ ඇල්බට් නොවේ. නැහැ - නැහැ මම භයානක ප්‍රයොගයක රැවටී තිබෙනවා" යයි ඇ කල්පනා කළා ය. "ඇල්බට් මෙසේ ලියා එවන්ට හේතුව කිම? එදා ඇල්බට් මෙන් වෙස්මාරු කරගෙන ක්‍රියාකර තිබෙන්නේ කව් ද? ගිල්බට්! ඔව් වෙන කවුද? අහෝ! මම කෙතරම් අඥාන ස්ත්‍රියක් ද මා ඇල්බට්ට හතුරු ස්ත්‍රියක් මෙන් ක්‍රියා කළානෙව ද? ඔහු ගැන මගේ සිතේ ඇතිකර ගෙන තිබුණ අදහස් දන්නවා නම් මා ගැන කුමක් සිතා ද" ඇ නැවතත් ලියමන අතට ගෙන කියවා බැලුවා ය. "ඔහු මට තවමත් ආදරේ ද? මා ගැන මේ ලියමනේ කිසිවක් ලියා නැහැ - ඔහු - ඔහු" කියමින් ඇ හඬන්ට පටන් ගත්තා ය.



# 13 පරිච්ඡේදය

නරගති වැරදුම ය
දෙව්ගති සමාවීම ය"

-පෝප්

ලීලා ඇල්බට් සම්මුඛවීමට ඉතා ආශාවෙන් සිටියා ය. ඔහු ගමට විත් දවස් දෙකක් තුනක් පමණ ගතවනතුරුත් ඇ බලන්ට නාවේ මන්දැයි ඇට තේරුම්ගන්ට නුපුළුවන් විය. ලීලා මේ ගැනම සිතමින් කල්පනාවේ යෙදී සිටින විට ඔවුන්ගේ ගෘහයට නුදුරු ස්ථානයක කෝලාහලයක් වෙන්නාක් මෙන් මහත් වූ ඝෝෂාවක් ඇසී ඇ දොරට විත් බැලුවා ය. ඇගේ පුදුමයට මෙන් සිරි නිවෙසනට හතැප්ම කාලක් පමණ ඈතින් තිබුණා වූ දෙමහල් ගෘහයක් ගිනි ඇවිලී දනවා දුටුවා ය. එය ගිල්බට්ලාගේ ගෘහය විය. අසල්වාසී මනුෂ්‍යයෝ කෑගසමින් ඒ මේ අත දුවන්ට වූහ. ටික වේලාවක් යන විට සිය ගණන් සමූහයා එතනට රැස්වූහ.

ගෘහයෙහි සිටි සියලු දෙනාම කලබල වී සිහි නැතිව මේ අත දුවගොස් පිට වූ බැවින් යථොක්ත ගෘහයේ උඩුමහලේ ඇඳෙන් නැගිටීමට පවා ශක්තියක් නැතිව රෝගාතුරව සිටි ගිල්බට් ගැන කල්පනාවක් නැති වයි. ස්වල්ප වෙලාවකට පසු ගිල්බට්ගේ මව හා භාර්යාවද විලාප කියමින් ඒ මේ අත දුවන්ට වූහ. එහි රැස්ව සිටි සමහරෙක් අසරණ ගිල්බට් බේරා ගැනීමට උත්සාහ කරන්ට වූහ. ගින්න ක්‍රමයෙන් වැඩිවේගන එනවා දුටු මනුෂ්‍යයන්ට ගිල්බට් බේරා ගැනීමට කාලයක් නැති බැව් හැඟුණි.

මේ වෙලාවේදී මේ සමූහයා මධ්‍යයෙහි ඇල්බට් ද සිටියේ ය. ගිල්බට්ට සිදුවෙන්ට යන භයානක අනතුර ගැන අවබෝධ වූ ඇල්බට්ගේ හෘදය මහා මුහුදේ රළ මෙන් උස් පහත් වෙන්ට පටන් ගත්තේ ය. අසනීපෙන් සිටි අසරණ ගිල්බට්ට සිදුවෙන්ට යන භයානක විපත ගැන කල්පනා කිරීමෙන් ඔහුගේ සිතෙහි ඇති වූ අනුකම්පා

Scanned with CamScanner

ගතිය සකල ශරීරයේම පැතිර ගියේ ය. ගිල්බට් කෙතරම් අසත්පුරුෂයෙක් වුවත් කිසිවෙකුගේ පිහිටක් නැතිව මියයන්ට සිටින ඔහු බේරා ගැනීමට උත්සාහ කිරීම උතුම් ක්‍රියාවක් බැව් ඇල්බට්ට කල්පනා විය. තව මොහොතක් ප්‍රමාද වුණොත් ගිල්බට් බේරා ගැනීමට බැරි බව දුටු ඇල්බට් ක්ෂණයකින් දුව ගොස් ගිනි ඇවිළි දන්නා වූ ගෙට ඇතුළු වෙනවාත් මොහොතක් ගතවෙන්ට පෙර ඔහු ගිල්බට් ඔසවා ගෙන ගෙයින් පිට වෙනවාත් දුටු මනුෂ්‍යයෝ පුදුමයට පත්වූහ. ගිල්බට් බේරාගත් නමුත් ඔහුගේ දුර්වල ශරීරයට ඇති වූ පීඩා නිසා අසනීපය බලවත් වී තිබුණේ ය. ගිල්බට්ට හොඳින් සිහිය තිබුණ බැවින් තමන්ට සිදුවෙන අන්තරාය ගැනවත් නොසලකා ඔහු ගලවා ගැනීමට ආවේ ඇල්බට් බැව් දැනගන්ට පුළුවන් වී ය. ඔහුගේ අන්තිමය ළං වේගන එන බවත් නැවත ජීවත් නොවන බවත් ගිල්බට් දැනගත්තේ ය. පසුගිය ජීවිතය ගැන කල්පනා වීමෙන් ගිල්බට් පසුතැවිලි වෙන්ට පටන් ගත්තේ ය. "අහෝ මම කෙතරම් අසත්පුරුෂ කාලකණ්ණි පුද්ගලයෙක් ද මා ඇල්බට්ට විරුද්ධව කෙතරම් නින්දිත අන්දමින් ක්‍රියා කළේ ද මා නිසා ඔහු අප කීර්තියට පැමිණ ඔහුගේ බලාපොරොත්තු සියල්ලම නැතිවී ගියා නොවද" යි ගිල්බට් කල්පනා කළේ ය. පසුගිය ජීවිතය ගැන කල්පනා කළේ ය. පසුගිය ජීවිතය ගැන කල්පනා කිරීමෙන් ඔහුගේ සිතෙහි ඇති වූ කනගාටුව ඉවසිය නොහැකි තරම් විය. "ඇල්බට් නුඹ මට සමාව දෙන්නෙහිද" යි අසමින් ඔහු ළඟ සිටි ඇල්බට්ගේ අත අල්වාගත්තේ ය. මේ වේලාවේදී ගිල්බට්ගේ බැගෑපත් ස්වභාව දුටු සියලු දෙනාගේම ඇස්වලින් කඳුලු වැගිරෙන්ට වූහ. ගිල්බට් ඔහුගෙන් සමාව ඉල්ලන්ට හේතුව කුමක්දැයි ඇල්බට්ට ටික වේලාවක් ගතවනතුරු හොඳින් තේරුම්ගන්ට නුපුළුවන් විය. ගිල්බට් ගැන ඇල්බට්ගේ සිතෙහි සංකාවක් ඇති වී තිබුණ නමුත් ගිල්බට් ඔහුට විරුද්ධව ඔහුගේ ජීවිතය පවා නැසීමට ක්‍රියා කළ බැව් කල්පනා කරන්ට නොහැකි විය. ගිල්බට් ඔහුට විරුද්ධව ක්‍රියා කළ අන්දම තේරුම්ගත් බැවින්දෝ ඇල්බට් වහා අත ඉවතට ගත්තේ ය.

ගිල්බට් ඇඳේ හාන්සිවී සිටිමින්ම ඉතා අමාරුවෙන් හිස ඔසවා "සොමීට වස දුන්නේ ඇල්බට් නොවේ. ඇල්බට්ට අනතුරු කිරීමට යොදු උපක්‍රමයක් නිසා එය සිදුවුණා" යනුවෙන් ඔහු සහ තරුණ රත්නවීර ඇල්බට්ට වසදීමට උපක්‍රම යෙදූ හැටිත් ඔහු ප්‍රයෝගයෙන් ලීලා රැවටූ හැටිත් විස්තර කළේ ය. මීට මොහොතකට පෙර දර්ශනය





බලන්නන්ගේ හෘදය උණුවෙන අන්දමේ බැගෑපත් ස්වභාවයක් ඉසුලූ ගිල්බට්ගේ මුහුණ වෙනස් වී භයානක නපුරු ගතියක් පෑවේ ය. ඇස්දෙක ගිනිදැල් මෙන් වූහ. මුහුණ කාලවර්ණ විය. ගිල්බට්ගේ ස්වාභාවික නපුරු ගතිය මේ වේලාවේදී හොඳින් ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ විය. ඇල්බට් නුඹ මට සමාවදෙන්නේ නැද්ද, ඔව් මම නුඹෙන් සමාව ලැබීමට පවා සුදුස්සෙක් නොවේ. නුමුත් - නුමුත් - අසරණ මනුෂ්‍යයෙකුගේ අන්තිම මොහොතේදී වත් නුඹේ හෘදය උණුවන්නේ නැද්ද" යි අසමින් ගිල්බට් අත දිගු කළේ ය.

නැවතත් ඔහුගේ මුහුණේ තිබුණ භයානක ගතිය නැති වී බලන්නවුන්ගේ හෘදය උණුවෙන්නා වූ පළමු පැවති බැගෑපත් ස්වභාවෝක්ති විය. ඔහුගේ මළානික ඇස්දෙකෙන් කඳුළු වැගිරෙන්නට වන. මේ අවාසනාවන්ත මනුෂ්‍යයාගේ ස්වභාව දුටු ඇල්බට් ගේ හෘදය උණු වී ගියේ ය. මරණාසන්න මනුෂ්‍යයෙකුගේ වචනවලට ඇහුම්කන් නොදීමට තරම් තද ගතියක් ඇති මනුෂ්‍යයෙක් නොවූ බැවින් ගිල්බට්ගේ ඉල්ලීම ඉෂ්ට නොකරන ඇල්බට්ට වැඩිවෙලා සිටින්ට නොහැකි විය. ගිල්බට්ට නැවත ජීවත්වෙන්ට ලැබුණොත් හොඳ ධාර්මික මිනිහෙක් වෙන බැව් ඇල්බට් කල්පනා කළේ ය. එහෙත් මේ තරම් හතුරුකම් කළ මනුෂ්‍යයෙකුට අත දිගු කිරීමට ඔහු ප්‍රමාද විය. ගිල්බට්ගේ අන්තිමය ළං වේගන එනබැව් දුටු ඇල්බට් "ගිල්බට්" කියමින් ඔහුගේ අත එසෙව්වේ ය. ගිල්බට්ගේ වෑවල වන්නා වූ හස්තයෙන් එය අල්වාගෙන හිසඔසවා "ඇල්බට් ඇල්බට්" කියනවාත් සමගම ඔහුගේ මුහුණ මළානික වී ගොස් ඔසවන ලද හිස කොට්ට උඩ පතිත විය. ක්ෂණයකින්ම ගිල්බට්ගේ හස්තයෙහි හිම මෙන් ශීතලගතියක් ඇති වූ බැව් ඇල්බට්ට දැනුණි "ඇල්බට් ඇල්බට්" යනු ගිල්බට්ගේ අන්තිම වචන බැව් එහි සිටි සියලු දෙනාම දැන ගත්හ.



Scanned with CamScanner

# 14 පරිච්ඡේදය

සොඳු රූ ගුණ පහණ සිරිමත් ලඳුන් හ ද
අඳු රූ පුවද සිරිසැප විචිකිරණ වැ ද
රුදු රූ දුටි විපත ගණඳුර පැමිණි ස ද
සොඳු රූ විලස බැබළේ එලියෙන් නොම ද

There is in every true woman's heart a spark of heavenly fire which lies dormant in the broad daylight of prosperity; but which kindles up, and beams and blazes in dark hour of adversity.

*Washington Irving*

නානා වර්ගයේ කුඩා මල්පැල පිළිවෙළට වවන ලද ගෘහොද්‍යානයක් ඉදිරිපිට ඇල්බට්ලාගේ ලක්ෂණ කුඩා ගෘහය පිහිටා තිබුණේය. ඊට යාර තුනහතරකට ඇතින් තිබුණ ගොඩනැගිල්ල සැමුවෙල් ලියනමහත්මයාලාගේ ගෘහය විය. පළමුකී ගෘහය ස්වල්ප දවසකට පෙර අලුත්වැඩියා කර තිබෙන පිළිවෙළ දකින කාටවුනත් ඒ ගෘහයේ මංගලෝත්සවයක් හෝ යම්කිසි උත්සවයක් ළඟදීම සිදුවී තිබෙන බැව් අවබෝධවේ. යථෝක්ත ගෘහයෙන් එළියට බැස ගෘහොද්‍යානය දෙසට ගමන් කරමින් සිටි කුලඟන ලීලා විය. චිත්තාභ්‍යන්තරයෙහි සඟවාගෙන තිබුණ ප්‍රීතිය ඇගේ මුහුණෙන් ද ඇස්වලින් ද ප්‍රකාශවෙන්ට ඉඩහැර සිටිය බැවින් ඇගේ මුහුණේ තිබිය යුතු නෛසර්ගික වාසනාවන්ත ගතිය හොඳින් ප්‍රකාශව තිබුණේ ය.

ඇල්බට් ද ගෘහොද්‍යානයේ පසෙක තබන ලද හානිස් පුටුවක හානිසි වී ඔහු අගය කොට සලකන ලංකාවේ පුරාණ පඬිවරයන් අතුරෙන් තීක්ෂණ ගැඹුරු කල්පනාවෙන් යුත් විහිදාගම මෛත්‍රෙය ස්වාමීන් වහන්සේ විසින් රචනා කරන ලද 'හංස සන්දේශයෙහි,



"ඇදගෙන සිහිල් මඳනල දිය දහර හෙ ත
විලසන බියෙන් දිලිහුලුපුල් ඇස්වස ත
අසුවන සලෙලුන් මෙන් පරඟනන් වෙ ත"
හැකිළෙන පියුම් ගැබ බමරුන් බැස බැඳෙ ත"

යන මේ කවිය සෙමින් කියා එහි අලංකාරය ගැන කල්පනා කරමින් සිටි බැවින් තමන්ගේ ප්‍රෙමවන්තිය ළඟට විත් "ඇල්බට්" කියා ආමන්ත්‍රණය කරනතුරු ඔහුට ඈ ඇවිත් සිටින බැව් දැනගන්ට නොහැකිවිය.

ලංකාවේ පුරාණ පඬිවරයන් අතුරෙන් විහිදාගම මෛත්‍රෙය ස්වාමීහු තීක්ෂණ ගැඹුරු කල්පනාවෙන් යුත් උතුමෙකු බැව් උන් වහන්සේ විසින් කරන ලද පොත්පත් වලින් නොව ඔප්පුවේ පෙර පටන් පැවත විත් ශ්‍රී රාහුල ස්වාමීන්වහන්සේ විසිනිදු :

"සතන සක සක අ ත
සුරගුරු ගණිඳු බරනෙ ත
රිවි කිවි සඳ තිනෙ ත
මෙ දෙවිගණ නිති කෙරෙත් සුවසෙ ත"

යනුවෙන් කරන ලද දෙවියන් යැදීම විහිදාගම ස්වාමීන්ගේ කිසිම පොතක නොලියන ලදි. ඒ කාලයේ අන්දමට මෙයද සැලකිය යුතු කාරණයකි.

"තිසුලවිගත් ක රින්
කළු පැහැ රැගත් උගු රින්
සම් සළු ගතඹ රින්
අඩක් උමයගන ගත් සිරි රින්

දළ අඩ සඳ බ දින
ගොර සප් හරක් පල දින
රඟ කරන දින දින
මහලු ගොන් වාහනෙන් ඇවි දින"

යන්න ඊශ්වරයාට කවටකම් වශයෙන් ලියන ලද්දක් බැව්

"පවතින මේ ලොව රැ ක
හැකිකල හිරි ඔතප් දෙ ක
ඔහු වැඳ පුද නො මෙ ක
කළැයි වැඩ සිදුවේද කිසලෙ ක"

යන්නෙන් මත්පුවේ. එපමණක් නොව විෂ්ණු ගැන ද මෙසේ කියා තිබේ.

"ඇමතැන උවිඳු ඇ
සීතාව වෙන් වනු නැ ත
එනිසා යුදත් ඇ ත
කුමට පැවසීද මේ බොරු මැ ත
වඳුරකු පිනු මුහු ත
එතරව යා නොහී? ද
ගියෙල රම් ගේ බැ ද
මෙසෙම වෙද මෙලොව දෙවියන් තෙ ද"*

විෂ්ණු ඊශ්වරාදීන් ගැන විශ්වාස කළා නම් උන්වහන්සේ මෙසේ නොලියන බැව් කියන්ට උවමනා නොවේ. නුමුත් හංස සන්දේශයෙහි

" ම හ ත් තෙදති පුල්වන් සුරිඳු මුල්කො ට
දි මු ත් සමන් බොක්සල් සුරිඳුනෙක් කො ට
ස ව ත් සුරිඳු විබිසණ ඇ සුරන් හ ට
සි රි ත් කියා පින්දී සිත සතුටු කො ට"

යන්නෙන් විෂ්ණු විභීෂණාදීන් ගැන ප්‍රකාශ වේ.

බොරු වේ මතුරු බැ
වළහන ලෙවන් හැම ස ද
බමුණන් ගෙන් දූල ද
වැඩක් වූයේ ලොවට කිකල ද
ද

යනදිය ගැන ඉන්දියාවේ පුරාණ 'අපේ සහෝදර බමුණන්ගේ' අදහස්වලට වාල්වී ක්‍රියාකරන්නන් විසින් සැලකිය යුතු යි.

ඇල්බට් සහ ලීලා විවාහ වී මෙදිනට අට දවසක් පමණ විය. මුලදී මේ දෙදෙනා අන්‍යෝන්‍යයන් කෙරෙහි බඳින ලද ප්‍රේමය විවාහ වූ දින පටන් වර්ධනය වුණා මිස ස්වල්පයකුදු අඩු නොවී ය.

ස්ත්‍රීහු ස්වභාවයෙන්ම යම් යම් විපත්ති පැමිණි විට ඒවා ඉවසා දරාගෙන සිටීමට අසමර්ථයෝ යයි ඇල්බට් කලින් අදහස් කරගෙන සිටි නමුත් ඔහුගේ ඒ අදහස ලීලාගේ පසුගිය ජීවිතය ගැන තොරතුරු දැනගැනීමෙන් වෙනස් කරගන්ට සිදුවිය. කරදර දුක් කනගාටු පැමිණි විට ඒවා සන්සුන් ලීලාවෙන් ඉවසා දරාගෙන





සිටීමට ස්ත්‍රීන් ස්වභාවයෙන්ම පුරුෂයන්ට වඩා සමර්ථ බැව් ඔහුට කල්පනා විය. පුරුෂයෙකුට ඉවසිය නොහැකි තදබල දුක් කනගාටු ඇති වූ විට ඔහුට එය සන්සුන් ලීලාවෙන් ඉවසාගෙන සිටිය නොහැකිව නොයෙක් අන්දමේ අප්‍රශුත්‍ය ක්‍රියා කරන නුමුත් ස්ත්‍රීහු එබඳු ක්‍රියා නොකරන්නා හ. ස්ත්‍රියෙකුට ඉවසිය නොහැකි තදබල දුක් කනගාටු ඇති වූ විට එය ඔවුන්ගේ සුකුමාර ශරීරය තුළ පිහිටා තිබෙන මෘදු මොළොක් ගතිය නිසා සන්සුන්ව අන්‍යයන්ට නොහඟවා අන්තිමය දක්වා වුවත් ඉවසා ගෙන සිටිය හැකි යි. ස්ත්‍රීන් තුළ පිහිටා තිබෙන යම් කිසි තදබල දුක් කනගාටුවක් ඇති වූ විට ඔහු එය චිත්තාභ්‍යන්තරයෙහි සඟවාගෙන යටපත් කරගැනීමට උත්සාහ නොකරන බැවින් ක්‍රමයෙන් එය නැතිවී ගොස් ඔහු ඒ අමාරුවෙන් නිදහස් වන්නේය. නුමුත් ස්ත්‍රියකගේ සිතෙහි එබඳු තදබල දුකක් හටගත්විට චිත්තාභ්‍යන්තරයෙහි සඟවාගෙන යටපත් කරගැනීමට උත්සාහ කිරීමෙන් එය ක්‍රමයෙන් වැඩි වී ඇතැම් විට ඇගේ ජීවිතය පවා විනාශ වන්නේය. මෙහි සත්‍යය සිය ගණන් නිදර්ශනයන්ගෙන් පෙන්විය හැකිය. දුක් කනගාටු ඇති වූ විට ඉවසිය නොහී ස්ත්‍රියක් සියපණ හානිකර ගත්තා ය යන ප්‍රවෘත්තිය අසන්ට දකින්ට ලැබෙන්නේ ඉතාම කලාතුරකිනි. මෙබඳු කරුණුවලදී පුරුෂයන් මෙන් ස්ත්‍රීහු ස්වකීය ආසාවලට වාල් වී ක්‍රියා නොකරති ඉවසීම ඇති තැනැත්තා චිත්තසංයමයෙහි ද සමර්ථ බැවින් ස්ත්‍රිය ඇතැම් කරුණුවලදී පුරුෂයන්ට වඩා චිත්තසංයමයෙහි ද සමර්ථ බැව් කියයුතු වේ.

" පිරිමියෙකුදු පත න
අවසර කල් රහස් තැ න
මිස නොලැබෙන බැව් න
ගැහුණු කවුරුද වරද නො බැදෙ න"

මෙය ස්ත්‍රීන් ගැන නොව පුරුෂයන් ගැන කිවාහම් වඩා සැහේ යයි සිතමි. මේ අතින් ස්වකීය ආශාවල් මැඩ පවත්වා ගැනීමට ස්ත්‍රීහු පුරුෂයන්ට වඩා සමර්ථමයි. මේ අතින් පුරුෂයෝ ස්ත්‍රීන්ට වඩා ස්වකීය අදහස්වලට වාල්වී ක්‍රියා කරත් ඔව්හු ස්වකීය ආශාවල් මැඩ පවත්වා ගත නොහැකිව කෙසේ ක්‍රියා කළත් ස්ත්‍රීන් මෙන්

ලෝකයාගේ අප කීර්තියට භාජන නොවෙත්. මෙය ඔවුන් ඉහත ක්‍රී චෝදනාවෙන් බේරීමට ප්‍රධාන හේතුව වී තිබේ.

''ලීලා පසුගිය කාලයෙහි නුඹට ඇති වූ දුක්කනගාටු ඉවසා ගෙන සිටියා පුදුමයි'' කියමින් ඇල්බට් ඈ දෙස බැලුවේ ය.

ප්‍රේමවන්තයාගේ සිනහ සහිත මුහුණ දුටු ඇගේ සිතේ අද තරම් ප්‍රීතියක් පසුගිය ජීවිතයේ කිසි කලෙක ඇති නොවූයේ ය. ඇගේ හෘදයෙහි ඇති වූ ප්‍රීතිය වාහ මුහුණට ඇදී ගියාක් මෙන් ඇගේ මුහුණේ වර්ණය මොහොතෙන් මොහොත වෙනස් වෙන්ට පටන් ගත්තේ ය. ඇගේ දෙතොල රක්තවර්ණවී ගියේය. අක්ෂි යුග්මයෙහි දිප්තියක් ඇතිවිය. මේ වේලාවේදී ඇගේ වෙනස් වූ මුහුණේ ස්වභාව සිකියම් ශාස්ත්‍රයෙහි දක්ෂයෙකුට මිස අන්‍යයෙකුට හරියාකාර විස්තර කළ නොහැකියි.

''ඇල්බට් නුඹ පසුගිය කාරණා ගැන ප්‍රශ්න කරන්නේ කුමටදැයි'' අසමින් ඇගේ සිනහ සහිත මුහුණ ප්‍රේමවන්තයා දෙසට එසෙව්වා ය.

**නිමි**



Scanned with CamScanner